ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

03 සැකයේ භාෂාවත් අපහාසයේ අනුශාසනයත් රජ කරත්ද?



08 සුදොතුම් පිය වරණ දැහැන



12 බෞද්ධ - මුස්ලිම් ගැටුමේදී කිතුනු දායකත්වය



ඥානාර්ථ ප්‍රදීපය
ආරම්භය : 1866 ජුනි 07




ක්‍රි.ව. 2013 ක් වූ මාර්තු 03 ඉරිදා 147 වෙළුම 39 කලඹ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 QD/51/NEWS/2013 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

# සසුන් පිය නිළවරණය ඉක්මන් වන ලකුණු!

## ශුද්ධෝත්තම පියතුමා චක්‍ර ලේඛය සංශෝධනය කර කාදිනල් සංසදයට නිළවරණ දින තීරණයට බලය පවරයි

ශිරාන් මෛත්‍රී විසිනි

**අති උත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා ඉකුත් සඳුදා නිකුත් කළ සසුන් පිය නිළවරණ සංශෝධිත චක්‍ර ලේඛයට අනුව කාදිනල් හිමි සංසදයට රැස්වී සසුන් පිය නිළවරණය පවත්වන දිනය තීරණය කිරීමට බලය පවරා ඇත.**

පෙබරවාරි 28 දා රාත්‍රි 8.00 ට නිල වශයෙන් සසුන් පිය ධුරය හිස්වන අතර මාර්තු 01 සිකුරාදා කාදිනල් සංසදයේ අධිපති අති උතුම් ඇන්ජලෝ කාදිනල් සොදානෝ හිමිපාණන් විසින් ලොව සියළුම කාදිනල් හිමිපාණන්ට මේ පිළිබඳව නිළ වශයෙන් දැනුම් දී රෝමයට කැඳවීමේ ආරාධනාව ඊ මේල් සහ ෆැක්ස් මගින් යවනු ලැබේ. ඊට අමතරව නිල ලිපියක් ද යවනු ඇත.

කෙසේ වෙතත් පෙබරවාරි 28 වැනි දා ඉසිඹු ලබන සසුන් පියාණන්ට සුබ පැතීමට ලොව වටා සියලු කාදිනල් හිමිපාණන් එදිනට පෙර වතිකානයට පැමිණීමට නියමිතය. වතිකාන ආරංචි මාර්ග වලට අනුව ලොව සියලුම කාදිනල් හිමිපාණන්ගේ (වයස අවු. 80 ට අඩු හා වැඩි) සහභාගිත්වයෙන් කාදිනල් සංසදය මාර්තු 2 හා 3 දිනවල පැවැත්වීමට ඇති ඉඩකඩ අවම අතර ඒ අනුව ඊළඟ සඳුදා එනම් මාර්තු 04 වැනිදාට යොදා ගැනීමට ඉඩ තිබේ. එහිදී සසුන් පිය නිළවරණය පවත්වන දින වකවානු තීරණය කර ගන්නා අතර වතිකාන අභ්‍යන්තර ආරංචි මාර්ගවලට අනුව මාර්තු 09 හා 11 දිනවල එය ඇරැඹීමට බොහෝ දුරට ඉඩ තිබේ.

15 පිටුවට »

### නව මීසම් කිහිපයක් නම් වේ

හලාවත පදවියේ කටුනේරිය මීසමට අයත්ව තිබූ ඉහළ කටුනේරිය සා. ජුඩ් දෙව්මැඳුර නව මීසමක් බවට පත්විය.

එලෙසම අගරදගුරු පදවියේ තලාහේන, කලුඑළිය, නව මීසම් බවට මේ මස පත්වන අතර ඉදිරියේදී කිඹුලපිටිය මීසමෙන් ආඬිඅම්බලම ද, පල්ලන්සේන මීසමෙන් නව මීසමක් ද වෙන්වීමට නියමිතයි. එලෙසම බෝපිටිය නීලසිරිගම හා හේකිත්ත ලාදුරු රෝහලේ දෙව්මැඳුර ගොඩ නැගීමට හා ප්‍රතිසංස්කරණයට ද කටයුතු යොදා ඇත.

## සුදොතුම් පිය ගුණ අගයා ශ්‍රී ලංකා ජනාධිපතිගෙන් පණිවුඩයක්

සසුන් පිය පදවියෙන් නික්ම යැමට තීරණය කර ඇතැයි යන පුවත අසා මම මහත් විමතියටත්, බලවත් කනස්සල්ලටත් පත් වූයෙමි යැයි ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා අතිඋත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමන් ඉසිඹු ලැබීම පිළිබඳව පණිවුඩයක් නිකුත් කරමින් ප්‍රකාශ කරයි.



ගරු මහින්ද රාජපක්ෂ ජනපති අති උත්තම සොළොස්වන බෙනඩික් සුදොතුම් පියාණන් බැහැදුටු මොහොතක්

ලෝක කතෝලික සසුන් නායකයාණන් ලෙස ඔබවහන්සේගේ ආධ්‍යාත්මික නායකත්වයේ වටිනාකම වඩ වඩාත් ඇනෙන්නේ මේ ඓහික ලෝකය තුළ සාරධර්ම හා ගුණ දහම් වල අගය නිරන්තරයෙන් මතු කරමින් ඒවා අගය කළ නිසායැයි ජනාධිපති තුමා සසුන් පියා වෙත දැනුම් දෙයි.

එහි මෙසේද දැක්වේ. ඉතා කෙටි කාලයක් සසුන් පිය පදවිය දැරූ ඔබවහන්සේගේ නායකත්වය තුළ කතෝලිකයන්ගේ සම්ප්‍රදායික විශ්වාසයන් රැකගනිමින් කිතුනු වටිනාකම් ලෝකය තුළ මෙන්ම සමාජය තුළ සුරකින්නට දැරූ වෑයම අනර්ඝ යැයි ජනාධිපති වරයා පෙන්නා දෙයි.

ත්‍රස්තවාදය අප රටට බියකරු විපතක් වූ සමයක ඊට ප්‍රබල විරුද්ධත්වයක් පළකළ අන්දම මෙරට ජනතාවට අමතක නැතැයි පවසන

15 පිටුවට »

පසුගිය විසි වෙනිදා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තු සැසි වාරයක් ඉසිඹු ලැබූ අති උත්තම සොළොස්වන බෙනඩික් සුදොතුම් හිමිපාණන්ගේ සේවාව ඇගයීමට වෙන් කෙරිණි. මේ පිළිබඳව සවිස්තර වාර්තාවක් ලබන සතියේ...

## ශ්‍රී ලාංකික - ඉන්දීය සැදැහැවතුන් යාච්ඤා මධ්‍යයේ

## කච්චතිවු සා. අන්තෝනි දෙව්මැඳුරේ මංගල්‍යය උත්කර්ෂවත්ව සැමරේ

කච්චතිවු සා. අන්තෝනි මුනිඳුන්ගේ දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය සඳහා මෙරට කතෝලික බැතිමතුන් සේම දකුණු ඉන්දියානු කතෝලික බැතිමතුන් ද විශාල පිරිසක් මෙවර සහභාගි වූහ.



යාපනය රදගුරු අති උතුම් තෝමස් සෞන්දානායගම් හිමිපාණන් විසින් මංගල්‍ය මහා දේව මෙහෙය සිදු කරනු ලැබූ අතර කච්චතිවු දෙව්මැඳුර භාර ගරු ඒ. අමල් රාජන් පියතුමන්ගේ මූලිකත්වයෙන් මංගල්‍යය කටයුතු සංවිධානය කොට තිබුණි. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර දෙරටේ අන්‍යෝන්‍ය සුහදත්වය සහ මිත්‍රශීලි භාවය ශක්තිමත් කිරීම අරමුණු කරගත් මෙම වාර්ෂික මංගල්‍යය සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් නිතර ලැබී තිබිණි.

නාවික හමුදාපති වයිස් අද්මිරාල් ජයනාත් කොළඹගේ මහතාගේ පූර්ණ අධීක්ෂණය මත මෙම මංගල්‍ය සංවිධානය වී තිබිණි.

## උසස් පෙළ සමස්ත ලංකා තෙවැනි ස්ථානය වෙන්නප්පුව ශු. පවුලේ බාලිකාවට



පසුගිය වසරේ උ. පෙළ කලා අංශයේ දිවයිනේම තෙවන ස්ථානය වෙන්නප්පුව ශු. පවුලේ බාලිකා විදුහලේ සුධීරා ප්‍රසාදනී රත්නායක සිසුවිය හිමිකර ගෙන ඇත. පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රථමයා ද වූ ඇය නාත්තන්ඩිය මාරවිල ප්‍රදේශයේ පදිංචිකාරියකි. ඇයට ප්‍රදීප සුබාසිංසන!

### සා. ඇලෝසියස් දෙව්සත්හලට අයැදුම්පත්

සා. ඇලෝසියස් දෙව්සත්හල කොළඹ අගරදගුරු පදවියට ගරු පූජාප්‍රසාදින් වහන්සේලා පුහුණු කරන තෝතැන්නයි. 2014 වසර සඳහා කොළඹ අගරදගුරු පදවියේ පූජාප්‍රසාදින් වහන්සේ කෙනෙක් වීමට කැමති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. එලෙස පූජාප්‍රසාදින් වහන්සේ කෙනෙකු වීමට කැමති 09 වන ශ්‍රේණියේ හෝ ඉන් ඉහළ සිසුන් කරුණාකර මීසම් සේවක පියතුමා හමුවන්න. කොළඹ අගරදගුරු පදවියේ උපදෙස් අනුව තෝරාගත් සිසුන් සඳහා අයදුම්පත් මීසම් සේවක පියතුමන් හට 2013 මාර්තු මාසයේ මුල් සතියේ සිට දෙව්සත්හලෙන් ලබා ගත හැකි අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත් අප්‍රේල් මස 30 දිනට ප්‍රථම දෙව්සත්හලට ලැබෙන්න කටයුතු කරන්න. **(ගරු අදියුරු පියතුමා )**

### දිව්‍ය සත්ප්‍රසාද ප්‍රාතිහාර්යය ප්‍රදර්ශනයක්

කතෝලික සභාවේ අනුමැතිය ලත් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේගේ ප්‍රාතිහාර්යයන් නිරූපණය කැරෙන ප්‍රදර්ශනයක් ශ්‍රී ලංකාවේ දී පැවැත්වීමට කටයුතු යොදා තිබේ. මාර්තු 01 වැනිදා කොටහේන සා. ලුසියා ආසන දෙව්මැඳුරේදී කොළඹ අගරදගුරු පදවි සහයක රදගුරු අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන් අතින් විවෘත කරනු ලබන මේ ප්‍රදර්ශනය මාර්තු 04 වැනිදා දක්වා පැවැත්වේ.

"විශ්වාසයේ වසර" ලෙස නම් කර ඇති මේ වසරේදී අදාළ ප්‍රදර්ශනය සංවිධානය කරන්නට කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් කමිටුවක් පත් කරන ලදි. එම කමිටුව මේ ප්‍රදර්ශනය සංවිධානය කරයි.

### කතෝලික පෞද්ගලික පාසල් සඳහා අයදුම්පත්

2014 වසර සඳහා කතෝලික පෞද්ගලික පාසල් වලට අයදුම්පත් නිකුත් කරන දිනයන් හා වේලාවන් පිළිබඳ සම්පූර්ණ සටහනක් ලබන සතියේ (10) ප්‍රදීපය ගෙන එන බැවින් කල් ඇතිව ඔබ ප්‍රදීපය පිටපත වෙන් කරවා ගන්න.

අගරදගුරු පදවි කතෝලික පෞද්ගලික පාසල් සාමාන්‍යාධිකාරී ගරු රංජිත් මදුරාවල පියතුමාගේ අත්සනින් නිකුත් වන සමස්ත අයදුම්පත් වාර්තා සටහන අනුව කල් ඇතිවම දෙමාපියන් හට තම දරුවාට අවැසි පාසල තෝරා ගෙන තවත් පාසල් කිහිපයකටම අයදුම්පත් ඉදිරිපත් කරන්නට මේ අනුව ඉඩ සැලසෙනු ඇත.

**"මනස්ථාපනය නොවුවහොත් ඔබ හැම ද විනාශ වන්නාහු ය." (ශු. ලූක් 13:1-9)**

## පදවියෙන් පදවියට



කොටුගොඩ මීසමේ දහම් පාසල් ගුරුවරුන් අතර පැවති සුහද එල්ලේ තරගාවලිය ආරම්භ කරමින් කොටුගොඩ මීසම් සේවක ගරු ජූඩ් ලක්ෂ්මන් පියතුමා පන්දුවට පහරදීමට සූදානම්ව සිටි අයුරු.

**අසේල සෙබස්ටියන්**



වැලිහේන මීසමේ දකුණු වැලිහේන අඩික්කන්ඩිය දෙව්මැඳුරේ ස්වර්ණ ජයන්ති මංගලෝත්සවය, කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සිදුකෙරිණ. මෙහිදී ස්වර්ණ ජයන්තිය නිමිත්තෙන් ප්‍රතිසංස්කරණය කළ දෙව්මැඳුර අගරදගුරු හිමිපාණන් පීත්ත පටියක් කපා විවෘත කළ අයුරු. වැලිහේන මීසම් සේවක ගරු නිශාන්ත රුද්‍රිගු පියතුමා පසෙක සිටී.

**වී. සුනිල් ප්‍රනාන්දු**

# කුරුසිය දරාගෙන යෑමේ අභියෝගය පිළිගන්නට කතෝලිකයන් ලෙස සූදානම් ද?

## කොළඹ අගරදගුරු හිමිපාණෝ ප්‍රශ්න කරති

**කතෝලිකයන් ලෙස බලාපොරොත්තුව සහ විශ්වාසය රඳවාගෙන කුරුසිය දරාගෙන ගමන් කිරීමට අභියෝගයක් පවතින්නේ යැයිද - මේ චතාරික සමයේදී දිව්‍යමය ප්‍රේමයෙන් පිරී සකලාකාරයේ ආත්මාර්ථකාමිත්වයෙන් දුරුකර කඳුළු තුලින් සිනාසෙන්නට හැකිවිය යුතු යැයි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ බොරැල්ල සියලු සාන්තුවර දේවස්ථානයේදී ප්‍රකාශ කළහ.**



කාදිනල් හිමිපාණන් මේ බැව් පළකළේ බොරැල්ල මීසම බැහැදැකීමේ නිල සංචාරයේදීය. මෙහිදී තවදුරටත් කතාකළ උන්වහන්සේ දෙවියන්වහන්සේ මනුෂ්‍යත්වය ගැනීමත් මිනිස් බව ගෙන මෙලොවට වැඩම කිරීත් ලෝකය තැති ගැන්වූ අවස්ථාවක් බව පැවසූහ. මීසම් සේවක ගරු පිලිෂින් රංජිත් පෙරේරා පියතුමා කටයුතු සංවිධානය කළේය.

## සමිඳු වදනට පිබිදීමක්!

දියලගොඩ මීසම් සේවක, ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමන්ගේ මෙහෙයවීමෙන්, මීසම් ජනතාවගේ සහභාගිත්වයෙන් චතාරික සමයේ දින 40 ක ආධ්‍යාත්මික සූදානම්වීමේ වැඩසටහනක් දියත්කර ඇත.

මේ දිනයන්හි දිනපතා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරියේ ශුද්ධ වු පැය, දිව්‍ය පූජාව, දේව වචනය මෙනෙහි කිරීම පාදනමස්කාරය වැනි භක්ති අභ්‍යාසයන්ද සිදුකෙරේ. මේ සඳහා සැදැහැවත් ජනතාවගේ සහභාගිවීමද දිනෙන් දින වැඩි වෙමින් පවතී.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**

# සාමයේ හා ප්‍රතිසන්ධානයේ ප්‍රන්සිස්කන් සහයෝගිතා දෙවන සමුළුව පැවැත්වේ

සාමයේ හා ප්‍රතිසන්ධානයේ ප්‍රන්සිස්කාන සහයෝගිතා දෙවන මහ සමුළුව මහනුවර ලේවැල්ල පාතිමා භාවනා මධ්‍යස්ථානයේදී පැවැත්විනි. 2010 දී සහයෝගිතාව ආරම්භ කරමින් මංගල සමුළුව පැවති අතර ලංකාවේ ප්‍රැන්සිස්කන් නිකා 12 ක් ඊට ඇතුලත් විය. මෙය පූජක, පැවිදි සොයුරු, සොයුරියන් ගිහි සංඝය මෙන්ම තරුණ සංඝයෙන් සැදුම් ලද්දකි.

මේ සමුළුවේදී නව ක්‍රියාකාරි නිලධාරි මණ්ඩලය තෝරාගත් අතර ඊට 15 දෙනෙක් අයත් වෙති. සභාපති ගරු ප්ලැසිඩා ලිහිණියාකඩුව පැවිදි සොයුරිය, උප සභාපති ගරු බෙනඩික් පියතුමා, ගරු දර්ශනි අලස් මහත්මිය, භාණ්ඩාගාරික ගරු සමන්ති පැවිදි සොයුරිය පත්කර ගැනිණ.

නියෝජිතයන් 26 දෙනකු පැමිණි අතර ගරු බෙන්වෙනුතෝ බයස් OFM පියතුමා පැවැත්වූ පූජාවෙන් කටයුතු ආරම්භ කෙරුණි. ගරු පැලැසිඩ් ලිහිණිය කඩුව පැවිදි සොයුරිය වසර තුනක තම සේවා වාර්තාව ඉදිරිපත් කළ අතර භාණ්ඩාගාරික ස්ටැන්ලි පෙරේරා මහතා මූල්‍ය වාර්තාව ඉදිරිපත් කළේය. පසුව උතුරු, නැගෙනහිර ප්‍රදේශයන්හි කළ පුනරුත්ථාන කටයුතු ගැනද සාකච්ඡා කෙරුණි.

උතුරු, නැගෙනහිර අවතැන්වූවන් සඳහා වූ සේවාවන් තවදුරටත් කරගෙන යාමටද, ගිහි ප්‍රැන්සිස්කන් නිකායේ SFO හා යෞවන ප්‍රැන්සිස්කන් වරුන්ගේ කටයතු දියුණු කිරීමටද, මෙම සහයෝගිතා සංවිධානය ගැන ප්‍රැන්සිස්කන් පවුල වඩ වඩා දැනුවත් කිරීමට ද තීරනය කරගැණින. මානව අයිතිවාසිකම් සාමය හා ප්‍රතිසංධාන කටයුතු වලදී ප්‍රමුඛස්ථානය ගෙන කටයුතු කිරීමට තීරණය විය.

**අතිගරු මාර්ක් ප්‍රනාන්දු පියතුමා පැ.තු.නි**



හැඳල නායකකන්ද සා. මරියා දේවස්ථානයට අනුබද්ධිත දයාසේවා සමිතියට වසර 35 ක් සපිරීම නිමිත්තෙන් සංවිධානය කළ සංවත්සර උලෙළ සමිතියේ නිර්මාතෘ නායකකන්ද හිටපු මීසම් සේවක ගරු නිකලස් බටේපොල පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. නායකකන්ද මීසම් සේවක ගරු මහේන්ද්‍ර ගුණතිලක සහ හිටපු මීසම් සේවක ගරු එච්. ඩී ඇන්තනි පියතුමන්ද ඒ අවස්ථාවට එක්විය.

**නිමල් පෙරේරා**



දළුපත සා. වින්සෙන්ති පාවුලා සංගමය ශ්‍රවණබාධිතයන් පිරිසකට නොමිලේ ශ්‍රවණාධාර උපකරන බෙදාදීමේ උත්සවයක් පැවැත්විය. මීගමු නගර සිංහ සමාජය අනුග්‍රහය ඊට ලැබිණ. මීගමු දිසානායක සා. අන්තෝනි සිද්ධස්ථාන පාලක ගරු ජූලියස් ක්‍රිස්ටෝපර් පියතුමාගේ ප්‍රධානත්වයෙන් කටයුතු සිදු කැරිණ.

**කේ. ඒ. රෝලන්ඩ් ලෙස්ලි**



කොළඹ සා. පීතර විදුහලේ වාර්ෂික ත්‍යාග ප්‍රදාන උත්සවය 81 වන වරටත් නීති ක්ෂේත්‍රයේ කීර්තිමත් නාමයක් දිනු ජෙෆ්රි අගලරත්නම් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. මෙවර ත්‍යාග ප්‍රදානෝත්සවය වෙනුවෙන් සා. පීතර විදුහල්පති ගරු ට්‍රැවිස් ගේබ්‍රියල් පියතුමා නිකුත් කළ පණිවුඩයේ ගැබ්වූයේ උපදේශනයේ ඇති වටිනාකමයි. පවුල් සංස්ථාව තුළ ඇතිවන අඩදබර හැලහැප්පීම් මැද වෙන්වූ දෙමව්පියන්ගේ අසරණ දරුවන් ද මේ අතර සිටී. ආර්ථික පීඩනය නිසා හෙම්බත් වු දරුවන් පාසලේදී හමුවේ. මෙවැන්නන් විසින් සිදුකරන ලබන වැරදි හා වැරදීම් වලට විසඳුම දඬුවම නොවේ. ඒ සඳහා නවීනතම විසඳුම උපදේශනය යැයි ගරු පියතුමාගේ පණිවුඩයේ වැඩිදුරටත් දැක්වේ.



ලියනගෙමුල්ල ප්‍රධාන මාර්ගය අසල ඉදිකරන ලද ශු. අන්තෝනි මුනි ප්‍රතිමාව අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන් විසින් ආසිරි ගන්වා විවෘත කරන ලදී. එම අවස්ථාවට උතුරු කොළඹ කලාපීය නාහිමි අතිගරු පැට්‍රික් පෙරේරා, අගරදගුරු පදවි භාණ්ඩාගාරික මර්ල් ශාන්ති පියතුමන් සමග සැදැහැවතුන් විශාල පිරිසක් සහභාගී වූහ. සිද්ධස්ථාන පාලක ගරු රූබන් ලෙස්ලි පියතුමා මෙම උත්සවය සංවිධානය කළේය.



කණුවන මීසමේ, විශාකාවත්ත දේවස්ථානයේ දහම් පාසල් දරු දැරියන් බොහෝ දෙනෙක් තම ඉගෙනීමේ වැඩ කටයුතුවල යෙදෙන්නේ නිසියාකාරව වාඩි වී පොත පත තබාගෙන ලිවීමට අවශ්‍ය පහසුකම් නොමැතිවය. මෙම අවශ්‍යතාවය සපුරා ගැනීමට පිළිවෙලක් නොමැති අවස්ථාවේ, බස්නාහිර පළාත් සභා මන්ත්‍රී ශිරන්ත අමරසේකර මහතා ඉදිරිපත් වී ඩෙස්ක් - බංකු සෑහෙන ප්‍රමාණයක් පරිත්‍යාග කළ අවස්ථාව.

**ෂර්ලි පෙරේරා**



සත්‍යයේ හඬ පාස්කු නාට්‍ය ඇරැඹීමේ උලෙළ අඟුණාවිල මීසම් සේවක ගරු අනුර ගම්ලත් පියතුමාගේ ප්‍රධානත්වයෙන් අඟුනවිල වන්නිමඩු දෙව්මැඳුරු එළිමහන් මණ්ඩපයේ දී සිදුකැරිණ. නාට්‍යයේ නිර්මාණ දායකත්වය මාකස් නිමල් ප්‍රනාන්දුගෙනි. සියලු රංගන ශිල්පීහු පියතුමාගේ ආශිර්වාදය ලබාගත්හ.

**පීටර් කැමිලස් සුබසිංහ**

තේවත්ත පැරණි ලූර්දු මාතා දෙව්මැඳුරේ වාර්ෂික මංගල දේව මෙහෙය සිද්ධස්ථාන පාලක ගරු ප්‍රිය ජයමාන්න පියතුමන්ගේ ආරාධනයෙන් ගරු ලලිත් එක්ස්පෙඩිටස් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි. මංගල දේව මෙහෙයෙන් පසු නිර්මල ලූර්දුමාතා ප්‍රතිමාව රැගත් පෙරහර වීථි සංචාරය කිරීමෙන් පසු රැස්ව සිටි බැතිමතුන් ගරු ප්‍රිය ජයමාන්න පියතුමන් විසින් ප්‍රතිමාවෙන් ආසිරි ගැන්විය. එදින නිර්මල ලූර්දුමාතා දාන කොමිටිය මගින් පැමිණි සිටි සියලුම බැතිමතුන්ට දිවා ආහාරය බෙදා දුනි.

**එච්. ඒ. කල්දේරා**



ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk

ක්‍රිස්තු වර්ෂ 2013 මාර්තු 03 ඉරිදා

# සැකයේ භාෂාවත්, අපහාසයේ අනුශාසනයත් රජ කරත්ද?

ගෙවුනු පෙබරවාරියේ 28 වන දින අප සසුන් පියාණන් උතුම් වූ පාප්ධූරයෙන් ඉසිඹු ලැබූ බව තව දුරටත් අලුත් ආරංචියක් නොවේ. මේ වන විට ලෝක කාදිනල් සංසදය සුදොතුම් පිය වරණ දැහැන සඳහා වතිකානයේ සිස්ටයින් දෙව්මැඳුරෙහි එක්තැන්ව භාවනාශීලි හා යාච්ඤාානුභාවයෙන් අනුප්‍රාප්තිකයකු පත් කරගන්නා උතුම් වූ කර්තව්‍යයේ නියැලෙද්දි විවිධාංගිකරණය වූ මාධ්‍ය ජාල වල හරඹය යළිත් පෙර කල ඇසුනු ලසෝ ගී අයුරෙන්ම ජයටම ගයන හැඩක් පෙනේ.

ලෝක ජනමාධ්‍ය හසුරුවනු ලබන්නේ මහ පරිමාණ වෙළඳ ආයතන මගිනි. මේ මහා පරිමාණ වෙළඳ ආයතන වල හිමි කරුවන් වන්නේ ලිබරල් මත අදහස් දරන උදවිය මෙන්ම සම්ප්‍රදායේ සමාජ වටිනාකම් ගැරහුමට ලක් කරන හා අසම්මත විධි චාරිත්‍ර කෙරෙහි ලොල් බැඳ ඇති උදවිය බව කා හටත් රහසක් නොවේ.

විශේෂයෙන්ම ආගමික වටිනාකම් හා සුවිශේෂිව පුද්ගල ගුණාත්මක ජීවිත වටිනාකම් උපරිමයෙන්ම රකින්නට වැර දරන කතෝලික සභාව වැනි සම්ප්‍රදායේ උත්තරීතර ආයතනයකට පහර දෙන්නට පෙර සඳහන් කළ ලිබරල් වාදි මත දරන්නන් කුමක් හෝ නිමිත්තක් නිරන්තරයෙන්ම සොයන අවධියක මෙවර පාප් වහන්සේගේ ඉසිඹු ලැබීමේ පුවත අඬන්නට සිටි කෙනෙකුට ඇඟිල්ලෙන් ඇන්නාක් වැනියි. සමලිංගික විවාහ, සමලිංගික සේවනය, ගබ්සාව, යුද්ධය, යුද්ධයේ පැවැත්ම, අසමමිතිකව ධනය බෙදී යාම, ධනවාදයේ දුර්ගුණ, සමාජවාදයේ කුහකත්වය, ජාතිවාදය, ආගම්වාදය වැනි මිනිසුන් දුරස් කරන මේ සියල්ලට එරෙහිව නොබියව අවිහිංසාවේ අවි අමෝරා ගනිමින් උත්තුංග ආධ්‍යාත්මික දැඩි විප්ලවයක යෙදෙන කතෝලික සභා සම්ප්‍රදාය නිර්දය ලෙස හෙළා දැකීමට හා විවේචනය කිරීමට මහ පරිමාණ මාධ්‍ය ඔස්තාර්ලාට ඇති ගිජු කම හමුවේ ඇසෙන බිරුම් හඬට මහා පර්වතයක් සේ නැගී සිටින සා. පේදුරු මහා කන්ද සෙලවිය නොහැක.

අද මෙලෙස දැමුනු සිතකින් වුවත් කරුණු මේ අයුරින් ගෙන හැර දක්වන්නේ ගෙවුනු සති කිහිපය තුළ ඒ මාධ්‍ය ඔස්තාර්ලාගේ විවිධ හොරණෑ ශබ්ද අතර උතුම් පාප්ධූරයේ මාහැඟි බව කෙලසන්නට විවිධ අයුරින් අසත්‍ය දෑ පල වීමද හේතු කොටගෙනය.

අභාග්‍යයකට අප ශ්‍රී ලංකාව තුළත් සමහර මුද්‍රිත මාධ්‍ය වල පළවූ සමහර ලිපි මේ හා සම්බන්ධයෙන් ගෙන ආ කරුණු වල විකෘති කරලීම් තිබූ බව පවසාලනුයේ කිසියම් වික්ෂිප්ත බවකිනි. අද අන්තර් ජාලය හරහා එන බොහෝ වාර්තා සත්‍යය පදනම්ව ගෙන එන කරුණු නොවන බව පුංචි දරුවාද දන්නා කරුණකි. නමුත් 'වැටිලීක්ස්' යන අන්වර්ථ නාමයකින් අන්තර් ජාලය හරහා ආ සියලු පුවත් සත්‍යයම පදනම් කරගත් කරුණු සේ සලකා මෙරට මාධ්‍යයන් අවිධිමත් පරිවර්තන හා අසම්මත පද හරහා සිංහල කථා කරන ජනතාවට ලබා දෙන්නේ නම් එය නොවිය යුත්තක්ම බව පවසන්නේ මාධ්‍ය සදාචාරය ගරු කරන හා එහි ආචාර ධර්ම ඉහළින්ම සළකා කටයුතු කරන සැදැහැවත් ජනතාවක් හැටියටයි.

පාප් ධූරය වැනි උත්තරීතර ධූරයක් කතෝලික ආගමික ජනතාවට වටිනු ලබන්නේ සා. පේදුරු තුමන්ගේ අනුප්‍රාප්තිකයා හැටියට අඛණ්ඩව වසර 2013 ක් පුරා එය සම්ප්‍රදායානුකූලව පැවත එන බැවිනි. වෙනත් මූලධර්මවාදි කිතුනු යැයි හඟවන කොටස් එකී ධූරය කෙරෙහි බලන වපර බැල්ම දඩමීමා කොටගෙන සමස්ත අන්‍ය ලබ්ධිකයින් එතැනට ගමන් කළ යුතු නොවේ. විශේෂයෙන්ම අන්තර් ජාලය හරහා උකහා ගනු ලබන ලිපි වල නිවැරදි පරිවර්තනයක් ලබා ගත නොහැකි නම් ඒවා පල නොකළ යුතු වන්නේ එයින් සමස්ත කතෝලික ජනතාව ගේම සිත් රිදවන අයුරු එතුළින්ම විද්‍යමාන වන බැවිනි. අනෙක් අතට ප්‍රලාප ලිවීමත් අනුමත කළ නොහැක්කේ හුදෙක් ජුදා ක්‍රිස්තියානි සංස්කෘතික භීතියකින් පෙලෙන සමහර උදවියට මෙවන් කරුණු සිතූ සිතූ සේ උඩු යටි කුරු කළ හැකි බැවින්ය. නමුත් පිළිගත් මාධ්‍ය ආයතන හා සම්ප්‍රදාය මේවා පිටුදකින බව අපි දනිමු.

මනරම් යැයි සිතන ආවර්ජනා තුළ නොයෙක් දෑ පැවසිය හැකියි. නොයෙක් දුර්මත විහිදා හැරිය හැකියි. ද්වේෂ සහගතව සත්‍යයේ පින්තූරය විකෘති කළ හැකියි. ප්‍රලාප හා ප්‍රබන්ධ තුළින් වැරදි චිත්‍රයක් මවා දැක්විය හැකියි. නමුත් තව සතියකින් සියල්ල නිමාවට පත්වනු ඇත. අන්තර් ජාලය හරහා උඩකරණම් ගැසූ බොහෝ දෙනෙක් හට දෙපා පොළවට තබන්නට කාලය උදාවනු ඇත. එහිදී තමන්ගේ නිරුවත අන්‍යයනට ප්‍රදර්ශනය වීම ගැන ලැජ්ජාවටම පත්වන්නට සිදුවනු ඇත.

නව ලිබරල් චින්තන වාදයේ බිහිසුණු පැතිකඩ යුරෝපය. අමෙරිකාව හරහා ආසියාවද ගිල ගනිමින් පවතින යුග වකවානුවක සම්මතය, සම්ප්‍රදාය හා චරිත රැකීම ඉතා උගහට වී ඇත. නමුත් සත්‍යයේ සලකුණු ජයගත යුතුව ඇත. එතැනට කරුණු සැලසිය යුතුයි. ඒ මන්ද අප ජීවත්වන්නේ සැකයේ හා භීතියේ භාෂාවත්, අපහාසයේ අනුශාසනයත් වැජඹෙන සමාජයක නිසාවෙනි.

විශ්වාසයේ වසර

දහම් චින්තා 19

# පාප්තුමාගේ නිල නිෂ්ක්‍රමණය

2 වන කොටස

**ගරු ෆ්‍රීලි මුතුකුඩආරච්චි පියතුමා**

එලෙස සහා ඉතිහාසය තුළ නිල වශයෙන් පත් වූ පාප් තුමාගේ නිල නිෂ්ක්‍රමණයෙන් පසුව (1294 දෙසැම්බර් මස සිට 1296 මැයි මස දක්වා කාලය තුළ) එතුමා ජීවත්ව සිටියදී නිල වශයෙන් නව පාප් තුමකු පත් වී සේවය කළ පළමු අවස්ථාව එය වේ.

එවැනි දෙවන අවස්ථාව උදා වනුයේ වත්මන් පාප් තුමන් ගේ නිල නිෂ්ක්‍රමණයෙන් පසුව 2013 මාර්තු 15 වන දින හා 20 වන දින අතරතුර කාලයේ දී පැවැත්වීමට නියමිත පාප් නිලවරණ රහස්‍ය සම්මුති සභාව නව පාප් තුමකු පත් කළ විටය.

වත්මන් සභා නීති සංග්‍රහය වන 1983 සභා නීති මාලාවේ පාප්තුමාගේ නිල නිෂ්ක්‍රමණය පිළිබඳ සම්පාදිත නීතිය අංක 332 2 වන පරිච්ඡේදයේ සඳහන් වේ. යම් කිසි හෙයකින් "රෝමයේ ශුද්ධෝත්තම පියතුමා නිල නිෂ්ක්‍රමණය කළහොත් එහි වලංගුභාවය සඳහා එම නිල නිෂ්ක්‍රමණය නිදහස් ලෙස හා විධිමත් ප්‍රත්‍යක්ෂ බවකින් කළ යුතු අතර කිසිවකු විසින් එය භාරගැනීම අවශ්‍ය නොවේ." කෙසේ වෙතත් ඉහත නීතියට අනුව ඒ පිළිබඳව කාදිනල්වරුන්ගේ සංඝත සභාව වෙත එය දැනුම්දීම කළ යුතු යැයි සමහර සභා නීතිවේදීන් පෙන්වා දෙයි. ඒ අනුව xvi වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමා පසුගිය 11 වන දින කාදිනල්වරුන්ගෙන් සමන්විත වූ විශේෂ සම්මුති සභාව වෙත ඒ බව දැනුම් දුන්නේය.

පාප් නිල වරණය පිළිබඳ නීති විධි විධාන පසුගිය ශත වර්ෂය තුළ සංස්කරණ කිහිපයකට භාජනය වී තිබේ. 1917 සභා නීති සංග්‍රහය තුළ පාප්තුමාගේ නිල නිෂ්ක්‍රමණය පිළිබඳ විධි විධාන අංක 221 හි සඳහන් වී තිබේ. **Si contingat ut Romanus Pontifex renuntiet, ad eiusdem renuntiationis validatem non est necessaria Cardinalium aliorumve acceptatio**

එනම්, "යම්කිසි හෙයකින් රෝමයේ ශුද්ධෝත්තම පියතුමා නිල නිෂ්ක්‍රමණය කළහොත් එහි වලංගුභාවය සඳහා එම නිෂ්ක්‍රමණ ලියවිල්ල කාදිනල්වරුන් විසින් හෝ අන් කවරෙකු විසින් භාර ගැනීම අවශ්‍ය නොවේ." යන්නය.

පාප් නිලවරණ ක්‍රියා පටිපාටිය පිළිබඳ නීති විධිවිධාන 1917 න් පසුව xii වන පියුස් පාප්තුමා 1945 දී **Vacanits Apostolica Sedis** හෙවත් "අපෝස්තලික ආසනය හිස්වීම" නමැති එතුමාගේ අපෝස්තලික ව්‍යවස්ථාව මඟින් එතෙක් පැවති පාප් නිලවරණ නීති විධි විධාන නැවත සංස්කරණය කරන ලදි. ඉන් පසුව 1962 දී xxiii වන ජුවාම් පාප් තුමා හා 1975 දී **"Romano Pontifici elegendo"** "රෝමයේ ශුද්ධෝත්තම පියතුමා තෝරාපත් කිරීම" නමැති තම අපෝස්තලික ව්‍යවස්ථාව මඟින් vi වන පාවුළු පාප්තුමා එම නීති විධි විධාන සංස්කරණය කරන ලදහ. පාප් නිලවරණය පිළිබඳ මෑත කාලීන නීති විධි විධාන ii වන ජුවාම් පාවුළු පාප් තුමන් විසින් 1996 දී **,Universi Dominici gregis"** "ස්වාමින් වහන්සේගේ විශ්ව රැළෙහි එඬේරා" නමැති අපෝස්තලික ව්‍යවස්ථාව මඟින් ඉදිරිපත් කරන ලදි. එමඟින් ඊට පෙර පැවති සියලු ව්‍යවස්ථාවන් හා විධිවිධාන අහෝසි කරනු ලැබිණි.

2007 වසරේ xvi වන බෙනඩික්ට් පාප් තුමා ඉහත කී අපෝස්තලික ව්‍යවස්ථාවේ සමහර කොටස් පමණක් එනම් අංක 72, 73 හා 74 සංශෝධනය කර පාප් නිලවරණයේ සාම්ප්‍රදායික ලෙස අවශ්‍යව තිබූ බහුතර ඡන්ද ප්‍රමාණය වන 2 /3 සීමාව ප්‍රතිෂ්ඨාපනය කළේය. ඒ අනුව මීළඟ පාප් නිලවරණය පැවැත්වීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාපටිපාටිය **"Universi Dominici gregis"** නමැති අපෝස්තලික ව්‍යවස්ථාව මඟින් ඉදිරිපත් කර ඇති නීති විධිවිධාන වලට අනුව සිදුකරනු ඇත. ශුද්ධෝත්තම පියතුමකු නිල නිෂ්ක්‍රමණය කිරීමක දී අනුගමනය කළ යුතු හෝ එතුමා පූර්ණ වශයෙන් හා දිගු කාලීන ලෙස දුර්වල වුවහොත් අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය සඳහා විශේෂ විධි විධාන නිකුත් වී නොමැති අතර නීති අංක 332 - 2 හි සඳහන් වන්නේ නිල නිෂ්ක්‍රමණ ලියවිල්ල නිදහස් ලෙස හා ප්‍රත්‍යක්ෂ ලෙස ප්‍රකාශයට පත් කළ යුතු බව පමණකි.

සභා නීති සංග්‍රහයේ නිලයකින් ඉල්ලා අස්වීම පිළිබඳ නීති මූලධර්ම නීති අංක 187 හි සඳහන් වේ. එයට අනුව තමා පිළිබඳව වගකීමකින් යුතුව තීරණ ගත හැකි ඕනෑම කෙනකුට සාධාරණ හේතුවක් මත තම නිල සේවාවෙන් ඉල්ලා අස්විය හැකි බව සඳහන් වේ. සාධාරණ හේතුවක් වශයෙන් කරුණු කිහිපයක් දැක්විය හැකිය. ඒවානම්, ★ සාන්ත සභාවේ උන්නතිය වෙනුවෙන්, ★ තමා දරණ නිලයේ අනාගත ප්‍රගතිය වෙනුවෙන් හෝ තමන්ගේ පෞද්ගලික ආත්ම අභිලාසය යන කරුණුය. යම් කිසි නිලයක් අත්හැරීම සඳහා පුද්ගලයකු හට ස්වතීරණ ගැනීමේ ශක්තිය තිබිය යුතුය.

පුද්ගලයකු යම්කිසි ආකාරයකට අකර්මන්‍ය වුවහොත් උදාහරණ වශයෙන් වයෝවෘද්ධ මානසික ක්‍රියාකාරීත්ව පරිහානිය, රෝග වැළඳීම, සිහිය අඩි මූර්ජාවකට භාජනය වීම, මොළයේ ආඝාත තත්ත්වයක් හටගැනීම හෝ දැඩි මානසික රෝගී තත්ත්වයකට භාජනය වීම වැනි රෝගාතුර තත්ත්වයකට භාජනය වුවහොත් එවැනි පුද්ගලයකු නිලයෙන් ඉල්ලා අස්වීමට තීරණයක් ගත නොහැකි පුද්ගලයකු වේ. එවැනි අවස්ථාවක දී එම පුද්ගලයා නැවත සිහි කල්පනාවට පැමිණ තීරණය ප්‍රකාශ කරන තුරු හෝ මිය යන තුරු ඔහු විසින් දරන ලද නිලය හිස්වීම සිදු නොවේ.

සාන්ත සභාව තුළ නිල සේවයෙන් සමුගත හැකි හෝ නිලයෙන් ඉවත්වීමට ලියවිල්ලක් මඟින් ඉල්ලා සිටිය හැකි අවස්ථා කිහිපයක් තිබේ. යම් කාදිනල්වරයකු හෝ රදගුරුතුමකු හෝ නිල සේවයෙන් ඉල්ලා අස්වන්නේ නම් එම ලියවිල්ල ශුද්ධෝත්තම පියතුමා වෙත ඉදිරිපත් කළ යුතුය. රෝමානු කියුරියා මණ්ඩලයේ හෝ වතිකාන රාජ්‍ය මන්ත්‍රණ මණ්ඩලයේ විවිධ කාර්යාංශ ආයතනවල නායකත්වය හොබවන කාදිනල්වරුන් හා රදගුරුවරුන් විසින් වයස අවු. 75 සම්පූර්ණ වූ විට නිල සේවයෙන් ඉවත්වීම සඳහා ඉල්ලුම් ලිපිය ශුද්ධෝත්තම පියතුමාට භාර දිය යුතු බවට නියම කෙරේ. (අංක 354). ඊට පෙරාතුව vi වන පාවුළු පාප් තුමන් විසින් වයස අවු. 80 සම්පූර්ණ කළ විට කාදිනල්වරයකුගේ මන්ත්‍රණ මණ්ඩලයේ නිල හා එහි සාමාජිකත්වය නිතැතින් අහෝසි වන බව ප්‍රකාශ කළේය. එලෙසම වත්මන් නීතියට අනුව 80 විය සම්පූර්ණ කළ කාදිනල්වරුන්ගේ පාප් නිලවරණ ඡන්ද දායකත්වය අහෝසි වන බව සඳහන් වේ.

රදගුරුවරුන් විශ්‍රාම යෑම පිළිබඳ ක්‍රියාපටිපාටිය දෙයාකාරව සිදුවිය හැකිය. පළමුව, වයස අවු. 75 සම්පූර්ණ කරනු ලැබූ පදවි භාර රදගුරුතුමකු තම නිල සේවයෙන් විශ්‍රාම යෑම පිළිබඳ ලියවිල්ල අපෝස්තලික තානාපති තුමා මඟින් ශුද්ධෝත්තම පියතුමා වෙත ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලබයි. (අංක 401).

එම නීතිය මඟින් සෑම රදගුරුතුමකුම වයස අවු. 75 සම්පූර්ණ කළ විට ස්වේච්ඡාවෙන් තම නිල සේවයෙන් විශ්‍රාම ගැනීමට කටයුතු කළ යුතු බව සඳහන් කරයි. දෙවැනි අවස්ථාව නම් යම් කිසි රදගුරු පදවියක් භාර රදගුරුතුමකු දැඩි රෝගාතුර තත්ත්වයක් නිසා හෝ වෙනත් බැරෑරුම් හේතුවක් නිසා තම නිල සේවය දිගටම ඉටුකරගෙන යාමට අපොහොසත් වේ නම් එවිට එතුමා නිල සේවයෙන් ඉල්ලා අස්වීමට කටයුතු කළ යුතු බව අවධාරණයෙන් සඳහන් කරයි. (2) ඉහත සඳහන් අවස්ථා දෙකෙහිම සඳහන් කරුණු සහායක රදගුරුතුමකු හා යුව රදගුරුතුමකු වෙත ද බලපානු ඇත. (403).

මීසම් සේවක පියතුමකු තම නිල සේවයෙන් ඉල්ලා අස්වීමට බලාපොරොත්තු වන්නේ නම් එම ඉල්ලීම ලිඛිතව පදවිය භාර රදගුරුතුමා වෙත ඉදිරිපත් කළ යුතුවේ. මීසම් සේවක පියතුමකු වයස අවු. 75 සම්පූර්ණ කළ පසු නිල සේවයෙන් විශ්‍රාම යෑම සඳහා ඉල්ලීම සාමාන්‍යයෙන් රදගුරුතුමා වෙත භාරදිය යුතු අතර සේවය කරන ස්ථානය හා එම පුද්ගලයා පිළිබඳ කරුණු සලකා බලා එම ඉල්ලා අස්වීම භාර ගැනීමට හෝ කල් දමා භාර ගැනීමට රදගුරුතුමාට කටයුතු කළ හැකිය. (අංක 538).

එලෙසම සභා නීති අංක 189 ට අනුව යම් කිසි නිලයකින් ඉල්ලා අස්වීම ඉහළ අධිකාරි බලයක් සතු තැනැත්තකු විසින් භාරගත යුතු යැයි සඳහන් අවස්ථාවල මාස 3 ක් අතුළත එය භාරගනු නොලැබුවහොත් එය බල රහිත ලෙස නිෂ්ප්‍රභ වේ.

නමුත් එලෙස කිසිවකු විසින් එම ඉල්ලීම භාරගැනීමක් අවශ්‍ය නොවන අවස්ථාවල එම තැනැත්තා විසින් එය සන්නිවේදනය කළ විට එහි සඳහන් දින සිට එම නිලය නිතැතින් හිස් වනු ඇත. වත්මන් ශුද්ධෝත්තම පියතුමාගේ නිල නිෂ්ක්‍රමණය කිරීම, ලියවිල්ලේ සඳහන් පරිදි පෙබරවාරි 28 වන දින ප.ව. 8.00 ට කිසිවකු විසින් එය භාර ගැනීමකින් තොරව ස්වයංව සිදුවනු ඇත.

සභා නීති අංක 402 ට අනුව, විශ්‍රාමික රදගුරුතුමකු තමා පෙර ධූරන්ගතව සිටි රදගුරු පදවියේ නාමය තම ශීර්ෂ නාමය ලෙස තව දුරටත් යොදා ගනිමින් එම පදවියේ ධූරාතීත රදගුරුතුමා ලෙස පෙනී සිටිය හැකිය.

ලබන සතියට »

කැමිලස්ගේ — තිත්ත ඇත්ත



# දෙව්මවුන් තුළ ශක්තිමත්වී අභියෝග ජයගනිමු

## කළුතර ලූර්දු මාතා උලෙලේදී අගරදගුරු හිමිපාණෝ පවසති

**"සමස්ත කිතුනු ජනතාව අද දේවමාතාවන්ට දක්වන ආදරය, දයාව, කොතෙක්ද යන්න වචනයෙන් කියා නිම කළ නොහැක. එතුමිය ලෝවැසි ජනතාවගේ ආදර දේව අම්මාය. එය සැබෑවු සත්‍යතාවයකි. එහෙත් දේවමාතාවන්ට දක්වන ආදරයට ගෞරවයට විරුද්ධව අද ඇතැම් මූලධර්මවාදීන් එතුමියට අපහස වන අන්දමින් ගෙන යන ක්‍රියාවන් පමණක් නොව, එතුමියගේ ප්‍රතිමා විනාශ කර දමමින් කරන අකටයුතුකම් පිළිබඳවත් නිතර අසන්නට ලැබෙනවා. ශුද්ධවූ බයිබලය තුළ එතුමිය පිළිබඳව කිසිදු සටහනක් නැතැයි, පවසමින් ඒවා විකෘති කරමින් එතුමියට නිගා කරමින්, ගෙන යන ක්‍රියාවන් අපි දැඩිසේ හෙළා දැකිය යුතුවෙමු. දේව අම්මා එදත් අදත් අපගේ ආදරණීය අම්මා බව ශුද්ධවූ බයිබලය තුළද එතුමිය පිළිබඳව වඩාත් ගැඹුරින් සනිටුහන් වී ඇති බව අපි දනිමු. අපට දුකක් කරදරයක් පැමිණි අවස්ථාවේදී සැනසීම සොයා යන්නේ දේව අම්මා වෙත නොවේද? දෙවිපියාණන් හමුවේ අප වෙනුවෙන් මධ්‍යස්ථවන එතුමියට අප තුළ ඇති භක්තිය තව තවත් වර්ධනය කර ගනිමු" යයි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ පැවසූහ.**



කාදිනල් හිමි එසේ පැවසුවේ, කළුතර ලූර්දු දේවමාතාවන්ගේ 104 වන වාර්ෂික මංගල සන්ධ්‍යා මෙහෙයේදීය. මංගල දිව්‍ය යාගය, කොළඹ සාන්ත පීතර විදුහලේ උප අදියුරු ගරු ජයශාන්ත සෝවිස් පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදි. කළුතර මීසම් සේවක ගරු සුරාන් අත්තිඩිය පියතුමා ඇතුළු මීසම් ධර්මසේවා කමිටුව, කළුතර දිසානායක ගරු මොරිස් නාමල් පියතුමා ප්‍රමුඛ, දිසාවේ පියවරුන්ගේ සංවිධානයෙන් මෙම මංගල උලෙළ උත්කර්ෂවත් අන්දමින් පැවැත්වින.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**

## කඳාන දිසා සිරිහද සමිති නව නිලධාරීහු පත්වෙති

කඳාන දිසා දිව්‍ය හෘදය සමිතියට නව නිලධාරීන් පත්කර ගැනීම පසුගියදා සිදුවිය.

කඳාන දිව්‍ය හෘදය දිසා අධ්‍යක්ෂ ගරු ක්‍රිස්ට් නිකලස් පියතුමාගේ ප්‍රධානත්වයෙන් කඳාන සිද්ධස්ථාන ශාලාවේදී පවත්වන ලද රැස්වීමේදී එක්වූ නව නිළධාරි මඬුල්ල මෙසේය.

සභාපතිනි අයිරින් සමරවික්‍රම (කඳාන), උප සභාපතිනි මේබල් ප්‍රනාන්දු (වැවල), ලේඛිකා මොරින් කීගල් (නාගොඩ), උප ලේඛිකා මේරි සුසිතා (බොල්ලත), භාණ්ඩාගාරිකා ඊ. ප්‍රින්සි ප්‍රනාන්දු (කලඑලිය), උප භාණ්ඩාගාරිකා ඩල්සි මෙන්ඩිස් (වැලිකුරුඳුවත්ත)



වයඹ පළාතේ පාසල් දරුවන්ගේ පෙළපොත් බෙදාදීමේ මහෝත්සවය කුරුණෑගල ශුද්ධ වු පවුලේ බාලිකා මහා විද්‍යාලයේදී වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය නීතිඥ අතුල විජේසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විනි. මේ අවස්ථාවට වයඹ ප්‍රධාන අමාත්‍යංශයේ ලේකම් ජයන්ත විජේරත්න වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ජේ. ජී. එන්. තිලකරත්න, කුරුණෑගල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ යු. එල්. සිරිමෙවන් පොඩි නිළමේ යන මහත්වරුද සහභාගි වූහ. කුරුණෑගල ශුද්ධ වු පවුලේ බාලිකා මහා විද්‍යාලයීය නව විදුහල්පතිනි ගරු ට්‍රිසිල්ඩා ප්‍රනාන්දු පැවිදි සොහොයුරියගේ නායකත්වය හා මඟපෙන්වීම යටතේ වයඹ පළාත් පාසල් පෙළපොත් බෙදාදීමේ මහෝත්සවය උත්කර්ෂවත් අයුරින් සංවිධානය කර තිබුණි.

**බී. කේ. ටී. රෙජිනෝල්ඩ්**

## පමුණුගම පාස්කු මණ්ඩපය පිළිසකර කරයි

පමුණුගම ඓතිහාසික පාස්කු මණ්ඩපය නවීකරණය කිරීමට පමුණුගම මීසමේ ගොඩනැගිලි කමිටුව කටයුතු යොදා ඇත.

මේ අනුව පාස්කු මණ්ඩපය පැරණි ආකාරයට ගොඩනැංවීමටත් එහි පසුපස කොටස මීසමේ පොදු ප්‍රයෝජනයට ගන්නා ආකාරයෙන් ගොඩ නැංවීමටත් සැලැසුම් කර දැනට එහි කටයුතු ආරම්භ කර ඇත. මෙවර මහසිකුරාදා තුන්පැය ධ්‍යානය නව පාස්කු මණ්ඩපයේ පැවැත්වීම සඳහා අවශ්‍ය ගොඩැගිලි ඉදිකිරීම් මේ දිනවල සිදුකෙරේ.

**බෙන්ජමින් කිරිහෙට්ටි**

## මීසම් එකමුතුවට ක්‍රිකට් තරගාවලියක්



ගරු නිර්මාල් මාලක පියතුමාගේ සම්ප්‍රාප්තියත් සමග ආරම්භ වූ කළුතර, නාගොඩ නව මීසමේ එකමුතුකම හා සහයෝගිතාවය වඩාත් ශක්තිමත් කිරීම සඳහා නාගොඩ මීසම් තරුණ සමිතිය, විවාහක තරුණ සමිතියේ ද සහයෝගය ඇතිව ක්‍රිකට් තරගාවලියක් සංවිධානය කළහ. නාගොඩ ලූවිස් සිල්වා ක්‍රීඩාංගනයේදී සාර්ථකව පැවැති එම ක්‍රිකට් තරගාවලිය නම් කර තිබුණේ ගරු මෙරිල් විජේසිංහ පිය අනුස්මරණ ක්‍රිකට් තරගාවලිය ලෙසිනි.

**ෂ්‍යානි අමාලි**

## ගැඹුරු විශ්වාසය නිසා දේවමාතාව උත්තරීතර බව දිනා ගත්තා

දේවමාතා වහන්සේ දෙවියන් වහන්සේ කෙරේ භය භක්තියෙන් ක්‍රියාකළ අතර ඇය තුළ තිබූ ගැඹුරු විශ්වාසය නිසාම ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ එතුමියගේ කුස තුළ දරා ගැනීමේ වරම පමණක් නොව දේවමාතා වහන්සේ උත්තරීතර කාන්තාවක් බවට පත්වීමටත් එතුමිය වෙත සෑම දෙනාගේ අති ගෞරවනීය තත්ත්වයට පත්වූ උතුම් කාන්තාවක් බවට පත්වන්නට හැකිවූ බව කුරුණෑගල සා. ආනා ආසන දෙව් මැඳුරේ පැවති ලූර්දු දේව මාතා මංගල්‍යයට සහභාගි වෙමින් කුරුණෑගල පදවි භාණ්ඩාගාරික අතිගරු බැසිල් රොහාන් ප්‍රනාන්දු පියතුමා පැවසීය.

එහිදී වැඩිදුරටත් කතාකළ භාණ්ඩාගාරික පියතුමා මෙසේද පැවසීය. අද සමරන ලූර්දු දේවමාතා වහන්සේ මංගල්‍ය දවසේ දේවමාතා වහන්සේගේ උතුම් ආදර්ශය පිළිගෙන ක්‍රියාකිරීමට අදිටන් කර ගනිමු. එතුමියට ගෞරව දැක්වීමටත් එතුමියගේ ආදර්ශය අනුව අපගේ ජීවිත හැඩගස්සවා ගැනීමත් අපගේ වගකීමයි.

කුරුණෑගල මීසම් සේවක ගරු ජෙරම් පෙරේරා පියතුමාගේ මෙහෙයවීම මත ලූර්දු මාතා මංගල්‍යය සංවිධානය කැරිණ.

**බී. කේ. ටී. රෙජිනෝල්ඩ්**

## නවක පූජක තුමන්ගේ කුළුදුල් දිව්‍ය යාගය

පල්ලන්සේන මීසමේ දුවන ශුද්ධවූ ත්‍රිත්ව දේවස්ථානයේදී ගරු අසන්ත දිලුෂ ප්‍රශාන් ගෝමස් නවක පියතුමාගේ කුළුදුල් දිව්‍ය යාගය පැවැත්විය.

සලාපුර රදගුරු අති උතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මැන්ඩිස් හිමිපාණන් අතින් පූජකවරය ලබා පැවැත් වු කුළුදුල් දිව්‍ය යාගයට ගරු ආනන්ද විතාන, කුඩා කිතුනු සංඝ ජාතික අධ්‍යක්ෂ ගරු එරික් ප්‍රනාන්දු පියතුමන්ද සහය විය. මෙම කුළුදුල් දිව්‍ය යාගයට ගරු පියතුමන්ලා දොළොස් නමක් සහභාගි වූ අතර අති උත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධාත්ම පියතුමන් විසින් එවන ලද සුබාසිංසන පණිවුඩය දිව්‍ය යාගය අවසානයේ දී ඉතාලියේ ශ්‍රී ලංකා සංක්‍රමණික ජාතික උපාධ්‍ය අතිගරු නෙවිල් ජෝ මාහිමිපාණන් විසින් පිළිගන්වන ලදී. පල්ලන්සේන මීසම් සේවක ගරු ජයන්ත නිමල් සහයක ගරු ගයාන් ප්‍රසන්න පියතුමන් ඇතුලු පිරිස කටයුතු සංවිධාන කළහ.

**මෙල්වින් ද කොස්තා**

# පරප්පුකඩන්දාන් ක්‍රිස්තු දෙව් විමනේ කල්වාරිය

ලන්දේසි යුගයේ පරප්පුකඩන්දාන් හි තිබුණේ සා. අන්තෝනි දෙව් මැඳුරකි. දවසක් මෙම දෙව් මැඳුරේ විසූ සංක්‍රිස්තියන් අපූරු සිහිනයක් දැක ඇත. එම සිහිනයෙන් කියා තිබුණේ ක්‍රිස්තුතුමාගේ ප්‍රතිමාවක් තනා එම දෙව් මැඳුරේ තැන්පත් කරන ලෙස ය. සංක්‍රිස්තියන් ඒ සිහිනය ස්මරණය කරමින් අසා සිටියේ "මම කොහොම ද එය කරන්නේ?" කියා ය. ඔහුට ලැබී ඇති පිළිතුර අලුත් ම මාදිලියේ එකකි. එනම් "උඹ මිනිසුන් කණ්ඩායමක් සමග කැලයට පලයන්. කැලයේදී නුඹට හඬක් ඇසේවි. ඒ ඔස්සේ උඹ පලයන්. එහිදී නුඹට ගසක් දකින්නට ලැබේවි" ඒ කියූ ලෙස ම පසුදින නිදියහනෙන් නැගිට ඔහු කටයුතු කළේය. කැලයේදී ඇසුණු හඬ ඔස්සේ ගිය විට ඒ කී ගස දකින්නට හැකිවිය. ඔවුහු එතැන දණ ගසා යාච්ඤා කළ සංක්‍රිස්තියන් පොරව ගෙන ගස කපන්නට පටන් ගත්තේය. එහිදී දක්නට ලැබුණේ ගසෙන් ලේ ගලන බවයි. ඔවුන් දණගසා සමාව ඉල්ලන්නට වූහ. පසුව ඔවුන් මිහරකුන් දෙදෙනකු ගෙනවිත් ඔවුන්ගේ සහය ද ඇතිව ගස පල්ලියට රැගෙන යන්නට විය. ඔවුන් මෙම ගසෙන් කුමක් කරන්නදැයි කල්පනා කරනවිට පාර දිගේ තුන් දෙනෙක් ඔවුන් සිටි දෙසට පැමිණ ඇත. ඒ පාර අද හඳුන්වන්නේ මඩු පාර නමිනි. ඔවුන් ආවේ කුමකට ද? ආයුද ගෙනාවේ ඇයි? මේ විමසීමෙන් කීවේ ඔවුන් වඩුබාස්ලා බවයි. ඔවුහු ප්‍රතිමා නෙලීමට දක්ෂ අය බව කීහ. රැගෙන ආ ගස ඔවුන්ට භාර කළේ ය. තව ද පල්ලිය වටා වැටක් ගසන්න වුවමනා බව ඔවුන් සැළකර සිටියේ ය. දවස් හතක් යනතුරු වැටෙන් ඇතුළට නොයා යුතුයි. සංක්‍රිස්තියන්ට පමණක් 7 වන දිනදී පැමිණීමට හැකි බව ඔවුහු කියා සිටියහ.

හයවන දින සංක්‍රිස්තියන් යන විට ක්‍රිස්තු ප්‍රතිමාව නෙලා තිබෙනු දක්නට විය. ඇස්දෙක පමණක් එම ප්‍රතිමාවේ තනා තිබුණේ නැත. එයත් එදින ම නිම කරන බව බාස්ලා සංක්‍රිස්තියන්ට පැවසූහ. "අපි දැන් යන්න ඕනෑ! අපේ පඩි අපට දෙන්න." ඔවුන් ඉල්ලා සිටියහ. සංක්‍රිස්තියන් ගොස්සල්ලි එකතු කරගෙන පැමිණෙන්නට විය. ඒවා රැගෙන එනවිට පල්ලියේ කිසිම කෙනෙක් සිටිනු දක්නට නොවී ය. ඔහු වහා පල්ලියේ දොර ඇර බලන විට තිබුණේ ප්‍රතිමාව පමණය. ඔහු ක්ලාන්ත වී බිම ඇද වැටුණේය. පසුව සංක්‍රිස්තියන් ගොස් සිදු වූ විස්තරය පියතුමාට දැන්වීය. පියතුමා පැමිණ ප්‍රතිමාව ආසිරිගන්වා පෙට්ටියක් තුළ බහා එම ප්‍රතිමාව සඟවා තබන්නට විය.



1890 වන විට කොවන්කුලම් ප්‍රදේශ වාසියකු මෙම සංක්‍රිස්තියන් තනතුරට පත්විය. පැරණි සංක්‍රිස්තියන් මිය යාම නිසා පසුව පාදනමස්කාරය සඳහා මෙම ප්‍රතිමාව වන්ගාලි නම් ප්‍රදේශයකට ගෙන ගියේය. සංක්‍රිස්තියන් ඇතුළු පිරිස වන්ගාලිවලට ගොස් ප්‍රතිමාව ආපසු ලබාදෙන ලෙස ඉල්ලා සිටියද එය ප්‍රතික්ෂේප කැරිණ.

පසුව වන්ගාලිහි බොහෝ දෙනා බෙරිබෙරි රෝගයෙන් හා කොළරාව රෝගයෙන් පෙළෙන්නට වූහ. ඉන්පසු ජනතාව ප්‍රතිමාව ගෙන විත් බාර දුන්නේය. මේ සිදුවීමට පසුව අදිකාරම් නමැති දරුවන් නොමැති අයකු බාරයක් වීමෙන් පසුව ඔහුට පිරිමි දරුවෙක් ලැබුණේ ය. ඔහු බාරය අනුව සුරුවමට කුඩුවක් තනා දීමට ඉදිරිපත් විය. ඉන්පසු සුරුවම ආරක්ෂා සහිතව එහි තැබීය.

මේ කල්වාරි පුදබිම ගැන වැඩි විස්තර ගරු ජෙයබාලන් පියතුමා, සා. ෆ්‍රැන්සිස් සේවියර් දෙව් මැඳුර, අල්කට්ටිවෙලී, අමාන්දාම්කුලම යන ලිපිනයෙන් හෝ දුරකථන අංක 023-7910855 හෝ 077-4200291 ඇමතීමෙන් ලබාගැනීමට පුළුවන.

**සටහන - මැක්ෂිමස් රෝයි පෙරේරා**

## මීගමුව කටාන පශ්චත්තාපී දිනය 10 ද

මීගමුව සහ කටාන දෙදිසාවන් ඒකාබද්ධව සංවිධානය කරන පශ්චත්තාපික දිනය මාර්තු 10 ඉරුදින ප.ව. 4.00 ට මීගමුව මාරිස්ටෙලා විදුහල් ක්‍රීඩාංගනයේදී පැවැත්වේ.

## බටේපොල මීසම තලවිල යයි

බටේපොල මීසම් පවුලේ 2013 වාර්ෂික චතාරික වන්දනා ගමන මෙවර තලවිල සා. ආනා සිද්ධස්ථානයට යොදාගෙන ඇත. මාර්තු 16 සෙනසුරාදා මේ සඳහා වෙන්කර ඇත.

**සිසිල් ඩැනීසියස්**



කුරුකුලාව සා. සෙබස්තියන් මුනි සුබසාධක සමිතිය 21 වන වරටත් වෛද්‍ය සායනයක් පැවැත්විය. දන්ත සායන නොමිලේ ඇස්කණ්නාඩි ලබාදීම, පාසල් දරුවන්ට නොමිලේ අභ්‍යාස පොත් බෙදා හැරීම සිදුකළ අතර ඉන් අනතුරුව ශුද්ධවු සෙබස්තියන් මුනි මංගල උලෙළ සමරමින්, වීදි සංචාරය කළේය.

**එච්. ඒ. කල්දේරා**

## ධර්ම සංග්‍රහය

# ජීවිත පෙරළියකට මුල් විය යුතු චතාරික සමය

**ජේසු ක්‍රිස්තුන් වහන්සේගේ දුක් ප්‍රාප්තිය සිහිපත් කරන කාල පරිච්ඡේදය චතාරික කාලය හෙවත් කොරොස්ම කාලය ලෙස හඳුන්වයි.**

මෙම කාලය තුළ කිතුනු ජනතාව මර්දන ක්‍රියා කරමින්, පාද නමස්කාරය වැනි ආධ්‍යාත්මික වතාවත් වලට සහභාගි වෙමින්, පාපොච්චාරණය කරමින් සිය පව් සඳහා ක්‍ෂමාව ලබා ගැනීමට ක්‍රියා කරති. සත්‍ය වශයෙන්ම චතාරික සමය එක්තරා කාල පරිච්ඡේදයකට පමණක් සීමා කළද සැමදා අර්ථ සම්පන්න වන්නාවූ යථාර්ථයකි. සදාකාලික අත්දැකීමකි.

ජේසු සමිඳුන් මෙලොවට වැඩියේ මිනිසාගේ පාප වලට ජීවිතය පරිත්‍යාග කරමින් සදාතන විමුක්තිය ලබා දීම සඳහාය. එම මහඟු කාර්යභාරය සඳහා උන්වහන්සේ ඉමහත් සූදානමකින් යුක්තව ක්‍රියා කළ සේක. සකල ජනතාවගේ පාපයන් උන්වහන්සේගේ කරට ගෙන කුරුසයක් මත සිය ජීවිතය පුද කිරීමට තරම් එතුමාගේ ප්‍රේමය පරාර්ථකාමී විය. සදාකාලික විය. උන්වහන්සේ සිය දේවත්වය, රාජකීයත්වය හිස්කොට සාමාන්‍ය මනුෂ්‍යයකු ලෙස මෙලොවට වැඩිය සේක. උන්වහන්සේගේ ඒකායන පරමාර්ථය වූයේ සකල ජනතාව පාපයෙන් මුදාගෙන ස්වර්ගීය සැපත ලබාදීමයි. දේව ජීවිතය තුළ උන්වහන්සේ මුහුණ දුන් එම වේදනාකාරි අත්දැකීමට අපිදු සම්බන්ධ විය යුතුය. සංවේදි විය යුතුය. මිනිස් ජීවිතය තුළ උද්ගතවන ගැටලු, හැලහැප්පීම්, වේදනා තුළ ශුද්ධාත්ම අනුග්‍රහය ලබාගත යුතුය.

එපමණක් නොව, සියලු අවස්ථාවලදී අප දෙවිඳුන් වෙතින් අප ජීවිත මාරුවක් සිදුකරන්නට වුවමනාවෙන් සිටිය යුතුය. අප කෙතරම් ජීවිත පෙරළියකට කැමැති වුවද එය ක්‍ෂණිකව සිදු වන්නේ නැත. එය සිදුවන්නේ පඩිපෙළක ආකාරයටය. මිනිස් පැවැත්ම සියලු අවස්ථාවලදී පරමෝත්තම දෙවිඳාණන්ගේ මහිමය අත්දැකීම සඳහා එසැවී ඇත. ඇතැමෙක් එය අවිශ්වාස කළ ද රහසින් එය පිළිගනිති. සියලු දුෂ්කරතා තුළ දේව කරුණාවට සංවේදී වන්නට යත්න දැරිය යුතුය. ඉවසීම තිබිය යුතුය. මිනිසාගේ අනියත ජීවිතය තුළ ස්ථිර ජීවිතයක මං පෙත් පෙන්වනුයේ දෙවිඳාණන් ය. එතුමෝ අපට දක්වන ආදරය මිනිස් මනසින් තේරුම් ගත නොහැකිය. බුද්ධියට ගෝචර වන්නේ නැත. මගේ කැමැත්ත ඉටු කරන්නෝ නිරන්තරයෙන් මාගේ දෙමාපියන් හා




සහෝදර සහෝදරියන් වෙති යනුවෙන් කිතු සමිඳුන් එදා පැවසීය. උන්වහන්සේගේ කැමැත්ත වන්නේ තමකම නසාගෙන කුරුසය රැගෙන උන්වහන්සේ පසුපස යාමයි. අප දෙවියන් වහන්සේට ආදරය කළ යුත්තේ උන්වහන්සේ අපගෙන් අපේක්ෂා කරන දේවල් ඉටු කිරීම තුළිනි.

එනම් එකිනෙකා සමඟ සම්බන්ධතා ජීවිතයක් ගොඩනගා ගනිමින්, ඔවුන්ගේ වැරැදි, දුබලතා සමඟ ඔවුන් පිළිගෙන ජීවත් වීමෙනි. දෙවියන් වහන්සේ අපගෙන් බලාපොරොත්තු වන්නේ අප තුළ ක්‍රිස්තුවරයෙක් බිහි කිරීමටය. ඒ සඳහා අපගේ දායකත්වය කෙබඳුද? යන්න විමසිල්ලට බඳුන් කළ යුත්තකි. ජීවිතය තුළ සිදුවන සියලු දේවල් තුළින් දෙවිඳුන්ගේ හඬ හඳුනා ගන්නට වෑයම් කළ යුතුය. පණිවුඩය තේරුම් ගන්නට උත්සුක විය යුතුය. දෙවියන් වහන්සේ මිනිසා මවා වදාළේ පරිපූර්ණ ආකාරයකටය. පරිපූර්ණ ලෝකයක් තුළය. එහෙත් ඔහුගේ පාපයන් හේතුකොට මෙම පරිපූර්ණත්වය බිඳ වැටිණි. අසම්පූර්ණ විය. මෙම ස්වභාවය වෙනස් කිරීම මනුෂ්‍ය අපගෙන් දෙවිඳාණෝ නිතර අපේක්ෂා කරති. ඒ සඳහා ජීවිත පෙරළියකට මුලපිරිය යුතුය. සහෝදරත්වය ජීව ගැන්විය යුතුය.

දෙවියන් වහන්සේගේ ආදරයට අප ප්‍රතිප්‍රේමය දැක්විය යුතුය. එය අපට වචනයෙන් මෙන්ම ක්‍රියාවෙන් ද කළ හැකිය. ක්‍රියාවෙන් කරන ප්‍රතිප්‍රේමය තුළ ගැඹුරු පරිත්‍යාගයක් දැකීමට පුළුවන. එමෙන්ම වචනයෙන්, ක්‍රියාවෙන් යන ද්විත්ව ආකාරය තුළින්ම අප දෙවිඳුන්ට මෙහෙ කරන්නට උනන්දු විය යුතුය. වත ඉරාගෙන නොව සිත ඉරාගෙන මා වෙත එන්නැයි එදා ක්‍රිස්තුන් වහන්සේ කළ ආයාචනය වත්මන් සමාජයට ද උචිතය. දේව ජීවනය අත් දකිමින් නිබඳව මානසික වශයෙන් පෙරළියක් ඇති කර ගැනීමට චතාරික කාලය යෝග්‍ය වේ.

එදා ශුද්ධවු පාවුළු තුමා ස්වකීය ජීවිතය තුළ අත්දුටු ජීවමාන අත්දැකීම පෙරටුකොට ගෙන නව ජීවිතයක් ආරම්භ කළේය. අපට ද ඒ සඳහා උත්ථාන වූ කිතු සමිඳුන්ආරාධනා කරයි. කිතු දහම තුළ පවතින ක්‍රියාකාරී ස්වභාවය, ගමනක ස්වභාවය සඳහා ගාමක බලවේගය වන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේය. උන්වහන්සේගේ ආදරය තුළ අප කුඩා දරුවන් මෙන් උන්වහන්සේ තුළ යැපෙන්නට උනන්දුවක් දැක්විය යුතුය.

දෙවියන් වහන්සේගේ දයා කරුණාව අත්දකිමින් ඇතුළාන්ත ප්‍රබෝධයකින් යුක්තව කිතු හිමියන්ගේ වැඩීමට අප පෙළ ගැසී සිටිය යුතුය. එනම් නිරන්තර ප්‍රාතිහාර්යයන් තුළින් දෙවිඳුන් කෙරෙහි අදහා ගන්නට යත්න දැරිය යුතුය. පාපය පිළිකුල් කොට සියලු අවස්ථාවලදී දෙවිඳුන්ගේ කැමැත්ත සොයන්නට එයට නතු වන්නට උත්සාහ දැරිය යුතුය. පෞද්ගලික ශුද්ධවන්තභාවයෙන් මිදී අන්‍යයන් ද හවුල් කර ගනිමින් ජීවිත වෙනසක් සිදු වන්නට කිතු සමිඳුන්ට මොහොතක් පාසා ඇරැයුම් කරමු.

**මලින්ත බෝපෙආරච්චි**
දළුගම, කැලණිය



# පාස්කුවේ සැබෑ අරුත කුමක් විය යුත්තේද?

**පාස්කුව යන්නෙහි සරල අර්ථය නම් එතෙරවීම යන්නය. ක්‍රිස්තුන් වහන්සේගේ දුක්විඳීම, මරණය හා උත්ථානය අලුත් ගිවිසුම තුළ අපි පාස්කුව ලෙස සමරන්නෙමු.**

සිහි කරන්නෙමු. අළු බදාදායින් ආරම්භ වී පාස්කු ඉරිදායින් නිමාවන දින 40 ක චතාරික කාලය තුළ කිතුනුවන් විවිධ භක්ති අභ්‍යාසවල නිරත වීම සුලභව සිදුවන්නේ ය. පාද නමස්කාරය, ශුද්ධවු පැය මෙන්ම දිව්‍ය පූජාවන් වලට වැඩි වශයෙන් සහභාගි වීම, කල්වාරි වන්දනා ගමන් යාම, පාපොච්චාරණය කිරීම. ඒ අතර විශේෂ වන්නේ ය. මීට අමතරව ප්‍රායෝගික වශයෙන් එක්වරු ශීලය රැකීම, ගොඩමස් වැළකීම, මාංශ ආහාර අනුභව නොකිරීම, ආදි කරුණු ද දැකගත හැකි වන්නේ ය. මේ අතර සුවිශේෂීම කාරණය නම් පුරුෂ පාර්ශ්වය මේ කාලය තුළ මත්පැනෙන් වැළකී සිටීමය. මේ තත්ත්වය ඉතාම ප්‍රශංසනීය අගය කළ යුතු තත්ත්වයකි. සත්‍යයෙන්ම අපගේ පව් උදෙසා දිවි පිදූ කිතු සමිඳාණන් වෙනුවෙන් කැපවීම, සාක්ෂි දැරීම හා ඒ වෙනුවෙන් උනන්දුවීම හෝ ජේසු සමිඳුන්ට කරන්නාවූ සැලකීමකි. ගෞරව කිරීමකි. පිළිගැනීමකි.

නමුත් මෙහි ඇති කණගාටුදායක තත්ත්වය නම් පාස්කු මංගල්‍යයෙන් පසු උපවාසයෙන් මිදී, සුපුරුදු පව්බර ජීවිතයට නැවතත් හුරුවීමයි. ඒ තුළ එතෙර වීමකට වඩා සිදුවනුයේ චතාරික කාලයේ පමණක් පව් වලින් වැළකී සිටීම නොවේද? එදා ජේසු සමිඳුන් කුරුසියේ දිවි පුදා ලබා දුන් ගැලවීම දින හතළිහකට පමණක් සීමා කිරීමෙන් සැබෑ කිතුනුකම ඉස්මතු වන්නේ ද?

**මිනිසුන්ට පෙනෙන ලෙස ලෝකයා ඉදිරියේ පුණ්‍ය ක්‍රියා කිරීමෙන් ඇතිවන්නාවූ ඵලය කුමක් වේද? එතුළින් සිදුවනුයේ අප අපවම රවටා ගැනීමක් විනා සත්‍ය එතෙර වීමක් ද යන්න කතෝලිකයන් විසින් දෙවරක් සිතා බැලිය යුතු වන්නේ ය.**

සත්‍යයෙන් ම කතෝලිකයන් ළඟා කරගත යුත්තේ භක්ති අභ්‍යාසවලට පමණක් සීමාවුණු ගැලවීමක් ද? නැතිනම් සැබෑ සිත් හැරීම තුළ ජීවිත වෙනසක් තුළින් ලබාගත් ගැළවීමක් ද?

මිනිසුන්ට පෙනෙන ලෙස ලෝකයා ඉදිරියේ පුන්‍ය ක්‍රියා කිරීමෙන් ඇතිවන්නාවූ ඵලය කුමක් වේද? එතුළින් සිදුවනුයේ අප අපවම රවටා ගැනීමක් විනා සත්‍ය එතෙර වීමක් ද යන්න කතෝලිකයන් විසින් දෙවරක් සිතා බැලිය යුතු වන්නේ ය. ඇත්තෙන්ම දැන්වත් අප කළ යුත්තේ වත ඉරා ගැනීමකට වඩා සිත ඉරාගෙන කිතු සමිඳාණන් වෙතට වඩ වඩාත් ළං වීමය. මරිය මග්දලේනා වෙනස් වූ ලෙසින් වෙනස් වීමය. සකේවුස් ළඟා කර ගත් ලෙසින් ගැළවීම ළඟාකර ගැනීමය.

කිතු සමිඳුන් මරණය පවරා ගත්තේ මිනිස් වර්ග යාගේ අපරාජිත ගැළවීම උදෙසාය. මේ හෙයින් ජීවිත අවබෝධයෙන් පාපයෙන් එතෙර වී වැරදි අඩුපාඩු එකක් හෝ නැවත මුළු ජීවිතය පුරාවටම නොකරන්නට අදිටන් කර ගනිමින් එය ප්‍රායෝගික ජීවිතයේ කොටසක් බවට පත්කර ගත යුත්තේය. ඒ තුළ කිතු සමිඳුන්ගේ මානව දයාව ප්‍රේමය බෙදා හදා ගැනීම වර්තමාන සමාජය තුළ සනිටුහන් කරන්නට හැකි නම් චතාරිකයේදී කිතු සමිඳුන්ගේ දුක් විඳීම තුළ ලබාගත් උත්ථානය අර්ථාන්විතව ළඟා කර ගැනීමක් වන්නේය.

**ජයන්ත පළිහවඩන**
රාගම



## සත්‍ය පියවරු 60 කොටස

**මහාචාර්ය ඇන්ටන් මීමන විසිනි**

### හර්මස් තුමාගේ එඬේරා - 4

**හතරවන දැක්ම**

- මෙමඟින් ඉතා බියකරු සහ අවලක්ෂණ මකරකුගේ ආකාරයෙන් ඉක්මනින්ම පැමිණීමට නියමිත ව්‍යසනයන් සහ පීඩනයන් පෙන්නුම් කරයි. මෙම මකරා අතිශයින්ම දරුණු වුවත් ශක්තිමත් විශ්වාසයකින් සන්නද්ධ වූ පුද්ගලයන්ට උගෙන් කිසිදු හානියක් සිදු නොවේ. මකරා පිටුපස ඉතා අගනා ඇඳුමින් සැරසුණු අලංකාර මනමාලියක ආකාරයෙන් ශුද්ධවූ සභාව පවතියි. එය සභාවට පක්ෂ පාතවූවන්ට ආනන්දයේ සහ අනාගත සදාකාලික සභාවට පිළිගනු ලැබීමේ සාක්ෂියකි.

**පස්වන දැක්ම** - මෙහිදී මනස්ථාපනයේ දේව දූතයා එඬේරකුගේ ආකාරයෙන් පැමිණේ. ඔව්හු පව් කමා කරගැනීමේ සමස්ත දූත කාර්යභාරයට අනුග්‍රහය දක්වා එය මෙහෙය වයි. ඔහු කිතුනු ඇදහිල්ල නැවත පණ ගන්වනවා මෙන්ම, ඔහුගේ අණ පනත් සහ උපමා කතා ප්‍රකාශ කරයි.

මෙම පස්වන දැක්මත් සමඟ මෙම කෘතියේ පළමුවන කොටස අවසන් වේ. මෙහි දෙවන කොටස සකස් වී ඇත්තේ අණ පනත් 12 කින් සහ උපමා කතා 10 කින් ය. මෙම අණ පනත් 12 ක්‍රිස්තියානි සදාචාරයේ සාරාංශයක් ඉදිරිපත් කරයි. එමඟින් තම පාප වලට මනස්ථාපනය වන්නා විසින් ගත කළ යුතු අලුත් ජීවිතයේ ස්වරූපය ඉදිරිපත් කර ඇත. එම අණ පනත් දොළහ මෙසේ ය.

1. විශ්වාසය, එනම් ස්වාමින් වහන්සේ කෙරෙහි ඇති ගරු බිය සහ තැන්පත් භාවය ය.
2. එක්සිත් භාවය සහ නිර්දෝෂීභාවය.
3. සත්‍යගරුක භාවය
4. පාරිශුද්ධභාවය සහ විවාහ බන්ධනයේ සහ වැන්දඹුභාවයේ හරියාකාර හැසිරීම
5. ඉවසීම සහ තරභාව හික්මවා ගැනීම
6. විශ්වාසය කළ යුතු තැනැත්තා සහ සැලකිල්ලට නොගත යුතු පුද්ගලයා හරියාකාරව හඳුනා ගැනීම. එනම් සාධාරණත්වයේ දේව දූතයා සහ පාපකාරිත්වයේ දේව දූතයා.
7. යමෙක් බිය විය යුතු කෙනා සහ නොබිය විය යුතු කෙනා. එනම් දෙවියන් වහන්සේ සහ යක්ෂයා
8. යමෙක් මඟහැරිය යුතු දේ සහ කළ යුතු දේ එනම් නපුර සහ යහපත
9. සැක සංකාවන් සම්බන්ධයෙන්
10. දුක්මුසු භාවය
11. බොරු දිවැසිවරු
12. යමෙකුගේ හදවතේ පවතින සියළුම ආකාරයේ නපුරු චේතනා සහමුලින්ම උදුරා දමා එය යහපතින් සහ ආනන්දයෙන් පිරවීම.

මෙම දෙවන කොටස අවසන් වන්නේ විධානයක් සමඟ අවවාදයක් සහ පොරොන්දුවක්ද දෙමින් ය. මෙම අණ පනත් අනුගමනය කිරීමට බියගුළු බවක් දක්වන ආත්මයට ඇති සුරක්ෂිතභාවය නම් දෙවියන් වහන්සේ කෙරෙහි දැඩි විශ්වාසයක් තබා ඉමහත් පරිශ්‍රමයකින් අරගල කිරීමයි. මෙම අණ පනත් ක්‍රියාත්මක කිරීමේදි දැඩි වීර්යයකින් එය කළ හැකිය. මෙම අණ පනත් වලට ස්ථිර ලෙසම ඇලී සිටින්නා සදාකාලික ජීවනයට නියත ලෙසම ළඟා වේ.

ලබන සතියට

ජන වන්දනාව

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

## දෙවැනි සතිය අඟහරුවාදා උදා යාම යැදුම

**පසුගිය සතිය හා සබැඳේ**

මාගේ පස්වනක් ප්‍රීතිය වන :
මෙය 5 වැනි වගන්තියේ දැක්වෙන ගීතිකාකරුගේ වේදනාත්මක අත්දැකීම් හා සංසන්දනාත්මකව දැක්වේ ("දුක් සයුරේ කිමිදෙන්නේ.... කෙඳිරි ගාමින් ලතවෙන්නේ") එමඟින් ඔහු අවධාරණය කරන්නේ දෙවි සමිඳුන් වෙතින් ලබන ගැලවීම පිළිබඳ ජ්වලිත බලාපොරොත්තුවයි.

### යැදුම

මහත් වූ විශ්වය මවා අප සැම සුරකින දෙවි පියාණන් වහන්ස, ඔබවහන්සේ අප අතර වැඩසිටිමින් අපට බලාපොරොත්තුව, ශක්තිය සහ ධෛර්යය නිරන්තරයෙන් දීම වෙනුවෙන් තුති පැසසුම් පුද කරමු. ජීවිතයේ අභාග්‍යයන් හා විපත්ති හමුවේ ඔබවහන්සේගේ අචල ප්‍රේමය හා රැකවරණය කෙරෙහි විශ්වාසය තබමින් දිවි මඟ යාමට අපට සරණය වුව මැනව.

### 65 වැනි ගීය

මෙම ගීය තුළ විවිධ තේමා රැසක් සංකලනය වී තිබුණත් එය මූලික වශයෙන් තුති පිදීමේ ගීයක් ලෙස වර්ග කළ හැකිය. මෙහි රචනයේ ක්‍රියාවලිය පිටුපස සංකීර්ණ වූ ඓතිහාසික හා සංස්කෘතික සාධක ඇති බව පැහැදිලිව පෙනේ. කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අනුව සිසිර ඍතුවේ වසරාන්ත තුති පිදීමක් හෝ වසර ආරම්භයේ වසන්ත ඍතුවේ තුති පිදීමක් හෝ දීර්ඝ නියඟයකට පසු වැසි ලැබීම වෙනුවෙන් තුති පිදීමක් හෝ මේ පසුබිමින් ඇති බව වියත්හු පෙන්වා දෙති. කෙසේ වෙතත් සකල විශ්වය ද මිනිස් ජාතීන් ද මවා පරිපාලනය කරන දෙවි සමිඳුන් වෙත උන්වහන්සේගේ ගැලවීමදායක ආසිරි වෙනුවෙන් තුතිපිදීමේ මූලික අරමුණ අපට නිරීක්ෂණය කළ හැකිය. සොබා දහම් අසිරිය විදහා දක්වන අපූර්ව සාහිත්‍යමය භාෂාව මෙහි විශේෂ ලක්ෂණයක් ලෙස දිස්වේ.

**ලේඛන සැලැස්ම :**

වගන්ති 1 - 5 :
තම ජනතාවගේ අයැදීම් අසා මිදීම සලසාලන දෙවි සමිඳාණන් පැසසීම.

වගන්ති 6 - 9 :
විශ්වය තුළින් ප්‍රකාශ වෙන මැවුම්කාරයාණන්ගේ ක්‍රියා වෙනුවෙන් තුති පැසසුම.

වගන්ති 10 - 13 :
වැසි වස්වා ජන දිවිය සුරකින දෙවි සමිඳුන් වෙත තුති පැසසුම් දීම.

### විග්‍රහය සහ අරුත :

(අ) වගන්ති 1-5:
මෙම කොටසින් ඊශ්‍රායෙල් ජන සංසයේ දෙවි සමිඳාණන් වෙතින් ලද සමාව හා අනෙකුත් වරප්‍රසාදයන් වෙනුවෙන් පිදෙන හෘදයාංගම කෘතඥතාව ප්‍රකාශ වේ. එය දෙවි සමිඳාණන් වහන්සේගේ ගැලවීමේ ක්‍රියාව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමක් සේ සැලකිය හැකිය.

පැසසුම් ගීතිය : ගිතිකා කතුවරයා ගීතය මාධ්‍යයක් කර ගනිමින් දෙවියන් වහන්සේගේ මහිමය ප්‍රකාශ කිරීමටත්, උන්වහන්සේගේ ක්‍රියාවන් ද ආශිර්වාදයන් ද තුළින් පිළිබිඹුවන උන්වහන්සේගේ උතුම් බව හා යහපත් බව ප්‍රකාශ කිරීමටත් පියවර ගනි.

බාරහාර ඔප්පු කරමු : අභාග්‍යසම්පන්න කාලයේ දෙවි සමිඳාණන් වහන්සේ වෙත කන්නලවු කරමින් යැදුම් ඔප්පු කිරීම ඇදහිල්ලේ ක්‍රියාවකි. ඒවා ඉටුවීම වෙනුවෙන් තුති පිදීමේ පොරොන්දු සපුරාලීම පුරාණ ගිවිසුමේ දේව ජනතාවගේ බැතියේ මූලික ලක්ෂණයක් විණි.

සියල්ලෝ : එය හෙබ්‍රෙව් පිටපතට අනුව "සියලු මාංශයෝ" යනුවෙන් දැක්වේ. ඉන් ලොව පැතිර පවතින මිනිස් සමාජයේ විශ්වීය බවත් මිනිස් බවේ සීමිත බවත් හැඟවේ.

අපේ පව්කම් අපට ඉසිලිය නොහැකිය : පාපය නිසා උරුමවන අනිටු විපාක පිළිබඳ සඳහනක් මින් පෙන්නුම් කෙරේ. එය දුක, වෙහෙස, වේදනාව ආදී ජීවිත යථාර්ථයන් කෙරෙහි යොමුවන මිනිස් ප්‍රතිචාරය කැටිකොට දක්වයි



ගීතාවලිය

ශුද්ධ ලියැවිලි වසර

**(44)**
**ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා**

(උත්. 3:14-24; 4:13). එහෙත් පශ්චාත්තාපය තුළින් දෙවියන් වහන්සේ වෙත යොමුවන්නන්ට සහනය හා සැනසීම ලැබෙන බව මෙහි අවධාරණය කෙරේ (ගීතා 32:1-5).

කොපමණ වාසනාවන්ත ද? : හෙබ්‍රෙව් පිටපතෙහි එන "අෂ්රේ" යන්නෙන් දෙවි සමිඳුන් වෙතින් උරුම වන "භාග්‍යවන්ත වීම" හැඟවෙයි. අඳමිටු තැනැත්තකු මනස්ථාප වෙමින් දෙවියන් වහන්සේ වෙතින් ලබන සමාව ඇත්තෙන්ම ගැඹුරු සොම්නසක අත්දැකීමකි (ගීතා 57:10-12). මෙහිදී තෝරා ගනු ලැබූ යන්නෙන් අදහස් කෙරෙන්නේ මනස්ථාපයේ අත්දැකීම තුළින් දෙවි සමිඳාණන්ට සමීපව සිටින අයයි.

ඉදිරියට...

---

ගරු හෙන්රි සිල්වා පියතුමා **70**

## පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍යය හා ගීතාවලිය



**පසුගිය සතිය හා සබැඳේ**

### ජීවන පසුතලය

ගීතයේ කතුවරයා සමිඳාණන් වහන්සේට වන්දනා කිරීම පිණිස දේව මාළිගයට ඇතුලුවන ලෙස වන්දනාකරුවන්ට හෝ එක්රැස්වූ ජනතාවට ඇරියුම් කරන පූජකවරයකු හෝ දිවැසිවරයකු බව පෙනේ. (1- 2,6) පාරාවෝගේ අයෝමය හස්තයෙන් තමන් ගලවා ගත් දෙවියන් වහන්සේ වෙත දක්වන විශ්වාසයේ මඳ බව මෙන්ම අවිශ්වාසවන්තකම පිළිබඳව ද හෙතෙම ජනතාවට අනතුරු අඟවයි. (7-11) මෙම තෙහිලි ගීතය, දේව වන්දනාව සඳහා දේව මාළිගාවට පිවිසීමේ දී භාවිත වූ ඇතුලුවීමේ ගීතයක් ලෙස සම්පාදනය වී ඇති බවක් පෙනේ.

### බෙදුම

- ★ වගන්ති 1 - 2: දේව වන්දනාව සඳහා සමිඳු අබියසට පැමිණෙන පිණිස කෙරෙන ඇරියුමකි.
- ★ වගන්ති 3 - 5 : වන්දනාව මෙන්ම ප්‍රශංසාව ද පුද කිරීමට හේතුව - සමිඳාණන් වහන්සේ සියල්ලෙහි මැවුම්කරුවාණන් වීම.
- ★ වගන්ති 6: සමිඳුනට වන්දනාව පුද කිරීම සඳහා වෙනත් අයුරකින් කෙරෙන ආරාධනයයි.
- ★ වගන්ති 7 අ : වන්දනාව පුද කිරීමට මුල්වන වෙනත් හේතු සාධකයක් වන ඉශ්රායෙල් ජනතාව හා සමඟ දෙවියන් වහන්සේ පිහිට වූ ගිවිසුම.
- ★ වගන්ති 7 ආ - 11: අතීතයෙන් ගෙන හැර දැක්වෙන අනතුරු ඇඟවීමක් හා පාඩමක්.

### විග්‍රහය

වගන්ති 1: "අප මිදූ පර්වතයාණන්" - ද්වීතිය නීති සංග්‍රහය 32, 15 ද සඳහන් වන මෙම යෙදුම. දෙවියන් වහන්සේගේ ආරක්ෂා සහිත ගැලැවීමේ ක්‍රියාකාරිත්වය සඳහා භාවිතා වන රූපකයකි. සැමවිටම, පර්වතය අවබෝධ කොටග ැනුනේ ස්ථාවරත්වයේ හා සුරක්ෂිත බවේ සලකුණක් ලෙසිනි. එබැවින් දෙවියන් වහන්සේ මත විශ්වාසය රැඳවීම කළ හැකිය. යුදමය අවස්ථාවල එල්ලවන දුනු ඊතල පහර වලින් අයකු ආරක්ෂා කිරීමේ හැකියාව පර්වත සතුවිය.

වගන්ති 3 : "උතුම් දේවාති දෙවිඳාණෝ වන සේක" - තෙහිලි ගී 47:2; 135:5 ද දක්නට ලැබෙන මෙම යෙදුම සඳහන් කර ඇත්තේ යාවේ දෙවියන් වහන්සේගේ ආධිපත්‍යය ජාතීන්ගේ දෙවිවරුන් පිට පවත්නා බව ප්‍රකාශ කිරීමට වඩා එකම වු දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය පිළිබිඹු කිරීමට ය.

වගන්ති 6 : "අප මැවූ සමිඳුන්" - දෙවියන් වහන්සේ මිනසා ඇතුලු විශ්වයේ මැවුම්කරුවාණන් බව පෙන්වීමට මෙන්ම තමන් වහන්සේගේම ජනතාව ලෙස ඉශ්රායෙල් සෙනඟ තෝරා ගැනීම අවධාරණය කිරීම සඳහා ද මෙම ව්‍යවහාරය යොදා ඇත.

වගන්ති 7 : "එතුමාණෝ අපේ දෙවිඳාණෝ ය; අප එතුමන්ගේ සෙනඟය;" - මෙය දෙවියන් වහන්සේ හා ඉශ්රායෙල් ජනතාව අතරවූ ගිවිසුමේ නිල පදමාලාව ය. (ද්වී. නී. 26:17-18; 29:12; ජෙරමියා 31:33; එසකියෙල් 36:28).

☛ ලබන සතියට

---

# සැබෑ මනස්ථාපයකින් යුතුව අර්ථාන්විත පාස්කු මංගල්‍යයක් කරා...

**අප සැවොම මේ වන විට පිවිස සිටින්නේ කතෝලික ජනවන්දනාවේ වැදගත් කාලපරිච්ඡේදයක් වෙතටයි. චතාරික සමය යනු ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සමස්ත ලෝකය උදෙසා තම ජීවිතය පූජාකර දෙකඩ වී තිබූ දෙවි - මිනිස් සබැඳියාව යළි එක්කර විජයග්‍රාහී උත්ථානය සැමරීමට සූදානම් වන කාලයයි. අළු බදාදායින් ආරම්භ වන චතාරිකය පුරා දින 40 කින් සමන්විතය. චතාරික සමය අපට අර්ථාන්විත පාස්කු මංගල්‍යයක් සඳහා සූදානම් කරයි.**



එහෙයින් චතාරික සමයේ ගැබ්ව ඇති තේරුම වන්නේ ද සැබෑ මනස්ථාපනයකින් යුතුව පාස්කු මංගල්‍යය සඳහා සූදානම් කිරීමයි "මනස්ථාපනය" යන වදන චතාරික සමය තුළ අපට නිතර අසන්නට ලැබෙන වදනකි ග්‍රීක භාෂාවේ "Metanoia" යන වදනින් ද අරුත් ගැන්වෙන්නේ මනස්ථාපයේ ඇති වැදගත්කමයි.

සැබෑ මනස්ථාපය යනු බාහිර හෝ ද්‍රව්‍යමය වටිනාකමට වඩා ඇතුළාන්ත ධර්මගුණයකි. මනස්ථාපයේ අරුත ජෝවෙල් දිවැසිවරයා දකින්නේ මෙලෙසයි "වත ඉරාගෙන නොව සිත ඉරාගෙන දෙවිඳුන් වෙත පැමිණීමයි. මන්ද සැබෑ මනස්ථාපයකින් යුතුව දෙවිඳුන් වෙත පැමිණීම තුළින් ශුද්ධවත්ව මෙන්ම මනස්ථාපී හදවතින් යුතුව වඩා අර්ථවත් පාස්කු මංගල්‍යයක් සැමරීමට හැකියාව ලැබීමයි. මනස්ථාපනය නැතහොත් පශ්චත්තාපය දෙස දේව ධාර්මික කෝණයෙන් බලන කල පැහැදිලි වන කාරණාවක් නම් එය හුදු පාපයට දුක්වීම පමණක් නොව එසේ පාපයට යොමු වීම තුළ දේව ආදරය හා සැලැස්ම ප්‍රතික්ෂේප කර සහෝදර සබැඳියාව පළුදුකර තම කැඳවීම අවතක්සේරු කර සාමය අහිමි කර ගැනීම පිළිබඳ කණගාටු වී එය ප්‍රතිස්ථාපනය කිරිමට දරන අවංක උත්සාහයකි. මෙය ශු. බයිබලයේ ඉතිහාසයේ මෙන්ම ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම් තුළ ද පැහැදිලි වන කරුණකි. (ජෝවෙල් 2:13), (ශු. ලූක් 15:11 -32)

තවද ක්‍රිස්තුන් වහන්සේ තමන් වහන්සේගේ සුබාරංචිය දේශනා කිරීමට පෙර සියලු දෙනාවම මනස්ථාපනයකට කැඳවයි "නියමිත මොහොත සම්පූර්ණ වී තිබේ. දෙවියන් වහන්සේගේ රාජ්‍යය ආසන්නය. මනස්ථාපනය වන්න. සුභ අස්න අදහා ගන්න (ශු. මාක් 1:15). මෙවර පාස්කුවත් පෙර වසරවල මෙන් යන්නට හරිනවාද? නැතිනම් ආධ්‍යාත්මික මට්ටමින් සිතා පාස්කු මංගල්‍යයට සූදානම් වෙමු ද? මෙවර පාස්කුව සැබෑ ආධ්‍යාත්මික එතෙර වීමක් තුළින් දේව ප්‍රේමය අත්දකින සැබෑ පාස්කුවක් සමරමු.

✍ දළුගම කැලණියේ
**වියානි පියුමන්ත පෙරේරා**

---

## ජේසු සමිඳුනි කමාවන්න මා හට

ජේසු මගේ ජේසු මට ආදර ජේසු
කමාවන්න මා හට
බරවූ කුරුසිය තුළ මා කළ පව්
තම ශ්‍රී උරහිසට ගත් මගේ ජේසු
පිලාතුගේ අසාධාරණ නඩුවට අසුවූයේ
මාගේ පාපවල කිළිටි බව නිසා නේද ?
කල්වාරිය යන ගමනේ තම
මව් හද පැරුනේ
මං නිසා නේ ද මගේ ජේසු
කුරුසියෙ බරින් නොව
ඔබ ඇද වැටුනේ
මගේ පාප බරිනි ජේසු
කස පහරවල්, ගල් මුගුරු, අපහාස,
චෝදනා ඔබගේ ගත සිත තුවාල
කෙරුවෙත් ඔබ මා මුදවාලන්නට නේද?
මගේ පාප නිසා ඔබේ උතුම් වූ ජීවිතය
පූජා කළේ පව් කමින් මා ගලවා
ලන්නයි ජේසු
සමාව යදිමි මා ඔබ කුරුසිය පාමුල
කඳුළු සලා ජේසු කමා වනු පාපි මා
සඳහා

✍ මාරවිල
**ඉෂාරා රොෂේනි**

---

## අවසරයි!

සෙනෙහසින් පිදූ... ඒ ලෙන්ගතුකම
හද රැඳි උණුසුම හා රැකවරණය
මුදු කරුනා ගුණ සංවේදී බව
මෙතෙක් දකින්නට බැරි වුනු මගෙ හද
ස්පර්ශ කළා.... මා ඔබ සිප ගත් විට

එළිය ලබන්නට ... පලවා ඝනඳුර
ජීවන ජලයෙන් පවස නිවන්නට
ඇරියුම් ලැබුවද දිනනට දිවි මඟ
සත්‍යයට කිසිදා සාක්ෂි දරනට නොහැකි වුණා....
අණුවන වූ මා හට

තණ්හා ආශා.... මේ ලොව වස්තුව
දූවිලි සම බව කියලා දුන්නද
රිදී තිහට මිළ කළ වටිනාකම
සදා අමිල වූ ඒ දෙවි පුතු වග පසක් කළා....
මල් උයනෙදි අප දෙනෙත් ගැටුනු විට

ගෝලයකු ලෙසින් ... මා තෝරාගෙන
යහමඟ පෙන්වා දුන් ගුරු දෙවිඳුට
දුන් දුක බැරිවෙයි මට වාවාගන්නට
එනිසා සමිඳුනි මුදුවට මගෙ ගෙල සිරකරලා......
සමුදෙන්නෙමි මගෙ පාපිවූ දිවියට

✍ දුම්මලදෙණියේ
**නෙලී ප්‍රනාන්දු**

# කන්‍ය මරිය තුමියට ගිනි (පිඹීම) තැබීම

**කතුතුමනි,**

කිතුනු ලොවේ ශ්‍රේෂ්ඨතම කාන්තාව ජේසු අම්මා හෙවත් කුමරි මරියාවන්ය. ඇයට සම කළහැකි කතක් එදා මෙදා තුර තවමත් මෙදියත පහලවී නැත. එය එදා මෙන් අදටත් හෙටටත් සහතිකය. කරුණු මෙසේ තිබියදී පසුගිය ජනවාරි මස 26 වැනි සෙනසුරාදා විශේෂ යාච්ඤා මෙහෙයකින් පසුව අවිස්සාවේල්ල සා. මරියා දේවස්ථානයේ 150 වන ජයන්තිය වෙනුවෙන් සා. මරියා පාසල ඉදිරිපිට ස්ථාපිත කරන ලද දේව මාතාවන්ගේ පිළිරුව පසුදින, එනම් ඉරුදින අළුයම කව්දෝ නොහඳුන පිරිසක් හෝ පුද්ගලයකු විසින් ගිනිතබා විනාශකර ඇත්තේ සියලුම කිතුනු හදවත් කම්පාවට ලක්කරමිනි.

මේ සබැඳිව සියලුම ජනමාධ්‍යයන් මුනිවත රක්කද පෙබරවාරි මස 03 වන දින මැසෙන්ජර් පුවත් පත "Mother Mary On Fire - Brings Tears to All" යනුවෙන් සහ ප්‍රදීපය පුවත්පතද "දේව මාතා ප්‍රතිමාව පුළුස්සා දමයි" යන්න ඡායාරූප සහිතව හෙළිකොට ඇත. අවිස්සාවේල්ල පුරපති වරයාගේ පූර්ණ අනුමැතියද සහිතව මෙම පිළිරුව ස්ථාපිත කළ බව ගරු මීසම් සේවක පියතුමාද පවසා ඇත. මේ සබැඳිව විවිධ පාර්ශවයන් දෙසට ඇඟිලි දික්වුවද තවමත් මෙම නිහීන ක්‍රියාව සම්බන්ධව කිසිවකු හෝ අත් අඩංගුවට ගෙන නොමැත.

කෙසේ වුවද ජාතිවාදයේ ගිනිදැල් නිවී යමින් තිබියදී ආගම් වාදයක් දිවයින පුරා ඇතිකිරීමට ඇතැම් අන්තවාදී කොටස් කැසකවන මෙවන් අවධියකදී කිතුනුවන් වන අපිද ඉතාමත් විමසිලිමත් විය යුත්තේ බුද්ධිමත්වය. මැණික් එබ්බවු රන්කඩු, ඉඩම් ආරවුල්, පන්සල් විහාර සතු දඹරන් බුදුපිළිම කොල්ලකෑම පිණිස භික්ෂූන් වහන්සේලා කපා කොටා



ඝාතනය කරමින්. උන්වහන්සේලා බැඳ තබමින්, බුදු පිළිම වලට අතින් පයින් පහර දෙන නරුමයින් සිටින දේශයක මරිය මවුන්ට ගිනිපිඹීමද තවත් සිද්ධියකි. එහෙත් බොහෝවිට මෙම මිනී මරුවන්, අපරාධකරුවන්, මංකොල්ල කරුවන් තවමත් නිදැල්ලේය.

19 වැනි සියවස් 50 දශකයේ මා හය වන ශ්‍රේණියේ අධ්‍යාපනය ලබමින් සිටියදී කුරුණෑගල දී "මෙන්න කන්නි මරියාගේ හැටි" නමින් පොත් පිංචකින් මරිය තුමියගේ චරිතයට ඉතා නින්දිත ලෙස පහර දෙමින් ප්‍රදේශය පුරා බෙදා හරින ලදි. මෙම අශෝභන ක්‍රියාව පිටුපස සිටියේ ධනවත් ව්‍යාපාරිකයෙකි. මෙම නිහීන ක්‍රියාව හෙළා දකිමින් කිතුනුවන් ප්‍රදේශය පුරා ශුද්ධවූ පැය, යාච්ඤා මෙහෙයයන් පවත්වන ලදි. කෙසේවුවද මෙම සිදුවීමෙන් ස්වල්ප කලකට පසු මෙම නිහීන ක්‍රියාවට මුල්වූ පුද්ගලයාගේ නිවස නායයාමකට ලක්ව නිවසේ සිටි සියලුම දෙනා මියගිය අතර ඉතුරු වූයේ ගසක කූඩුවක එල්ලා සිටි ගිරවා පමණි.

ලෝකයේ අස්සක් මුල්ලක් නැර කෝටි සංඛ්‍යාත ජනතාවගේ ගෞරවයට පාත්‍ර වෙමින් සැම දිනකම අසරණ සැදැහැවතුන් වෙනුවෙන් දෙවියන් වහන්සේ තුළ මැදිහත්වන මරි මවුන්ට විටින් විට ලෝකයේ විවිධ පෙදෙස්වල වෙසෙන අන්තවාදීන් විසින් මෙවන් අපහාස උපහාස සිදුකෙරෙන අතර ඒ සැම ක්‍රියාවකම ප්‍රතිඵලය වනුයේ එතුමිය පිළිබඳව වූ භක්තිය ගෞරවය තව තවත් වැඩිවීමය. කිතුනුවා අන්‍යයනට ගරහන්නේ නැත. ශාප කරන්නේ නැත. ඊර්ෂ්‍යා, වෛර කරන්නේ නැත. කිතුනු අපි නිතරම 'ප්‍රේමය' මුල්කරගෙන දිවි ගෙවන හෙයින් සීතාවකපුර මැණියනි කවුරුන් හෝ නොදැන කළ වරදට අපි සමාව දෙමු.

**එම්. ජෝ පාරිස්**

# වික්ටර් සිල්වා මහතාට තුති මල් මිටක් !

**කතුතුමනි,**

ලක් මැණියන්ට කිතුනු අපගේ දායාදය නමින්, 65 වන ජාතික නිදහස සැමරීම නිමිත්තෙන් වික්ටර් සිල්වා මහතා විසින් පල කර තිබූ ලිපියට ලක්වාසී සමස්ත කිතුනුවන්ගේ ප්‍රශංසාත්මක ස්තුතිය පිරිනැමිය යුතුය. එකී ලිපිය කියැවීමෙන් අප නොදත් බොහෝ කරුනු මෙන්ම අනවබෝධයෙන් සිටි කරුණු කාරණා රාශියක් අප සාක්ෂාත් කර ගත්තෙමු. ලිපිය ඉදිරිපත් කිරීමේදී කරුණු අවධාරණය කිරීම පිණිස දක්වා තිබූ විවිධ සටහන්, ලේඛන, ප්‍රකාශිත ග්‍රන්ථ, පොත්පත් හා පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තා පවා දින වකවානු සහිතව ඉදිරිපත් කර තිබුණි.

ලිපිය කියැවීමෙන් අනතුරුව ශ්‍රී ලාංකික කිතුනුවා යටත් විජිත යුගයේ පටන්ම නිදහස ලබාගැනීම තෙක් ලබාදුන් දායකත්වය අති මහත් බව හැඟුනි. මේ කරුණු කාරණා සත්‍යයන් බවට බහුතර බෞද්ධ විද්වතුන් පවා එය සාක්ෂාත් කර ඇත. නිදහස ලබාගැනීමේ සටනේදී කතෝලිකයන් ලංකා ජාතික සංගමයේ සභාපති ධූර හොබවමින් ශ්‍රී ලංකාවට නිදහස ලබාගැනීමට ප්‍රමුඛත්වයෙන්ම කටයුතු කර ඇති බැවින් කිතුනුවා තම ආගමට වඩා සමස්ත ශ්‍රී ලාංකික ජනතාවටම සේවය කර ඇති බව ප්‍රකාශිත වේ.

එලෙසම කිතුනුවා රටට, ජාතියට, භාෂාවට, සාහිත්‍යයට. කම්කරු ජනතාවට, සිනමාවට, සංගීතයට මෙන්ම, අධ්‍යාපන ක්ෂේත්‍රයට කර ඇති සේවය හා දැනටමත් කරගෙන යන්නාවූ සේවය පිළිබඳව කිතුනුවන් ලෙස අපටද සතුටු විය හැක.

කිතුනුවාද ශ්‍රී ලාංකිකයෙක්ය යන බව නොදැන කිතුනුවන් පිළිබඳ වපර ඇසින් බලන අල්පයක් තරම් වෙනත් ජාතීන් හා ආගමිකයන් දැනුවත් වීම පිණිස මෙකී ලිපිය ජාතික පුවත්පතක පලකර සිටිය යුතු බව මගේ හැඟීමයි. එලෙසින්ම අපගේ කතෝලික පාසල් දරුවන් විසින්ම කියවිය යුතු අධ්‍යාපනික වටිනාකමකින් යුතු මෙකී ලිපිය ඉදිරිපත් කළ වික්ටර් සිල්වා මහතාණන් හට සමස්ත කතෝලික ජනතාවගේ ප්‍රශංසාත්මක ගෞරවය හා ස්තුතිය පිරිනමමු.

**බර්නාඩ් විල්ෆ්‍රඩ් ප්‍රනාන්දු**
වාද්දුව

# දහම් පාසල ගැන වැඩි අවධානයක් යොමු කරමු

**කතුතුමනි,**

කතෝලික මීසමක ප්‍රමුඛ සේවාවක් වන්නේ දහම් පාසලයි. දහම් ගුරු පුහුණුව ලත් ගිහි - පැවිදි, ගුරුවර - ගුරුවරියෝ මීසමේ දූ දරුවනට දහම් දැනුම ලබා දීමට ඉමහත් වෙහෙසක් නිරතුරුව ලබති.

දහම් ගුරු සේවාව හුදෙක්ම ස්වෙච්ඡා සේවාවකි. එසේ වුවද එහි වටිනාකම කියා නිම කළ නොහැකිය. දරුවාගේ අධ්‍යාත්මික ජීවිතයට තිරසාර අඩිතාලමක් වැටෙන්නේ දහම් පාසලේ ආභාෂයෙනි. මෙතරම්



අනගි දහම් පාසලේ වටිනාකම සමහර දෙමාපියෝ නොදනිති. එය සැබැවින්ම අවාසනාවකි. දරුවන් සතිපතා නොකඩවා දහම් පාසලට එවීම කතෝලික දෙමාපියන්ගේ පරම යුතුකමකි.

බොහෝ දෙව්මැඳුරු ආශ්‍රිතව දහම් පාසලට පෙරාතුව ඉරුදින දිව්‍ය පූජාව පැවැත්වේ. එහෙත් සමහර දෙමාපියන්, තම දරුවන් එවන්නේ දිව්‍ය පූජාව අවසාන වී දහම් පාසල ආරම්භ වන වෙලාවටය. දිව්‍ය පූජාව දහම් පාසලේම කොටසක් බව මීසමේ ගරු පියතුමන්ලා පුන පුනා පෙන්වා දුන්නද සමහරු ඒ පිළිබඳව තම අවධානය යොමු නොකරති.

දහම් පාසලේ ඉගෙන, ගන්නා දේ ගැන සමහර දෙමාපියන් විමසිලිමත් වන්නේ නැත. ඉඳහිට දහම් ගුරු භවතුන් මුණගැසී දරුවාගේ දහම් පාසල් අධ්‍යාපනය ගැන විමසුම් කිරීම ද හොඳ කතෝලික දෙමාපියන්ගේ යුතුකමකි.

දෙමාපියන් හැටියට දහම් ගුරු භවතුන්ට ගරු කරමු; දරුවන්ටද ගරු කරන්නට උගන්වමු. අනාගත ජීවිතය අධ්‍යාත්මිකව ලස්සන කරන දහම් පාසල පිළිබඳව දෙමාපියන් වශයෙන් වඩා හොඳ අවධානයක් යොමු කරමු.

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි**
පේරලන්ද

# සැබෑ නායකත්වය යනු කුමක්ද?

**කතුතුමනි,**

ජීවත්වීම සඳහා දැඩි ජීවන අරගලයක යෙදෙන ජනතාවක් දිවි ගෙවන මේ කුඩා දිවයිනේ අද දවසේ සැබෑ නායකත්වය හඳුනා ගැනීම යනු මහත් ගැටලුවකි. ජනතාවට බොරු බේගල් පවසමින් ඔවුන් ගැන කිඹුල් කඳුළු හෙලමින් දේශපාලනයේ යෙදී සිටින වැඩි දෙනෙක් අද ගත කරනුයේ දෙබිඩි ජීවිත රටාවකි.

තරු පහේ සුපිරි හෝටල් වල රාත්‍රී සමාජ ශාලාවල එක රැයකට මිලියන ගණනින් රුපියල් සත වියදම් කරන නායකයෝ හා ඔවුනගේ දරුවෝ අද අප සමාජයේ බොහෝ සිටිති. එවැනි අයම ජනතාවගේ දුක වේදනාව ගැන කතා කිරීම විහිළුවට කරුණකි.

සැබෑ නායකත්වය යනු කොයි වගේද? කියා ලොවට පෙන්වා දුන්නේ අප ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේය. උන්වහන්සේ තම ගෝලයන්ගේ පවා දෙපා සෝදමින් සැබෑ නායකයා යනු අන් අයගේ සේවකයා විය යුතු බව ආදර්ශමත්ව නිහතමානීව පෙන්වා දුන් සේක.

නායකත්වය ගැන පෙන්වා දීමේදී පොළවේ පය ගසා දිවි ගෙවන සැබෑ මානවවාදී වටිනා නායකයකු පිළිබඳ පුවතක් පසුගියදා අපට අසන්නට ලැබුණි. එය සැකෙවින් මෙසේය. එතුමා උරුගුවේ රාජ්‍යයේ 'ජෝස් මුජිකා' නම් 77 වියැති ජනාධිපතිවරයාය. ඔහු ප්‍රසිද්ධියට පත්වී සිටින්නේ වඩාත් ත්‍යාගශීලී ජනාධිපතිවරයා ලෙසය. එතුමා සිය වැටුපෙන් 90% ක්ම ජනතාවගේ සුභ සාධන කටයුතු සඳහා යොදවයි. ඔහු තවමත් ජීවත් වන්නේ ඔහුගේ බිරිඳට අයත් ගොවි පලකය. ඔහුගේ මාසික ආදායම ඩොලර් 12500 ක් වන අතර වෙනත් ජනාධිපතිවරුන් උපයන මාසික ආදායම හා සලකන කල එය ඉතාම සුළු වැටුපකි. නමුත් එයින් ද ඔහු තම වියදම් සඳහා තබා ගන්නේ ඩොලර් 1250 ක් පමණි. ඉතිරි 90% ම ජනතාව වෙනුවෙන් වෙන් කරයි.

ඔහුට කිසිදු බැංකු ගිණුමක් නැති අතර ඔහු සතුව ඇති වටිනාම දේ වන්නේ ඉතා පැරණි 'වොක්ස් වැගන්' (Volks wagn) කාරය පමණි. මෙවැනි සරල සැබෑ නායකයින් ගැන අසන්නට පවා ලැබීම සතුටට කරුණක් නොවේද? අද දවසේ කිතු තුමන්ගේ ආශිර්වාදය ලැබෙන්නේ මෙවැනි දේව රාජ්‍යයේ වටිනාකම් තුළ දිරි ගෙවන අවංක සැබෑ නායකයන්ටය.

**ලූෂන් ෂර්ලි එඩ්වඩ්**
ගෝනවල

# දේවස්ථානයේ ගරුත්වය රකිමු

**කතුතුමනි,**

දේවස්ථානයේ පූජනීය බව රැකුමට හා නිරන්තර භක්ති අභ්‍යාසයන්ට හානි පමුණුවන දෑ ඉවත් කිරීම කාලෝචිත පියවරකි. ජේසුතුමා දේවමාලිගය තුළ වෙළඳාම් කරමින් සිටි වෙළඳුන් පන්නා දැමීම සිහිපත් වේ. ඒ අනුව මුදල් හෝ ආධාර ලබාගැනීමේ අටියෙන් දෙව්මැඳුර තුළ මෙන්ම එම බිමේද එවැනි කටයුතු නතර කළ යුතුය. දේවස්ථානයට පිවිස වන්දනාමාන කිරීමට අවකාශ තිබියදී එම බිමේම ප්‍රතිමා තබා ඒ අසල කානික්ක කැට තැබීමද සුදුසු නොවේ.

දෙව්මැඳුරු බිමෙන් බැහැරව තැනින් තැන පාරවල් අද්දර ප්‍රතිමා ඉදිකර එම ශුද්ධවරයාට හෝ ශුද්ධවරියට අගෞරව කිරීම අශෝභන ක්‍රියාවකි. ගමේ හැමතැනම සුරුවම් තබා මංගල්‍ය සඳහා ඒ ඒ ස්ථානවල කොඩිගස එසවීමද විකාරයකි. කොඩිගස එසවීමේ අරුත විකෘතිකර ගැනීමකි. ඒ හැමතැනකම කානික්ක පෙට්ටිය. ඒ ආශ්‍රය කරගෙන සිදුවන සොරකම් හා අක්‍රමිකතාද වාර්තාවේ. ප්‍රදර්ශනය සඳහා පාර අසල ප්‍රතිමා ඉදිකිරීම අනවශ්‍ය ගැටුම් සඳහා අතවැනීමකි. සුරුවම් තැබීමෙන් හෝ එසේ තබන ඒවා කඩාබිඳ දැමීමෙන් දහම සුරු කෙන්නේවත් නැසෙන්නේවත් නැත. දේවස්ථානයට යාමට අතුරු පාරක් ඇතිවිට පමණක් එම පාරේ ප්‍රධාන පාරට සම්බන්ධව වන ස්ථානයේ අදාළ දේවස්ථානය කැප කර ඇති සාන්තුවරයාගේ පිළිරුවක් ඉදිකිරීම ජනතාවට දේවස්ථානය ගැන සංනිවේදනය කිරීමට සුදුසු සංකේතවත් කටයුත්තකි.

භක්ති අභ්‍යාස හා නිහඬ යැදුම් වලදී බැතිමතුන්ට හානි කරන බාධා පමුණුවන ජංගම දුරකථන නාදකිරීම් ගැන දේවස්ථාන ඉදිරිපිට කොතෙක් දැන්වීම් පුවරු සවි කළත් ප්‍රයෝජනයක් නැත. ඇතැමුන් ලැබෙන ඇමතුම් සඳහා දේවස්ථානය තුළදී පිළිතුරු දෙන හෙයින් අනෙක් බැතිමතුන්ගේ දැහැන්ගතවීමට කරන්නේ බාධා කිරීමකි. දේවස්ථානයට පැමිණෙනවිට තම තමන්ගේ ජංගම දුරකථන ක්‍රියා විරහිත කර පැමිණෙන ලෙසට දැනුම් දිය යුතුය. මෙය උල්ලංඝනය කර තමන්ගේ යැදීමට බාධා පමුණුවන අයට එරෙහි වීමට බැතුමතුන්ට ආත්ම ශක්තියක් තිබිය යුතුය. එසේ කිරීම දේවස්ථානයේ දුරකථන භාවිත කිරීම අධෛර්ය කිරීමකි.

දහම් පාසල්, දේවස්ථාන බිමේ පවත්වාගෙන යෑම අධෛර්යවත් කිරීම සඳහා දේවස්ථාන බිමෙන් පිටත ඒවා ඉදිකිරීමට දේවස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීමට දෙන ප්‍රමුඛතාවයෙන් දෙවැනි තැන ලබාදිය යුතුය. ඒ සඳහා සභාව විසින් ඒ ඒ මීසම් සඳහා ක්‍රියාකාරි සැලැසුම් හා වැඩසටහන් ලබාගත යුතුය. පාසල් රජයට ගැනීමේදී සභාව සතු අද නිශ්කාර්ය වත්කමක් බවට පත්වූ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කර දහම් පාසල් හා රැස්වීම් සාකච්චා තැබීමට යොදාගත හැකිය.


**ඇල්ප්‍රඩ් නෙල්සන්**
දඬුගම



# “සුදතුම් පිය වරණ දැහැන”ට එක්වන කාදිනල් හිමිපාණෝ

## සසුන් නීතිය අනුව 2013 පෙබරවාරි 28 දාට වයස අවුරුදු 80 ට අඩු කාදිනල් හිමිපාණෝ




අතිඋතුම් ගියොවන්නි කාදිනල් බැටිස්ටා රී හිමි - 1934 ජන. 30 - ඉතාලිය

අතිඋතුම් තාර්සීසියෝ කාදිනල් බර්ටෝන් හිමි - 1934 දෙසැ. 02 - ඉතාලිය

අතිඋතුම් ඇන්තෝනියස් කාදිනල් නාජුයිබ් හිමි - 1935 මාර්තු 18 - ඊජිප්තුව

අතිඋතුම් බෙචාරා බෞට්‍රස් කාදිනල් රායි හිමි - 1940 පෙබ. 25 - ලෙබනනය

අතිඋතුම් ගෝඩ් ප්‍රයිඩ් කාදිනල් ඩැනීල්ස් හිමි - 1933 ජූනි 05 - බෙල්ජියම

අතිඋතුම් ජෝකීම් කාදිනල් මෙයිස්නර් හිමි - 1933 දෙසැ. 25 - ජර්මනිය

අතිඋතුම් නිකලස් ඩි ජීසස් ලෝපෙස් කාදිනල් රොඩ්රිගස් හිමි - 1936 ඔක්. 31 - දොමිනිකන් ජනරජය

අතිඋතුම් රොජර් මයිකල් කාදිනල් මහෝනි - 1936 පෙබ. 27 - ඇ.එ. ජනපදය

අතිඋතුම් ජූලියස් රියාදි කාදිනල් ධර්මට්මාජා හිමි - 1934 දෙසැ. 20 ඉන්දුනීසියාව

අතිඋතුම් ජායිමේ ලූකස් කාදිනල් ඔට්ගා අලාමිනෝ - 1936 ඔක්. 18 - කියුබාව

අතිඋතුම් ජීන් ක්ලෝඩ් කාදිනල් ටූකෝට් හිමි - 1936 ජූනි 26 - කැනඩාව

අතිඋතුම් වින්කෝ කාදිනල් පුල්ජි හිමි - 1945 සැප්. 8 - බොස්නියා හා හර්සිගොවිනා

අතිඋතුම් ජුවාම් කාදිනල් සැන්ඩෝවල් ඉනිග්ගායුස් හිමි - 1933 මාර්තු 28 - මෙක්සිකෝව

අතිඋතුම් ඇන්ටෝනියෝ මාරියා රොකෝ කාදිනල් වැරේලා හිමි - 1936 අගෝ. 24 - ස්පාඤ්ඤය

අතිඋතුම් ඩියෝනිජි කාදිනල් ටෙට්ටමාන්සි හිමි - 1934 මාර්තු 14 - ඉතාලිය

අතිඋතුම් පොලිකාෆ් කාදිනල් පෙන්ගෙ ් හිමි - 1944 අගෝ. 05 - ටැන්සානියාව

අතිඋතුම් ක්‍රිස්ටෝෆ් කාදිනල් ෂෝංබෝං හිමි - 1945 ජන. 22 - ඔස්ත්‍රියාව

අතිඋතුම් නෝබෙට්ටෝ රිවේරා කාදිනල් කැරීරා හිමි - 1942 ජූනි 06 - මෙක්සිකෝව

අතිඋතුම් ප්‍රැන්සිස් ඉයුජීන් කාදිනල් ජෝර්ජ් - 1937 ජන. 16 - ඇ.එ. ජනපදය

අතිඋතුම් ඇන්ඩ්‍රේ කාදිනල් වින්ග ්ට්‍රොයිස් හිමි - 1942 නොවැ. 07 - ප්‍රංශය

අතිඋතුම් සෙනෝන් කාදිනල් ග්‍රොචෝල්ස්කි හිමි - 1939 ඔක්. 11 - පෝලන්තය

අතිඋතුම් ක්‍රිසෙන්සියෝ කාදිනල් සෙපේ හිමි - 1943 ජූනි 02 - ඉතාලිය

අතිඋතුම් වෝල්ටර් කාදිනල් කැස්පර් හිමි - 1933 මාර්තු 05 - ජර්මනියි

අතිඋතුම් අයිවන් කාදිනල් ඩයස් හිමි - 1936 අප්‍රේ. 14 - ඉන්දියාව

අතිඋතුම් ජෙරල්ඩෝ මජෙල්ලා කාදිනල් ඇග්නේලෝ - 1933 ඔක්. 19 - බ්‍රසීලය

අතිඋතුම් ඇන්ජලෝ කාදිනල් බාග්නාස්කෝ හිමි - 1943 පෙබ. 14 - ඉතාලිය

අතිඋතුම් ඕඩ්‍රිස් ජුඕසාස් කාදිනල් බැකීස් හිමි - 1937 පෙබ. 01 - ලිතුවේනියාව

අතිඋතුම් ප්‍රැන්සිස්කෝ ජාවියර් කාදිනල් එරසුරිස් ඔස්සා හිමි - 1933 සැප්. 05 - චිලී

අතිඋතුම් ජූලියෝ ටෙරසාස් කාදිනල් සැන්ඩෝවාල් හිමි - 1936 මාර්තු 07 - බොලිවියාව

අතිඋතුම් විල්ෆ්‍රිඩ් ෆොක්ස් කාදිනල් නේපියර් හිමි - 1941 මාර්තු 08 - දකුණු අප්‍රිකාව

අතිඋතුම් ඔස්කා ඇන්ඩ්‍රීස් කාදිනල් රොඩ්රිගස් මැරාඩියාගා - 1942 දෙසැ. 29 - හොන්ඩුරාස්

අතිඋතුම් ජුවාන් ලුවිස් සිප්‍රියානි කාදිනල් ත්‍රෝන් හිමි - 1943 දෙසැ. 28 - පේරූ

අතිඋතුම් ක්ලෝඩියෝ කාදිනල් හියුම්ස් හිමි - 1934 අගෝ. 08 - බ්‍රසීලය

අතිඋතුම් ඇන්තනි ඔලුබුන්මි කාදිනල් ඔකෝජි හිමි - 1936 ජූනි 16 - නයිජීරියාව

අතිඋතුම් ජෝස් ඩා කෘෘස් කාදිනල් පොලිකාර්පෝ හිමි - 1936 පෙබ. 26 - පෘතුගාලය

අතිඋතුම් සෙවරිනෝ කාදිනල් පොලෙට්ටෝ හිමි - 1933 මාර්තු 18 - ඉතාලිය

අතිඋතුම් කාල් කාදිනල් ලේමන් හිමි - 1936 මැයි 16 - ජර්මනිය

අතිඋතුම් ඇන්ජලෝ කාදිනල් ස්කෝලා හිමි - 1941 නොවැ. 07 - ඉතාලිය

අතිඋතුම් ටෙලස්පෝ ප්ලැසිඩස් කාදිනල් ටෝප්පෝ හිමි - 1939 ඔක්. 15 - ඉන්දියාව

අතිඋතුම් ගේබ්‍රියල් සුබීර් කාදිනල් වාකෝ හිමි - 1941 පෙබ. 27 - සුඩානය

අතිඋතුම් කාලෝස් අමිගෝ කාදිනල් වැලීගෙ ් හිමි - 1934 අගෝ. 23 - ස්පාඤ්ඤය

අතිඋතුම් ජස්ටින් ප්‍රැන්සිස් කාදිනල් රිගාලි හිමි - 1935 අප්‍රේල් 19 - ඇ.එ. ජනපදය

අතිඋතුම් කීත් මයිකල් පැට්‍රික් කාදිනල් ඕබ්‍රයන් හිමි - 1938 මාර්තු 17 - ස්කොට්ලන්තය

අතිඋතුම් එන්නියෝ කාදිනල් ඇන්ටොනෙල්ලි හිමි - 1936 නොවැ. 18 - ඉතාලිය

අතිඋතුම් පීටර් කොඩ්වෝ කාදිනල් ටර්ක්සන් හිමි - 1948 ඔක්. 11 - ඝානාව

අතිඋතුම් ජෝර්ජ් කාදිනල් පෙල් හිමි - 1941 අප්‍රේල් 08 - ඔස්ට්‍රේලියාව

අතිඋතුම් ජෝසිප් කාදිනල් බොසැනික් හිමි - 1949 මාර්තු 20 - ක්‍රොයේසියාව

අතිඋතුම් ජීන් බැප්ටිස්ට් කාදිනල් පාම්මින්මෑන් හිමි - 1934 මාර්තු 05 - වියට්නාමය

අතිඋතුම් පිලිප්පි කාදිනල් බාබරින් 1950 ඔක් 17 - ප්‍රංශය

අතිඋතුම් පීටර් කාදිනල් එර්ඩෝ හිමි - 1952 ජූනි 25 - හංගේරියාව

අතිඋතුම් මාර්ක් කාදිනල් ඔයිලට් හිමි - 1944 ජූනි 08 - කැනඩාව

අතිඋතුම් අගෝස්ටිනෝ කාදිනල් වැල්ලිනි - 1940 අප්‍රේල් 17 - ඉතාලිය

අතිඋතුම් ජෝර්ජ් ලිබරටෝ කාදිනල් ඔරෝසා සවිනෝ හිමි - 1942 අගෝ. 28 - වැනිසියුලාව

අතිඋතුම් ජීන්පියර් කාදිනල් රිකාඩ් හිමි - 1944 සැප්. 25 - ප්‍රංශය

අතිඋතුම් ඇන්ටෝනියෝ කැනිසාරිස් කාදිනල් ලියෝවරා - 1945 ඔක්. 10 - ස්පාඤ්ඤය


අතිඋතුම් සීන් පැට්‍රික් කාදිනල් ඕමල්ලි හිමි - 1944 ජූනි 29 - ඇ.එ. ජනපදය


අතිඋතුම් ස්ටැනිස්ලෝ කාදිනල් ඩිවීස් හිමි - 1939 අප්‍රේල් 27 - පෝලන්තය


අතිඋතුම් කාලෝ කාදිනල් කැෆ්ෆාරා හිමි - 1938 ජූනි 01 - ඉතාලිය


අතිඋතුම් සීන් බැප්ටිස්ට් කාදිනල් බ්‍රැඩී හිමි - 1939 අගෝ. 16 - අයර්ලන්තය

අතිඋතුම් ලුවිස් මාර්ටිනස් කාදිනල් සිස්ටැච් හිමි - 1937 අප්‍රේල් 29 - ස්පාඤ්ඤය


අතිඋතුම් ඒඩ්‍රියන් සා කාදිනල් තියඩෝර් හිමි - 1936 නොවැ. 28 - සෙනගාලය



අතිඋතුම් ඔස්වල්ඩ් කාදිනල් ග්‍රාසියාස් හිමි -1944 දෙසැ. 24 - ඉන්දියාව



අතිඋතුම් ප්‍රැන්සිස්කෝ රෝබ්ලස් කාදිනල් ඕටේගා හිමි - 1949 මාර්තු 02 -



අතිඋතුම් ඩැනියල් නිකලස් කාදිනල් ඩිනාර්ඩෝ හිමි - 1949 මැයි 23 - ඇ.එ. ජනපදය



අතිඋතුම් ඔඩිලෝ පේඩ්රෝ කාදිනල් සියර් හිමි - 1949 සැප්. 21 - බ්‍රසීලය



අතිඋතුම් ජෝන් කාදිනල් ඡු - 1944 - කෙන්යාව


අතිඋතුම් රාවුල් කාදිනල් එඩුවාඩු වේලා චිරිබෝගා හිමි - 1934 ජන. - ඉක්වදෝරේ


අතිඋතුම් ලෝරන්ට් මොන්සෙන්ග්වෝ කාදිනල් පාසින්යා හිමි - 1939 ඔක්. 07 - කොංගෝ ජනරජය



අතිඋතුම් පාවුලෝක් කාදිනල් රෝමියෝ හිමි - 1938 පෙබ. 20 - ඉතාලිය



අතිඋතුම් ඩොනල්ඩ් විලියම් කාදිනල් වුර්ල් හිමි - 1940 නොවැ. 12 - ඇ.එ. ජනපදය



අතිඋතුම් රේමුන්ඩෝ ඩැමැස්සිනෝ කාදිනල් අසීස් හිමි - 1937 පෙබ. 15 - බ්‍රසීලය


අතිඋතුම් කාසිමීර්ස් කාදිනල් නයිස් හිමි - 1950 පෙබ. 01 - පෝලන්තය



අතිඋතුම් පටබැඳිගේ දොන් ඇල්බට් මැල්කම් කාදිනල් රංජිත් හිමි - 1947 නොවැ. 15 - ශ්‍රී ලංකාව


අතිඋතුම් රේන්හාඩ් කාදිනල් මාර්ක්ස් හිමි - 1953 සැප්. 21 - ජර්මනිය


අතිඋතුම් ජෝර්ජ් කාදිනල් ඇලන්චෙරි හිමි - 1945 අප්‍රේල් 19 - ඉන්දියාව


අතිඋතුම් තෝමස් ක්‍රිස්ටෝපර් කාදිනල් කොලින්ස් හිමි - 1947 ජන. 16 - කැනඩාව


අතිඋතුම් ඩොමිනික් ජැරෝස්ලාවු කාදිනල් ඩුකා හිමි - 1943 අප්‍රේල් 26 - චෙක් ජනරජය



අතිඋතුම් විලෙම් ජාකොබුස් කාදිනල් රීක් හිමි - 1953 ජූනි 22 - නෙදර්ලන්තය


අතිඋතුම් ගුසෙප්පි කාදිනල් බිටෝරි හිමි - 1947 පෙබ. 25 - ඉතාලිය



අතිඋතුම් තිමති මයිකල් කාදිනල් ඩොලන් හිමි - 1950 පෙබ. 06 - ඇ.එ. ජනපදය


අතිඋතුම් රේනිය මරියා කාදිනල් වුල්කි හිමි - 1956 අගෝ. 18 - ජර්මනිය


අතිඋතුම් ජෝන් කාදිනල් ටොංහොං හිමි - 1939 ජූලි 31 - චීන ජනරජය



අතිඋතුම් බැසිලියස් ක්ලීමිස් කාදිනල් තොට්ටුන්කාල් හිමි - 1959 ජූනි 15 - ඉන්දියාව



අතිඋතුම් ජෝන් ඔලෝරුන්ෆෙමි කාදිනල් ඔනායිකාන් හිමි - 1944 ජන. 29 - නයිජීරියාව


අතිඋතුම් රූබන් කාදිනල් සැලේස ගෝමස් හිමි - 1942 සැප්. 22 - කොලොම්බියාව


අතිඋතුම් ලුවිස් ඇන්ටෝනියෝ ගොමික් කාදිනල් ටාගල් හිමි - 1957 ජූනි 21 - පිලිපීනය


අතිඋතුම් ජීන් ලුවිස් කාදිනල් ටවුරන් හිමි - 1943 අප්‍රේල් 03 - ප්‍රංශය



අතිඋතුම් ඇට්ලිලියෝ කාදිනල් නිකෝරා හිමි - 1937 මාර්තු 16 - ඉතාලිය



අතිඋතුම් විලියම් ජෝසප් කාදිනල් ලෙවාඩා හිමි - 1936 ජූනි 15 - ඇ.එ. ජනපදය


අතිඋතුම් ෆ්‍රෑන්ක් කාදිනල් රෝඩ් හිමි - 1934 සැප්. 23 - ස්ලෝවේනියාව



අතිඋතුම් ලියනාඩෝ කාදිනල් සැන්ඩ්‍රි හිමි - 1943 නොවැ. 18 - ආජන්ටිනාව


අතිඋතුම් පියෝවන්නි කාදිනල් ලාජෝලෝ හිමි - 1935 ජන. 03 - ඉතාලිය


අතිඋතුම් පෝල් ජෝසප් කාදිනල් කෝඩ්ස් හිමි - 1934 සැප්. 05 - ජර්මනිය


අතිඋතුම් ඇන්ජලෝ කාදිනල් කොමස්ට්‍රි හිමි - 1943 සැප්. 17 - ඉතාලිය


අතිඋතුම් ස්ටැනිස්ලෝ කාදිනල් රිල්කෝ හිමි - 1945 ජූලි 04 - පෝලන්තය


අතිඋතුම් රාෆායෙල් කාදිනල් ෆරිනා හිමි - 1933 සැප්. 24 - ඉතාලිය


අතිඋතුම් ඇන්ජලෝ කාදිනල් අමාටෝ හිමි - 1938 ජූනි 08 - ඉතාලිය


අතිඋතුම් රොබට් කාදිනල් සාරා හිමි - 1945 ජූනි 15 - ගයනාව


අතිඋතුම් ප්‍රැන්සිස්කෝ කාදිනල් මොන්ටිසි හිමි - 1934 මැයි 28 - ඉතාලිය


අතිඋතුම් රේමන්ඩ් ලියෝ කාදිනල් බර්ක් හිමි - 1948 ජූනි 30 - ඇ.එ. ජනපදය

අතිඋතුම් කර්ට් කාදිනල් කෝච් හිමි - 1950 මාර්තු 15 - ස්විස්ටර්ලන්තය

අතිඋතුම් පාවුලෝ කාදිනල් සාර්ඩි හිමි - 1934 සැප්. 01 - ඉතාලිය

අතිඋතුම් මවුරෝ කාදිනල් පියාසෙන්සා හිමි - 1944 සැප්. 15 - ඉතාලිය

අතිඋතුම් වෙලාසියෝ කාදිනල් ඩි පාඕලිස් හිමි - 1935 සැප්. 19 - ඉතාලිය

අතිඋතුම් ගියෙන්ප්‍රැන්කෝ කාදිනල් රවාසි හිමි - 1942 ඔක්. 18 - ඉතාලිය

අතිඋතුම් ප්‍රනාන්ඩු කාදිනල් ෆයිලෝනි හිමි - 1946 අප්‍රේල් 15 - ඉතාලිය

අතිඋතුම් මැනුවල් මොන්ටෙරෝ කාදිනල් ඩි කැස්ත්‍රෝ හිමි - 1938 මාර්තු 29 - පෘතුගාලය

අතිඋතුම් සැන්ටෝස් ඇබ්‍රිල් කාදිනල් කැස්ටෙල්ලෝ හිමි - 1935 සැප්. 21 - ස්පාඤ්ඤය

අතිඋතුම් ඇන්ටෝනියෝ මාරියා කාදිනල් වෙග්ලියෝ හිමි - 1938 පෙබ. 03 - ඉතාලිය

අතිඋතුම් ගියොජ්සි කාදිනල් බර්ටෙල්ලෝ හිමි - 1942 ඔක්. 01 - ඉතාලිය

අතිඋතුම් ප්‍රැන්සිස්කෝ කාදිනල් කෝකෝපැල්මේරියෝ හිමි - 1938 මාර්තු 06 - ඉතාලිය

අතිඋතුම් ජෝ බ්‍රාස්ඩි කාදිනල් අවිස් හිමි - 1947 අප්‍රේ. 24 - බ්‍රසීලය

අතිඋතුම් එඩ්වින් ෆෙඩ්රික් කාදිනල් ඕබ්‍රයන් හිමි - 1939 අප්‍රේල් 08 - ඇ.එ. ජනපදය

අතිඋතුම් ඩොමිනිකෝ කාදිනල් කැල්කාග්නෝ හිමි - 1943 පෙබ. 03 - ඉතාලිය

අතිඋතුම් ගියොජ්සි කාදිනල් වර්සල්ඩි හිමි - 1943 ජූලි 30 - ඉතාලිය


අතිඋතුම් ජේම්ස් මයිකල් කාදිනල් හාවි හිමි - 1949 ඔක්. 20 - ඇ.එ. ජනපදය

මෙහි සඳහන්ව ඇත්තේ කාදිනල් හිමිපාණන්ගේ නම, උපන් දිනය, හා රට යන කරුණු තුනයි.

යුරෝපය 61, උ. ඇමරිකා 14, ම.ඇමරිකාව, 19 අප්‍රිකාව 11 ආසියාව, 11 ඕෂීනියාව 01

කලා සංග්‍රහය

# සෙවණේ කුරුසියේ




දේශනාවාදී පියතුමකු ලෙස ජීවිතයේ විවිධ පැතිකඩ නිරූපණය කරමින් ජීවිතය කාගේද ජීවිතය කාටද යන කෘතිය තුළින් මිනිස් හදවත සියුම් ලෙස ස්පර්ශ කළ ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි පියතුමා පසුගියදා කොහුවල සා. ජෝසප් නිමල මරිය නිකායික කනිටු දෙව්සත්හල් ශ්‍රවණාගාරයේදී තම කුළුදුල් සංයුක්ත තැටිය වන 'සෙවණේ කුරුසියේ' ගීතිකා සංයුක්ත තැටිය හා එහි ගීතිකා අඩංගු පොත් පිංච එළිදැක්වීය.

එදින ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අගරදගුරු පදවි සහායක රදගුරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන් ද නි.ම.නි කොළඹ ප්‍රාදේශාධිපති අතිගරු රොහාන් සිල්වා නි.ම.නි පියතුමා ද නීලා වික්‍රමසිංහ, අයිවෝ ඩෙනිස්, රොඩ්නි වර්ණකුල වැනි සම්භාවනීය කලාකරුවන් ද පූජක පැවිදි විශාල පිරිසක් ද සහභාගි වූහ.

මෙහි සෑම ගීතිකාවකම පද සංකල්පනා ගරු එමාඩ් දල්පතාදු පියතුමාගෙන් වන අතර පියුමස් ප්‍රනාන්දු මහතාගේ පද සංකල්පනාවක් වූ "සුදුවර මහිමය" නම් වූ එව්ජින් ද මැසනඩ් මුනි ගීතයද අඩංගුව ඇත. ගරු ඇන්ටන් ජයනන්ද පියතුමා, ගරු ඇන්ජලෝ විජේවික්‍රම නි.ම.නි. පියතුමා, ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි පියතුමා, අයිවෝ ඩෙනිස්, නීලා වික්‍රමසිංහ, රොඩ්නි වර්ණකුල, ශ්‍යාමලී පීරිස්. සම්පත් ප්‍රනාන්දු, සචින්තනා ප්‍රනාන්දු, අලංක බණ්ඩාර, නිලංග ප්‍රනාන්දු, රෙබෙකා සෙව්වන්දි, ලියෝනි දල්පතාදු, කාමන් දල්පතාදු, ක්ලෝඩ් දල්පතාදු, සජිත් ක්‍රිෂාන් සහ සමූහ ගායනා කණ්ඩායම ගීතිකා ගායනයෙන් දායක වූහ. ගී තනු නිර්මාණයට ගරු ශානිල් ජයවර්ධන, ගරු අශෝක් ස්ටීවන් නි.ම.නි පියතුමන් ද ගරු දිනංජ සිල්වා පියතුමා ද ගරු රොහාන් අප්පුහාමි සුබැඳි සොහොයුරා ද ආචාර්ය රෝහණ වීරසිංහ, ලසන්ත ප්‍රනාන්දු, ලැම්බට්, වාස්, සුමිත් පීරිස් හා මුදිතා නිදෝෂිණී දායක වී ඇත.

සංගීත නිර්මාණය හා සංගීත අධ්‍යක්‍ෂණයට ලසන්ත ප්‍රනාන්දු, ගරු රොහාන් අප්පාහාමි සුබැඳි සොයුරු, ආචාර්ය රෝහණ වීරසිංහ, සෝමපාල රත්නායක, රුවන්ත වාස් දායකත්වය ලබා දී ඇත.

කථනයෙන් නිර්මාල් අශාන් ද නාද ශික්‍ෂණයෙන් දයානන්ද පෙරේරා පටිගත කිරීමේ සහාය කසුන් කොළඹගේ ද ඡායාරූප සහ කවර නිර්මාණය සිසිර විජේතුංග ද සම්බන්ධීකරණය ලක්සිරි විරසිංහ යන අයගේ දැතින් සිදුවිය.නිමල මරිය නිකායික දේව කැඳවීම් අධ්‍යක්‍ෂ ලෙස කටයුතු කරන ගරු එමාඩ් දල්පතාදු පියතුමාගේ හද සන්තානයෙහි වසර කිහිපයක් තුළ සිට බිහිකිරීමට සිතා සිටි මෙම ගීතිකා සමුච්චයේ ගීතිකා දහසයක් අඩංගු වන අතර මෙහි ඇති සෑම ගීතිකාවක එක්තරා විශේෂත්වයක් ඇත. එනම් මෙම ගීතිකාවල අඩංගු සෑම වචනයක් බයිබලීය වචන තුළින් උපුටා ගෙන ඇති අතර උපුටා ගත් බයිබල් පාඨය කුමන පරිච්ඡේදයේ ද යන්න මුද්‍රිත ගීතිකා පොතේ දක්වා ඇත. මේ අනුව බැලූ කල මෙහි අඩංගු සෑම ගීතිකාවක්ම මිනිස් හදවතට වඩා සමීපය. විශ්වාසයේ වසර තුළ දිවි ගෙවන ජනතාවගේ හදවතට බයිබලීය වදන තවදුරටත් සමීප කරන්නට ගරු එමාඩ් දල්පතාදු පියතුමා දරන උත්සාහය සාර්ථක වේවා යන්න අපගේ පැතුමයි.

**ලක්ශාන් ප්‍රනාන්දු**

# කතෝලික මාධ්‍යවේදීන් ලෙස අප නිතරම අවදිව සිටිය යුතුයි

## ජනසන්නිවේදන ජාතික අධ්‍යක්‍ෂ ගරු බෙනඩික් ජෝශප් පියතුමෝ පවසති

"මෙලොව බිහි වූ අසහාය සන්නිවේදකයා ක්‍රිස්තුන් වහන්සෙයි. මේ සන්නිවේදන ක්‍රියාවලියේ දී දුප්පත් පොහොසත් හෝ ස්ත්‍රී පුරුෂ තත්ත්වයක් බලපාන්නෙ නැහැ. අපට හැමදාම හැම මොහොතකම සන්නිවේදනය අවශ්‍ය වෙනවා. හුදෙක් එය ගුවන් විදුලිය රූපවාහිනිය පුවත් පත ආදි මාධ්‍ය පමණක්ම නොවෙයි. ඊට වඩා පුළුල් බවක් එහි අර්ථ ගැන්වෙනවා යැයි ගාලු පදවියේ ජනසන්නිවේදන වැඩමුළුවක් අමතමින් කතෝලික ජනසන්නිවේදන ජාතික අධ්‍යක්‍ෂ ගරු බෙනඩික් ජෝශප් පියතුමා ප්‍රකාශ කළේය.

ගාලු පදවි ජනසන්නිවේදන උපාධ්‍ය හා ගාල්ල මීසම් සේවක ගරු මයිකල් කොලින් පියතුමා මෙම වැඩමුළුව සංවිධානය කළ අතර පදවියේ විවිධ මීසම්වලින් සන්නිවේදන ක්‍ෂේත්‍රයට හිතැති තරුණ තරුණියන් ඊට සහභාගි වූහ. ගාල්ල මීසම් ශාලාවේ එය පැවැත්විනි.

"සන්නිවේදනයේ ආරම්භය විශ්වය මැවීමේ කාර්යයේ සිටම පැවතුනා. එහි ස්වාමිත්වය මිනිසාට පැවරුණා. කතෝලික සභාව වසර දෙදහස් ගණනක් දක්වාම මේ පැවත ගෙන එන්නෙ ලෝක ආරම්භයේ සිටම දෙවියන් වහන්සෙ ලොවට ප්‍රකාශ කළ සන්නිවේදනය ලෙසයි. අපගේ මිනිස් ඥානයෙන් අවබෝධ කර ගැනීමට නොහැකි තරම් දැන් සන්නිවේදනය දියුණුයි. කතෝලික මාධ්‍යවේදීන් ලෙස අප නිතරම අවදියෙන් සිටිය යුතු යැයි එතුමෝ තවදුරටත් පැවසූහ. ගාලු පදවි ජනසන්නිවේදන උපාධ්‍ය ගරු මයිකල් කොලින් පියතුමා වැඩමුළුව අමතමින් "ශුද්ධ වූ සභාව තුළ විවිධ අපෝස්තලික සේවාවන් සිදුවන අතර ජනසන්නිවේදන ක්‍ෂේත්‍රය ද ඉන් එක් අපෝස්තලික සේවාවක්. විශ්වාසයේ වසර පෙරටුකොට ගනිමින් අප මේ ගමන යා යුතු යැයි උන්වහන්සේ පැවසූහ. මෙහිදී 'ලේඛන කලාව' මැයෙන් කිතුනු මාධ්‍යවේදී මංගල ජයවර්ධන කෙටි හැඳින්වීමක් කළ අතර ජාතික අධ්‍යක්‍ෂ පියතුමාගේ සහයට ඇන්ටන් ප්‍රනාන්දු මහතා ද සහභාගි විය. චිත්‍රපට, සාකච්ඡා, සුහද පිළිසඳර ආදි විවිධ අවස්ථාවන් ගෙන් එම වැඩමුළුව සමන්විත වූ අතර සහභාගි වූ පිරිස පදවියේ ඉදිරි ජනසන්නිවේදන කටයුතු සඳහා සාර්ථක යෝජනා ඉදිරිපත් කළහ.

**මංගල ජයවර්ධන**
ගිංතොට

# කන්දතොඩුවාව පාස්කු රංගනය දසවෙනි වරටත්

වසරක් වසරක් පාසා අඛණ්ඩව පවත්වාගෙන එනු ලබන පාස්කු රංගනය, මෙවරත් කන්දතොඩුවාව, මීසම් පුදබිමේ දසවෙනි වරටත් මහා අභිමානයෙන් යුතුව එළිදැක්වීමට සියලු කටයුතු මේ වන විට සංවිධානය වෙමින් පවතී. නව මීසම් සේවක ගරු දිනංජ සිල්වා පියතුමාගේ පූර්ණ අධීක්‍ෂණය යටතේ මාර්තු 29 මහසිකුරාදා දිනයේ, ප.ව. 1.00 ට ආරම්භ කෙරෙන පශ්චාත්තාපික ආගමික වතාවත් සමඟ ජේසු සමිඳාණන්ගේ කුරුස පත්වීම පෙරදැරිකරගෙන නාට්‍යයක අනුසාරයෙන්, ගරු පියතුමා ඇතුළු පාස්කු කමිටුවේ දැඩි කැපවීම මත මීසම් වාසින්ගේ පූර්ණ සහයෝගිතාවයෙන් දැවැන්ත වේදිකාවක් මත රඟදැක්වීමට නියමිතය.

ඒ සඳහා රංගන දායකත්වය ප්‍රදේශයේ සහජ කුසලතාවයන්ගෙන් හෙබි නළුනිළි පිරිසක් විසිනි. 'පුරෝකථක' (පොතේ ගුරු) ලෙස ග්‍රේෂන් කුරේරා, කිතු චරිතය සඳහා එම්. ජෝශප් රාජ්, දේව මෑණියන්ගේ චරිතය, රවීනා දෙව්මි, වෙරෝනිකා වෙනුවෙන් සුරනි අසින්තනා, ජුදාස් ලෙස සිසිත ප්‍රනාන්දු යන මහත්ම මහත්මීන් රංගනය සඳහා පිදුම් ලබන අතර මීගමුව දූවේ ප්‍රකට කලා ගුරු පියාණන් වන ලක්‍ෂමන් කුරේරා මහතාගේ උපදෙස් නාට්‍ය රංගනය තවත් අර්ථවත් කර ගැනීමට පිටුවහලක් වූ බව ප්‍රදීපයට දැනගන්නට ලැබුනි.

**ෂෙලී රතුගම**



කිතුනු ග්‍රන්ථ කතුවරයකු හා ප්‍රදීප ලේඛකයකු වන අසේල දසනායක විසින් රචිත 'ඕලන්ද යුගයේ වීරෝදාර කතෝලිකයෝ" නමැති ග්‍රන්ථය හලාවත වට්ටක්කල්ලිය ජුසේවාස් දෙව්මැඳුරේ මංගල්‍ය දිනයේදී එළිදැක්විය. රත්නපුර රදගුරු අතිඋතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා සා.බෙ.නි හිමිපාණන්ට කතුවරයා ග්‍රන්ථය පිළිගැන්වූ අයුරු. එම අවස්ථාවට හලාවත හිටපු මීසම් සේවක ගරු රොන්කල්ලිද සිල්වා පියතුමා ඇතුළු පැවිදි සොයුරියන් හා කිතුනු බැතිමතුන් රැසක් සහභාගි වූහ.

**පර්සි ප්‍රනාන්දු**



උපත නත්තල් සඟරාවේ තෙවැනි කලාපය එහි සංස්කාරක ප්‍රියන්ත පීටර්ස් වෙන්නප්පුව හිටපු මීසම් සේවක හලාවත පදවි ජනසන්නිවේදන අධ්‍යක්‍ෂ ගරු ප්‍රැන්ක් තිසේරා පියතුමන්ට පිළිගැන්වූ අවස්ථාව. උපත සහය සංස්කාරක වික්ටර් දෙහිපිටියආරච්චි මහතා පසෙක සිටී.

**සේයා - ජේ. කේ. මයිකල් පෙරේරා**

# දීදලුන කිතුනු තරු



**නම : කුරුකුලආරච්චිගේ දෝන මේරි නිමල් පද්මිණි නානායක්කාර**
**ලේඛනයේ භාවිත කරන නම : පද්මිණි නානායක්කාර**
**ලිපිනය : 130A, "සුරත්විලා" කුරුකුලාව, රාගම**
**දුරකථනය : 011-2958554**
**උපන් දිනය : 1947.07.01**

සිංහල, ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් ලේඛනයෙහි යෙදෙන පද්මිණී නානායක්කාර 1992 අප්‍රේල් 4 දින 'නවයුගය' පුවත්පතට නිර්මාණයක් සපයමින් ලේඛිකාවක ලෙස දොරට වැඩියාය.

පද්මිණී නානායක්කාර අධ්‍යාපනය ලැබුවේ සා. ලාසරුස් විදුහල (කුරුකුලාව) සිරි කුරුස විදුහල (ගම්පහ) හා අපොස (සාමාන්‍ය උසස් පෙළ) බොරැල්ල ඇක්වයිනාස් ආයතනයෙන්ය. පුංචි සංදියේදී සාහිත්‍ය විෂයට ප්‍රිය කළ ඇය පාසලේ සාහිත්‍ය සංගමයෙන් පැවැත්වූ රචනා තරග රාශියක් ජයග්‍රහණ කර සහතික හා තිළිණ පත් දිනාගත්තාය. ක්‍රීඩාවටද දක්‍ෂ ඇය පාසල් දිවියේ දැල්පන්දු කණ්ඩායමේද නමක් දිනා සිටියාය.

උසස් අධ්‍යාපනයෙන් පසු, බොරැල්ල ඇක්වයිනාස් ආයතනයෙන් පැවැත්වූ ජනමාධ්‍ය ඩිප්ලෝමාවද දිනා ගන්නා ලදි. පන්හිඳේ අසිරිය කියාපාන නිර්මාණ රැසක් ලියා පළකළ ඇයගේ නිර්මාණ ඥානාර්ථ ප්‍රදීපය, The Massenger, ඩේලිනිව්ස්, කැටපත් පවුර, දිවයින, දිනමිණ පුවත්වල පලවිය. විශේෂාංග ලිපි වෛද්‍ය ලිපි හා ප්‍රවෘත්ති ඇයගේ ලේඛනයේ විශේෂත්වයක් විය.

ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ පළමු ශ්‍රේණියේ ලිපිකරුවකු හා වත්තල ටෙලිෂොප් ආයතනයේ සහකාර කළමනාකාරි ලෙස සේවය කළ ඇය, දැනට එඬේරමුල්ල සා. ජෝශප් විදුහලේ සුබ සාධක නිලධාරිණියක වශයෙන්ද සේවය කරන්නීය.

මෑතදි කිතුනු ග්‍රන්ථ දෙකක්ද ලියා ග්‍රන්ථකරණයට පිවිස ඇති අතර, සමාජ සේවිකාවක් වශයෙන්ද ගමේ සමාජ සේවා කටයුතුවල නිරතවෙමින් විසෙන්ති පාවුළු සමිතියේ ක්‍රියාකාරිකයකු ලෙසද, ජාතික කතෝලික ලේඛක හවුලේ සම ලේකම්වරයකු ලෙසද ක්‍රියා කරයි. ලේඛන කලාවට අතදුන් අය අතර අජන්තා රණසිංහ මහතා ඉතා ආදරයෙන් මතක් කරයි.

පද්මිණී තම සැමියා හා පුතුන් දෙදෙනා සමග යහපත් පවුල් ජීවිතයක් ගතකරමින් නිහඬ සමාජ සේවයක්ද සිදුකරයි. ජාතියේ පිනට පහළ වූ ඇය අප කිතුනු ලේඛක තරුවක් ලෙස අනාගතයේ දස්කම් පානු නිසැකය.

**මැක්ෂිමස් රෝයි පෙරේරා**

ෆීලීෂන් අබයකෝන්ගේ සුබස 229

# ගඟුලැල්ල සේම කඳුළැලි

දිගු නීල වරල මුදමින් ඉසා - තුඟු මුල තරා ළෙහි ගසා
ගඟු ලැල්ලසේම කඳුළැලි ඉසා - රඟු කුල බිසව ඇඬූ මෙලෙසා
(පසන්)

උල් යනු උල්පත්ය, ගඟේ උල් ගඟුල්ය. උල්පත, උල්දිය, නාමුල, ලිඳුල යන යෙදුම්වල මෙනි. ගඟක පටන්ගැන්මේ ගඟුල් පිහිටයි. කැලණි ගඟ මුලදී සමනළ කන්දේ පිහිටි සීත ගඟුල අන්වර්ථ නාමයකි. කඳු ප්‍රපාතයක ඇද හැළෙන දිය දහර ඇල්ලකි. ගඟුලක් ගලද්දී ඉහළින් පහළට ඇද වැටෙනවිට ගඟුලැල්ලකි. ගුත්තිලයේ 'දුලා දිමුතු මුතුහර ගඟුලැල් මෙන්' යන්නෙහි විරිත නිසා ගඟුලැලි ගඟුලැල් විය.


කඳු අතරින් ගලන දොළ පාර කඳුරයි. වේවැල් කඳුර, කුඹුක්කඳුර, මාකඳුර (මහඹය) යන ගම් බලන්න. කඳු බෑවුමක කඳුරක් කඩා හැළෙද්දී කඳුරු + ඇලි = කඳුරැලි උපදී. කඳුරැල්ල කඳු යායක් නම් නොවේ.

සෙවණත් සෙවණැල්ලත් ඡායාය. සෙවණලු යන්න සෙවණැල්ලේ ආදි ස්වරූපයයි. සැලලිහිණියේ 'සිහින් ගෙඳි සෙවණලු මැලි තෙලෙක" යනු හීන්කෙන්ද නම් ගස්වල සෙවණැලි ඇති වැලිතලාය.

(Dawn) අරුණ + අලු = අරුණලු නම් අරුණාලෝකයයි. උදය, දවල්, සවස මෙන් අරුණ කාලය හඟවන පදයකි. අරුණැලි වීමට කිසිසේත් බැරිය. රැස් දහරා, දිය දහරා වහරේ තිබුණාට ඇලි යෙදෙන්නේ දියර සමගය.

සිහිල් + ඇලි = සිහිලැලි සීත ඇලිය. කඳුළු + ඇලි = කඳුළැලි කඳුළු දහරාය. මුතුලැල් යනුත් මුතුවැල්ය. මේ වචන හා රළ, රැලි, රැල්ල, රැලිය (RALLY) පැටලී ඇත. සැරසිලි, සරුංගල්, ඉදිආප්පවල ඇත්තේ රැල්ය.

1. ගඟුලැලි කඳුළැලි පසන් පොතේ කීප තැනකය. එහෙනුමුත් මගේ මච්චනේ, අයා මුක පවසන්ඩවත් වාහිනා කඳුළැල්ලෙනේ, පෙන්නවා දෙමි ඒ බවත් 2. එවෙනි සුබා වත නිල්ලා - වැගිරෙයි ලේ ගඟුලැල්ලා 3. සිත සමාදිව ළැම තෙමා කඳුළැලි නෙතේ මුව ඉස ඉසා මම තමාවද ළඟම ඉන්නා මෑණියෝ ශ්‍රී කුමරුනේ



# සසුන් පිය ධූරය හිස්වීම සංකේතවත් කරන්නට කාසි හා මුද්දර

සසුන් පිය ධූරය හිස්වීම සනිටුහන් කරමින් විශේෂ මුද්දර සහ කාසි පෙළක් නිකුත් කිරීමට වතිකානය සූදානමින් සිටී.

මේ නිමිත්තෙන් නිකුත් කරන මුද්දර වලට සසුන් පිය ධූරය හිස්වීම සංකේතවත් කරන නිල ලාංඡනය සමගින් 'Seede Vacante' (සසුන් පිය ධූරය හිස්වීම),'Citta del Vaticano' (වතිකාන නගරය) යන වදන් සහිත වර්ෂය රෝම ඉලක්කම් වලින් සටහන් කැරෙනු ඇත. මාර්තු 01 වැනිදා යූරෝ ශත 70, ශත 85, යූරෝ 2 හා 2.50 වටිනාකමැති කාසි වර්ග හතරක් නිකුත් කිරීමට බලාපොරොත්තුවේ.

කෙසේ වෙතත් කාසි එකතු කරන්නන්ට මැයි මස අවසානය දක්වා බලා සිටීමට සිදුවනු ඇතැයි වතිකාන මුද්දර හා කාසි පිළිබඳ කාර්යාලයේ ප්‍රකාශකයෙක් පැවසීය. යූරෝ 2 වටිනාකමෙන් යුතු කාසිය හා රිදී පැහැති යූරෝ 5 වටිනාකමැති කාසිය අලෙවිය සඳහා තබන අතර ඉන් යූරෝ 2 කාසිය පොදු භාවිතාව සඳහා බෙදාහැරීමට බලාපොරොත්තුවේ. මේ කාසිවල එක් පැත්තක සසුන් පිය ධූරය හිස්වීම සංකේතවත් කරන නිල ලාංඡනය දැක්වෙන අතර කාසියේ අනික් පස 'Secle Vacante' යන වදන් සටහන් කර තිබේ. මේ අතර අතිඋත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමාගේ රූපය සනිටුහන් වන අවසාන කාසි තොගය මාර්තු මස අගදී නිකුත් කැරේ.

**- ශිරාන් මෛත්‍රී**

# පේදුරු පා ගමන්


ඇදහිල්ලේ වර්ෂය සනිටුහන් කරමින් නව ධර්මදාන ක්‍රියාකාරිත්වයක් වශයෙන්, පෙබරවාරි මස 07 වෙනිදා වතිකාන පරිශ්‍රයේදී 'පේදුරු පා ගමන' නම් සෞන්දර්ය ප්‍රදර්ශනය ආරම්භ කැරිණි. එම ප්‍රදර්ශනය මහ ජනයා සඳහා විවෘත කරමින් නව ධර්මදාන ක්‍රියාකාරිත්වයන් පිළිබඳ ශුද්ධාසන කමිටුවේ සභාපති රිනෝ පිසිටෙල්ලා රදගුරු තුමෝ සිය වදන් අරඹමින් මෙලෙස පැවැසුවෝය. "ඇදහිල්ල යනු එක් එක් මිනිසාගේ හදවත තුළ දෙවිඳුන් අත්දැකීමේ නිදානය වෙත කිඳා බැසීමේ මං පෙතයි. එම සත්‍ය හෙළි දැක්වීමේ අරමුණින් පේදුරු තුමා අත්දුටු ඇදැහිල්ලේ ජීවිත ගමන 'පේදුරු පා ගමනේ' මුඛ්‍ය පරමාර්ථය වේ. එම අරමුණ සාක්ෂාත් කරගැන්ම සඳහා හතරවෙනි සහ පස්වෙනි ශත වර්ෂයන් කරා දිව යන පේදුරු තුමාගේ දෙවිඳුන් අත්දැකීම් දනවන කලා නිර්මාණයන් මෙම ප්‍රදර්ශනයේදී භාවනා ස්වරූපයෙන් අත් දිටිය හැක. එම සුවිශේෂී කලා නිර්මානයන් රටවල් 09 කින් ලබාගෙන තිබේ.

"සමාජ පැවැත්ම කෙරෙහි දැස් යොමු කරද්දී පෙනී යනුයේ, ජීවිතයේ ඊනියා සාර්ථකත්වය හඹා යන බොහෝ පිරිස් ඉමහත් වෙහෙසට පත්වෙන බවයි. ප්‍රීතිය සොයා දුව යන වෙහෙසකාරී ගමනේදී විද්‍යාත්මක දියුණුව ඔස්සේ සාර්කථකත්වය ලබා ගැන්මට වෙහෙසන බැව් ද දිටීය හැක. මෙම සමාජ රාමුව තුළ දේව ඇදහිල්ල සුළුතර පිරිසකගේ කාර්යයක් යැයි ද වැරදි මතයක් වේ. එහෙත් පරාජිත ලෝකයක් හමුවේ සුන්දර දැ කෙරෙහි හදවතත් මනසත් මෙහෙයවනු ලබන්නන්ගේ නැඹුරුවක් ද වේ. එවන් නැඹුරුවක් සඳහා ආලෝකය ලබා දෙන්නේ කලා මාධ්‍යයන් ය. එලෙසින් හදවත තුළ පැතිර යන සුවසහන ආලෝකය මගින් දේව ඇදැහිල්ල උදා කෙරෙන බව ලෝ පුරා සාක්ෂි මගින් ඔප්පු වේ. එලෙස මනසින් හා හදවතින් ඒකාලෝක කරනු ලැබූ ඓතිහාසික චරිතයන් අතර පේදුරු තුමාගේ චරිතය සුවිශේෂී වේ.

දේව හඬ හඳුනාගෙන කලා මාධ්‍යයන් තුළින් දෙවිඳුන් ප්‍රකාශ කෙරුමට පේදුරු චරිතය බොහෝ කලා නිර්මාන කරුවන්ට රුකුලක් හා ආභාශයක් වී ඇත. පේදුරු තුමා දෙවිඳුන් සොයා පා තබා ඇත. එහෙත් චරිතයක් ලෙසින් ඔහු දුර්වලය. ස්වාමියාණන් ප්‍රතික්ෂේප කෙරුමට පවා පෙළැඹුණේය. එහේත සක්‍රීය සමාව ලබා ගන්නා අයුරු ඔහු දැන සිටියේය. සමාව අත්දැකීම ඔස්සේ ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයෙන් ඇදැහිල්ල සවි කරගත් ඔහු ඇදැහිල්ලේ පා ගමනින් උත්ථාන වූ ස්වාමින් වහන්සේ වෙනුවෙන් සිය දිවිය පූජා කළේය. ඔහුගේ හදවතේ සුන්දරත්වයත් ජීවිත ගමනේ අපූර්වත්තයත් පිළිබිඹු කැරෙන 'පේදුරු පා ගමන නම් කලා සෞන්දර්ය, ඇදැහිල්ලේ පහන දල්වා පතුරු වන්නකි.' රදගුරු ජිනෝ පිසිචෙල්ලා එලෙසින් ද ප්‍රකාශ කළ සේක.

# කොළොම්බියාවේ පූජකවරු දෙනමක් ඝාතනය කෙරේ

කොළොම්බියාවේ ප්‍රගා නගරයේ පදිංචිව සිටි 55 හැවිරිදි ජෝස් ප්‍රැන්සිස්කෝ එම ප්‍රදේශයේ සුප්‍රකට සමාජ සේවකයෙකි. එතුමා දිළිඳු ජනතාවන් සමග සමීපව කටයුතු කළේය. විවිධාකාර උපකාරයන් කරමින් දිළින්ඳන් දිළිඳුභාවයෙන් එතෙර කරවීමට වෙහෙසුණේය.



දිළිඳු ජන කොටස් සඳහා ලබාදීමට රැස්කොට තුබු දැ සොරකම් කැරුමට පැමිණි සොරුන් කීප දෙනෙකු විසින් පසුගිය සතියේ එතුමා වෙඩි තබා මරා දමනු ලැබීය. ඇදැහිළි වන්තයින් විසින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ එතුමන්ට හතුරන් නොසිටී බවයි. සොරකමට පැමිණි අය එතුමා විසින් හඳුනා ගැනීම හේතුකොටගෙන පියතුමා මරා දමන්නට ඇතැයි පොලීසිය දක්වා සිටී. ප්‍රගා පදවියේ ජෝස් රොබෙර්කෝ රදගුරුතුමාගේ මෙහෙයවීමෙන් පියතුමාගේ අවසන් කටයුතු සිදුකරනු ලැබුවේ කඳුළු පිරි ජනතාවගේ සහභාගිත්වයෙනි.

තවද, කොළොම්බියාවේ විලා විසෙන්තියෝ අගරදගුරු පදවියේ සේවයෙහි යෙදී සිටි ලුවිස් අල්ප්‍රදෝ සලවාර් පියතුමා තාවකාලිකව නැවතී සිටි ස්ථානයේ දිව්‍ය යාගය සිදුකොට, දිවා ආහාරය වළදා තවත් පුරුෂයන් දෙදෙනෙකු සමග එළිමහනේ කතා බහේ නිරතව සිටියේය. හදිසියේමැ හිස් වැසුම් ලා සිටි දෙදෙනෙක් ඔවුන් දෙසට මෝටස් සයිකලයක් පැද ආහ. බලාපොරොත්තු රහිතව පිස්තෝලයක් දික්කොට වෙඩිල්ලක් තබන ලදී. වෙඩි පහර වැදුණේ පියතුමාටයි. අනෙක් දෙදෙනා කෑ මොර ගසමින් දුවන්නට වූහ.

ඒ දෙදෙනාගෙන් එක් අයෙකු වෙත එල්ල කැරුණත් ඔහු ගැළවී ඇතැයි පොලීසිය පවසයි. එලෙස නිගමනය කිරීමට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ පියතුමා සමග කිසිවෙක් හතුරු කමකින් නොසිටි බැව් නිගමනය කිරීම නිසාය. පසුගිය 2012 වර්ෂයේදී බ්‍රසීලියේ පූජකවරු දෙදෙනෙක් ද මැක්සිකෝවේ පූජකවරු දෙදෙනෙක් ද කොළොම්බියාවේ පූජක වරයෙක් ද ගෞතලාවේ ඒක පූජක වරයෙක් ද ඇමෙරිකාවේ තවත් පූජක වරයෙක් ද වෙඩි තබා මරා දමා ඇති බැව් ද වාර්තා වේ.

# වතිකානය - ඊශ්‍රායලය අතර තානාපති සම්බන්ධතා අතලඟ ද?




වතිකානය හා ඊශ්‍රායලය අතර තානාපති සම්බන්ධතා ඇති කිරීම පිළිබඳ විශේෂ සාකච්ඡාවක් ජනවාරි මස 29 වෙනිදා ජෙරුසලමේදී ශුද්ධාසනයේ නියෝජිත පිරිසක් හා ඊශ්‍රායලීය නියෝජ්‍ය විදේශ ඇමැති ඩැනී අයාලන් අතර පැවැතිනි. එම සාකච්ඡාවේ මුඛ්‍ය නිගමනයක් වී ඇත්තේ. ඊශ්‍රායලයේ කතෝලික සභාවේ නෛතික පැවැත්ම ඊශ්‍රායලය විසින් පිළිගනු ලබන බවයි.

තවද ඊශ්‍රායලීය නියෝජ්‍ය විදේශ ඇමති වරයා විසින් මාධ්‍ය වෙත ප්‍රකාශ කරනු ලැබුවේ, නව රජය දිවුරුම්දීමත් සමග ඊශ්‍රායලය හා වතිකානය අතර ඇති කැරෙන නෛතිමය එකමුතුව බල ගැන්වෙන බවයි.

එම ඊශ්‍රායලීය ප්‍රකාශනයට අනුගතව වතිකානය විසින් ද පුවත්පත් ප්‍රකාශනයක් නිකුත් කරනු ලැබ ඇත. ඊශ්‍රායලය හා වතිකානය අතර තානාපති සම්බන්ධතාවයන් ඇතිකර ගැන්ම සඳහා සාකච්ඡාවන් ආරම්භ වී ඇත්තේ වර්ෂ 1993 දීය. එහෙත් කලින් කලට ඇතිවූ දේශපාලන මත ගැටුම් හේතුකොට ගෙන එම සාකච්ඡාවන් ඉදිරියට නොගොස් අතරමග ඇණහිට ඇත. එයාකාරයෙන් අවුරුදු කීපයකට පසුව, වර්ෂ 2004 දී දෙරට අතර සාකච්ඡා යළි ඇරඹිණි. එම සහයෝගිතා සාකච්ඡාවන් වරින් වර පවත්වා ඇති අතර, මේ වසරේ ජුලි මාසයේදී, යම් ස්ථිර නිගමනයන්ට එළැඹෙන එකඟත්වයක් කරා යාමට හැකිවේ යයි ද ශුද්ධාසන පුවත් වාර්තා කරයි.

# යුරෝපා සංගම් ගබ්සා ආධාර වහා නවතාලිය යුතුය



ගබ්සාව හා මිනිස් කළලය විනාශ කිරීම සඳහා යුරෝපා කොමිෂන් සභාව විසින් ලබා දෙන්නාවූ මූල්‍ය ආධාර වහා නැවැත්විය යුතු යයි 'අපෙන් අයෙක්' යන සංවධානයේ මෙහෙයුම් අති සාර්ථක යැයි, ඉතාලියේ ප්‍රජනන ව්‍යාපාරයේ සභාපති කාර්ලෝ කයිනි විසින් කිතුනු පුවත් වෙත වාර්තා කරැත. යුරෝපයේ අනෙකුත් මිනිස් අයිතිවාසිකම් පිළිබඳ බොහෝ සංගම් ද විසින් යුරෝපා සංගම් ගබ්සා ආධාර නවතාලිය යුතු යයි හඬ නගයි.

එම මූල්‍ය ආධාර නවතාලන ලෙසට ඉල්ලමින් දශ ලක්ෂයකගේ අත්සන් සහිත පෙත්සමක් 2013 නොවැම්බර් මස 01 වෙනිදාට ප්‍රථම යුරෝපා සංගමය වෙත ඉදිරිපත් කිරීමට ද නියමිතයත සාධාරණය පිළිබඳ යුරෝපා අධිකරන රෙගුලාසි අනුව යුරෝපා කොමිෂන් සභාව විසින් ජනතා තීරණයත් පිළිග ැන්ම සඳහා සාමාජික රටවලැ පුරවැසියන්ගේ දශ ලක්ෂයක කැමැත්ත ලබාගත යුතු හෙයින් එයද ඉටුකරගත හැකියයි විශ්වාස කැරේ. ජීවතියට ඇති අයිතිය මිනිස් අභිමාණයත් මෙන්ම නෛතික අයිතියක් වන හෙයින් ඊට හරස් වීම නීති විරෝධි ක්‍රියාවක් වනු ඇතැයි ද පෙත්සමෙ දක්වා ඇත.

වර්ෂ 2007 සිට 2011 දක්වා කාලය තුළ 'ජාත්‍යන්තර උපත් පාලන ආයතනය' විසින් පමණක් ගබ්සාව හා ආනුසංගික කරුණු කාරනා සඳහා, යුරෝපා කොමිෂන් සභාවෙන් යුරෝ මිලියන හයක් ලබාගෙන ඇතැයි ද හෙළිදක්වා ඇත. චීනය ද, ඉන්දියාවද විසින් උපත් පාලනය සඳහා විශාල මුදල් සම්භාරයක් යුරෝපීය සංගමයෙන් ලබාගෙන ඇත. විශේෂයෙන් යුරෝපය පුරා ප්‍රජනන අයිතිය වෙනුවෙන් කැරෙන හඬ නැඟීම නිසා යුරෝපා සංගමය විසින් විවිධ රවටල් වලට ලබාදෙන ගබ්සා ආධාර නවතිනු ඇතැයි වතිකාන පුවත් විශ්වාස කරයි.

**බැසිල් ෆොන්සේකා විසිනි**

## වතිකාන කවුළුවෙන්

# ඉසිඹු ලැබීමෙන් පසු සසුන් පියා අමතන්නේ කෙසේද?

අතිඋත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමන් පෙබරවාරි 28 වැනිදා රෝම වේලාවෙන් රාත්‍රී 8.00 ට ඉසිඹු ලැබීමෙන් පසු එතුමන් කෙසේ අමතන්නේද යන්න ලෝවාසී ජනතාවට මෙන්ම මාධ්‍යවේදීන් ප්‍රමුඛ රට රටවල නායකයන් තුළ කුහුලක් මතුවෙමින් තිබිණ. ඇතැම් ජනමාධ්‍ය මේ කුහුල උපයෝගී කර ගනිමින් නැවත වරක් අතිඋත්තම ජෝශප් කාදිනල් රැට්සිංගර් යන නාමය භාවිතා කරනු ඇතැයි අනාවැකි පළකරද්දී උන්වහන්සේ තවදුරටත් අතිඋත්තම සොළොස්වන බෙනඩික් යන නාමය භාවිතා කරන බැව් වතිකානය නිවේදනය කළේය.

එහිදී උන්වහන්සේව විශ්‍රාමික සසුන් පිය හෝ 'විශ්‍රාමික රෝම සසුන් පිය' යන නමින් හඳුන්වන බැව් වතිකාන ප්‍රකාශක ගරු ෆෙඩ්රිකෝ ලොම්බාර්ඩි පියතුමා ඉකුත් අඟහරුවාදා පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවේදී තහවුරු කළේය. අතිඋත්තම සොළොස්වන බෙනඩික් සසුන් පියා විශ්‍රාම ලැබීමෙන් පසු තවදුරටත් සරල හා චාම් සුදු ඇඳුමෙන් සැරසෙන නමුත් සසුන් පිය කරපටි පළඳනාව පළඳින්නේ නැති අතර, ශුද්ධෝත්තම පියතුමා පළඳින සාම්ප්‍රදායික රතු පැහැති සපත්තු හා මේස් පැළඳීමද අතහැර දමන බැව් වාර්තාවේ. ඒ වෙනුවට උන්වහන්සේ ඉකුත් වසරේ මෙක්සිකෝ - කියුබා සංචාරයේදී තිළිණ වශයෙන් ලද දුඹුරු පැහැති මෙක්සිකෝ 'ලියොන්' හි සුවිශේෂී පාවහන් යුවළ පැළඳීමට තීරණය කර ඇති අතර එය දෙපයට ඉතා සුව පහසුවක් ගෙන දෙන බව එතුමන්ගේ අදහස බවද වතිකාන ප්‍රකාශකයා පැවසීය.

මේ අතර පෙබරවාරි 28 වැනිදා රාත්‍රී 8.00 ට නිලවශයෙන් සසුන් පිය ධූරය හිස්වීමත් සමග ශුද්ධෝත්තම පියතුමා මෙතෙක් පැළඳි සසුන් පිය මුදුව ගලවා ඉවතලන අතර පසුව එය විනාශ කරනු ලැබේ. කෙසේ වෙතත් උන්වහන්සේ තවදුරටත් මුදුවක් පැළඳීමට බලාපොරොත්තු වන අතර එය සසුන් පිය මුදුව නොව, කාදිනල් හිමි සමයේ පැළඳී මුදුව විය හැකි බවට විශ්වාස කැරේ.

අතිඋත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා පෙබරවාරි 28 වැනිදා පස්වරු 5.00 ට සිය වතිකාන නිල මැඳුරෙන් සමුගෙන හෙලිකොප්ටර් යානයෙන් ගන්ඩොල්ෆෝ සසුන් පිය වසන්ත නිවහන බලා ගිය අතර ඒ සමඟින් එදින රාත්‍රී 8.00 සිට සසුන් පිය ධූරය හිස්විය.

# ඉකුත් සසුන් පිය සිවුනමක් පත්වූ අයුරු

පසුගිය සසුන් පියාණන් තෝරා පත්කර ගැනීමටත්, පදවි ප්‍රාප්ත වීමටත් දිගු කාලයක් ගත නොවූ බව මෑත කාලීන වාර්තා පරීක්ෂා කිරීමේදී අනාවරණය වේ. අතිඋත්තම විසිතුන්වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා 1963 ජූනි 03 වැනිදා සගසුව දිනු අතර එතුමන්ගේ මිහිදන් කටයුතු ජූනි 06 වැනිදා සිදුකැරිණ. ජූනි 19 වැනිදා සසුන් පිය නිළවරණය ආරම්භවූ අතර දෙදිනකට පසු එනම් ජූනි 21 වැනිදා අතිඋත්තම ගියොවන්නි බැටිස්ටා කාදිනල් මොන්ටිනි හිමිපාණන්ව කාදිනල් සංසදය මගින් තෝරා පත් කර ගත්තේය. සයවැනි පාවුළු ලෙස නම්ගත් උන්වහන්සේ ජූනි 30 වැනිදා පදවි ප්‍රාප්ත වුහ.

අතිඋත්තම සවැනි පාවුළු ශුද්ධෝත්තම පියතුමා 1978 අගෝස්තු 06 වැනිදා සගසුව දිනු අතර භූමදාන කටයුතු අගෝස්තු 12 වැනිදා සිදුකැරිණ. නව සසුන් පියාණන් කෙනකු තෝරාපත්කර ගැනීමේ සසුන් පිය නිලවරණය අගෝස්තු 25 වැනිදා ආරම්භ වූ අතර දිනකින් එනම් අගෝස්තු 26 වැනිදා අතිඋතුම් ඇල්බිනෝ කාදිනල් ලුෂියානෝ හිමිපාණන්ව තෝරා ගත් අතර අතිඋත්තම පළමුවන ජුවාම් පාවුළු නමින් උන්වහන්සේ සැප්තැම්බර් 03 වැනිදා පදවි ප්‍රාප්ත වුහ.

එහෙත් මසකට අඩු කාලයකදී එනම් 1978 සැප්තැම්බර් 28 වැනිදා උන්වහන්සේ සගසුව දිනුහ. භූමදාන කටයුතු ඔක්තෝබර් 04 පැවැති අතර ඊළඟ සසුන් පිය නිළවරණය 1978 ඔක්තෝබර් 15 දා ආරම්භ විය. එහි දෙවන දිනයේදී එනම් ඔක්තෝබර් 16 වැනිදා අතිඋතුම් කැරොල් කාදිනල් වොයිටිල්ලා හිමිපාණන් තෝරා පත්කර ගත් අතර 1978 ඔක්තෝබර් 22 වැනිදා උන්වහන්සේ දෙවන ජුවාම් පාවුළු නමින් පදවි ප්‍රාප්ත වුහ.

අතිඋත්තම දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා 2005 අප්‍රේල් 02 දා සග සුව දිනු අතර එතුමන්ගේ භූමිදාන කටයුතු 2005 අප්‍රේල් 08 දා සිදුකිරීමෙන් පසු ඊළඟ සසුන් පිය නිළවරණය අප්‍රේල් 18 වැනිදා පැවැත්වීමට තීරණය කැරුණේ කාදිනල් සංසදයේ අධිපති අතිඋතුම් ජෝශප් කාදිනල් රැට්සිංගර් හිමිපාණන් ඇතුලු කාදිනල් හිමිපාණන්ය. අප්‍රේල් 19 වැනිදා නව සසුන් පිය ධූරයට අතිඋතුම් ජෝශප් කාදිනල් රැට්සිංගර් හිමිපාණන් තෝරා පත්කර ගත් අතර අප්‍රේල් 24 වැනිදා උන්වහන්සේ සොළොස්වන බෙනඩික් නමින් පදවි ප්‍රාප්ත වුහ.

**- ශිරාන් මෛත්‍රී**

විශේෂාංග

# 1915 බෞද්ධ - මුස්ලිම් කෝලාහලයේදී

# හෙළ විරුවකු මරණ මංචකයෙන් බේරාගත් ගරු පියතුමා



**65 වන ජාතික නිදහස් දින සමරුව නිමිතිකර ජාතික කතෝලික ගිහි සංවිධානයේ ගරු ලේකම් වික්ටර් සිල්වා මහතා විසින් 2013. 02. 03 ඥානාර්ථ ප්‍රදීපයේ "ලක් මෑණියන්ට කිතුනු අපගේ දායාදය නමැති ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයේ ඉතිහාසය ආවර්ජනය කර පළ වූ දීර්ඝ ලිපිය ද, 2013. 02. 17 දින ඥානාර්ථ ප්‍රදීපයේ පළ වූ "ක්‍රි.ව. 1915 බෞද්ධ මුස්ලිම් ගැටුම" නමැති විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන්ගේ "යටගිය දවස" පිළිබඳ 133 ලිපිය කියවීමේදී ලද ඓතිහාසික ඒ සමාජයේ දිවි ගෙවූ කතෝලික, කිතුනු ගිහි ප්‍රභූන්ගේ මහත් වූ දේශ වාත්සල්‍යයත්, අවංක ආගමික අනන්‍යතාවයත්, මහත්මා දේශපාලනයත් පාඨක අපගේ පහන් සංවේගය වඩවාලීමට හේතුවෙයි.**

එදා ඒ වියත් ගිහි ප්‍රභූන් සමඟ ගරු ඩී. ජේ. නිකුලස් පෙරේරා, හලාවත රදගුරු අති උතුම් එඩ්මන්ඩ් පීරිස් වැනි බහුශ්‍රැත කතෝලික පියවරු දේශපාලන නිවැරදි මාර්ගය පසක් කිරීමට සුදු ආණ්ඩුකාරවරුන් ඇතුළු දේශපාලන සමාජයේ මාර්ගෝපදේශකයන් වීම ද වත්මන් කතෝලික අපට ආඩම්බරයක් වෙයි.

ඉහත ගරු ස්වදේශීය පියවරු සමඟ මෙසමයේ සමහර විදේශීය කතෝලික ගරු පියවරු ද යතිවරයන් මෙන් සමාජ ක්‍රියාකාරීන් ලෙසද ජේසු සමිඳුන් අනුගාමිවූයේ ශු. සභා මාතාවට පමනක් නොව අන්‍යාගමික බැතිමතුන් වෙත ද ප්‍රසාද පූර්ණ හැඟීම් ඇති කරමිනි. එවැනි ගරු පියතුමකු කළ අභීත සේවාව මට දැන ගත හැකි වූයේ මෙලෙසිනි.

අප ප්‍රදේශයේ අනූපස් වන වියේ වෙසෙන උගත් මහතකු වෙයි. ඒ මහතා දන්නා අතීත සිද්ධි අප දැනුමට වැදගත් ග්‍රන්ථයක් වෙයි. හැත්තෑ පස් වසරකට පෙර රටේ ලෝකයේ සිදුවූ ආර්ථික, සමාජීය, දේශපාලන සංසිද්ධි ඔහුට අතැඹුලක් සේ ප්‍රතිපක්ෂය. එදා සමාජ නායකයින් කතා කළ වචන ඒ මහතුන් උච්චාරණය කළ ලෙසම පැවසීමේ උපන් හපන් කමක් මේ මහතා සතු ය. ඒ මහතා දැනට පනස් වසරකට පමණ පෙර සහභාගි වූ මළ ගෙයක් පිළිබඳ තොරතුරක් මට පැවසීය.

එදා මිය ගිය තැනැත්තා කඳානේ කේ. ජී. ගෝමිස් කුරේ නමැති ගම්මුලාදෑනියෙකි. සල්ලි තිබූ ඉඩම් හිමි වැවිලිකරුවෙකි. මිහිදන් කිරීමට පෙර ඒ මහතා පිළිබඳ ගුණ කථන කිරීම විය. එහිදී ප්‍රදේශයේ පෙරපර භාෂා පිළිබඳ දැනුමැති බෞද්ධ පින්වතකු මරණයට පත් ගෝමිස් රාළහාමි පිළිබඳව මෙසේ පැවසීය. "මෙම මහතා 1915 මාර්ෂල්ලෝ නීතියට මරණීය දණ්ඩනයට නියමව සිට එකල නාගොඩ පල්ලිය භාරව සිටි කොරලැක් කියන පූජක තුමා නිසා මරණ දණ්ඩනයෙන් බේරී තවත් වසර ගාණක් අප සමඟ ජීවත්ව වයෝවෘද්ධව මළේ ඒ මහතා දැහැමියකු නිසාය" ප්‍රකාශ කළ අපූරු කතාවක් පැවසීය. එයින් පසු මට මේ සිද්ධියේ නායක වූ ගරු කොරලැක් පියතුමාගේ නම අමතක නොවීය. මේ අපූර්ව පුවත පැවසූ වයෝවෘධ මහතා ඩේවිඩ් පොන්වීර නමැති ඉංග්‍රීසි බස දැනුමැති පැරැන්නෙකි.

ටික කලකට පසු මම නාගොඩ මීසම් සේවක ගරු රංජන් පියතුමා බැහැදැකීමට ගියෙමි. එවිට නව මීසම් ගෘහයේ නාගොඩ මීසමේ සේවය කළ ගරු පියවරුන්ගේ නාම පුවරුව දැක ගත හැකිවිය. එවිට මගේ සිතට කොරලැක් නමද පතිත විය. 1915 ඒ ගරු පියතුමා නාගොඩ මීසම් සේවක විය. පුවරුවේ ඒ නම මට බැබළුණි. මඳ වේලාවකට පසු ගරු රංජන් පියතුමා සැදැහැවතුන් බැහැදැකීමේ කාමරයට ඇතුළු විය. මම කොරලැක් පියතුමා පිළිබඳ ඩේවිඩ් පොන්වීර මහතා කියූ අතීත මළ ගෙදර කතාව ආවර්ජනය කෙළෙමි. එහෙත් පියතුමා පැවසුවේ ඒ පැරැණි පියතුමන් ගැන තොරතුරු නොදන්නා බවය. එහෙත් පියතුමා පවසා සිටියේ මෙය ඉතාමත් වැදගත් සිද්ධියක් බවත් හැකිනම් එදා ඒ සිදුවීම දැන් සිටින දරුවකුගෙන් හෝ ඥාතියකුගෙන් ගැනීම වැදගත් බවත් ය. එම ගරු පියතුමා බැහැදුටු මා නාගොඩ මීසම් ගෘහයෙන් නික්මුණේ පියතුමාගේ අදහස ඔළුවේ තබාගෙනය.

ඊට සතියකට පමණ පසු මට ප්‍රදේශයේ සුපතල මාධ්‍යවේදියකු හමුවිය. මා ඔහුට ගරු කොරලැක් පියතුමා නිසා ගෝමිස් රාළහාමි මරණයෙන් බේරුණු කතාව කියා ඒ ගෝමිස් මහතාගේ පුතකුගෙන් මෙම කරුණේ සත්‍ය අසත්‍යතාවය දැනගන්නා ලෙසට ආයාචනයක් කෙරිණි. ඒ මහතා ද මේ සිද්ධි වටිනා ඓතිහාසික පුවතක් කියා මරණයට පත් මහතාගේ පුතකුගෙන් ප්‍රකාශයක් ගැනීමට එකඟ විය. ඒ සිරිල් රංදෙණිය මාධ්‍ය වේදී මහතාය.

ටික දිනකින් සිරිල් රංදෙණිය මහතා ගෝමිස් රාළහාමිගේ පුත්‍රයකු හමුවිය. ඒ පුත්‍රරත්නය 1915 දී තාත්තාට සිදුවූ මහා වින්නැහිය හා එහිදී එදා නාගොඩ මීසම් සේවක ගරු කොරලැක් පියතුමා තාත්තා වෙනුවෙන් සිදුකළ නිර්භීත පරිත්‍යාගය කෘත ගුණ පූර්වකව ලියා දක්වනු ලැබුවේ මෙලෙසිණි.

දකුණු බටගම ශ්‍රී වර්ධනාරාම විහාරස්ථානය ඉදිරිපිට නිවසේ පදිංචි සිටින් කුරේ මහතා 2011. 08. 17 දින කළ ප්‍රකාශය.

" 1915 කලපු ගමගේ ගෝමිස් කුරේ - කඩ, ඉඩම් හිමි වැවිලිකරන ලෙස සේවය කළා. මගේ පියා කලපුගමගේ ගෝමිස් කුරේ ඔහු ගැන මතක් වෙන කොට මට ලොකු ආඩම්බරයක් ඇතිවෙනවා. එදා 1915 ට ප්‍රථම මගේ පියා ගම්මුලාදෑනි කෙනෙකු වශයෙන් සේවය කළා. එළහරක් ඝාතනයට අවසර නොදීම නිසා සුදු අධිරාජයා මගේ පියා සමඟ උරන වී එම ගම්මුලා දෑණි තනතුරෙන් ඔහුව අස් කළා. ඔහු කඩහිමි, ඉඩම් හිමි පොහොසත් අයෙක්. ගම්මුලාදෑණිකම කළේ සමාජ සේවයටයි.

ඔහු සිංහලයා වෙනුවෙන් සටන් කළ නිර්භීත අයෙක් 1915 මරක්කල සිංහල කෝලහාලයේදී ඔහු පෙරමුණ ගෙන යුක්තියට අනුව ක්‍රියා කළ නිසා සුදු අධිරාජයා ඔහු අත්අඩංගුවට ගෙන මරණීය දණ්ඩනය නියම කළා. එවකට නාගොඩ ස්නාවක ජුවන් මුනිඳුන්ගේ දේවස්ථානයේ පාලක කොරලැක් පියතුමා මැදිහත් වී මගේ පියාව මරණින් බේරා ගත්තා. අපි එදා සිට එතුමා ජීවත්ව සිටින තාක්කල් එතුමාට ස්තුති ප්‍රශංසා කළා. සෑම අවුරුද්දකම අපේ පවුලේ සියළු දෙනාම එතුමාගේ දේවස්ථානයට ගොස් සිංහල අවුරුද්ද වෙනුවෙන් තෑගි බෝග පිරිනැමුවා. තව බොහෝ විස්තර එදා පුවත්පත්වල සටහන්ව තිබුණා. මේ කෙටි විස්තරය සිරිල් රන්දෙනිය මහතාට ප්‍රකාශ කිරීමට ලැබීමත් සතුටක්."

හපුගොඩ
**ඩී. එස්. පතිරණ**

# බෞද්ධ - මුස්ලිම් ගැටුමේදී කිතුනු දායකත්වය

**අශිෂ්ට ලෙස ක්‍රියා කරමින් මෙ රට සිංහල බෞද්ධ පිරිසට රජය කළ අපරාධ ගැන බ්‍රිතාන්‍යයට දන්වා යැවීම දැන් කළ යුතුව තිබිණි.**

එහෙත් යුද නීතිය සහ එවකට පැවැති දළ දඬු පාලනය යටතේ මෙය ඉතා දුෂ්කර කාරියක් විය. එය ජීවිතය හා මරණය හා අතර සටනක් විය. එහෙත් මේ සඳහා එඩිතරව ඉදිරිපත් වූවෝ මෙරට කිතුනුවෝ ය.

ක්‍රි.ව. 1915 සැප්තැම්බර් මස 25 වැනි දා මේ සඳහා කොළඹ දී ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වන ලදි. එය පවත්වන ලද්දේ එවකට "පබ්ලික් හෝල්" නමින් වූ මහජන ශාලාවේ ය. ලංකාවේ සිංහල බෞද්ධයනට කරන ලද විශාල අපරාධ සම්බන්ධයෙන් යටත් විජිත රටවල් බාර ලේකම් තුමාගේ මාර්ගයෙන් බ්‍රිතාන්‍ය රජය දැනුම්වත් කිරීම සහ ඒ ගැන විභාග කිරීම සඳහා කොමිසමක් ඉල්ලා සිටීම අරමුණුකොට ගත් මෙම රැස්වීමේ මුලසුන දැරුවේ ක්‍රිස්තු භක්තික ශ්‍රීමත් ජේම්ස් පීරිස් මැතිඳුන් ය.

ඉතා බිහිසුනු වාතාවරණයක් මැද රැස්වීම පවත්වන ලදි.


එදින තීරණය කරගත් පරිදි පෙත්සම සඳහා සාධක එකතු කිරීම එක්තරා කමිටුවක් වෙත පැවැරිණි. මෙහි දී කෑගල්ලේ එඩිතරව ක්‍රියා කළ රාජ්‍ය නිලධරයකු වූ ඇල්බට් ඒ. වික්‍රමසිංහ මහතා ද එම කමිටුවට නම් කෙරිණ. කතෝලික බැතිමතකු වූ මෙතුමා එකල බුදුනු නායකයන් සමඟ ඉතා සමීපව ක්‍රියා කැර තිබූ හෙයින් ඔවුන් මාර්ගයෙන් දත්ත රැසක් ලබා ගත්තේ ය. (පසුව අගමැති) ඩී. එස්. සේනානායක මේ සඳහා සාධක රැසක් එතුමාට ලබා දුනි.

බ්‍රිතාන්‍යයට යවන ලද පෙත්සමට අත්සන් තැබූ පිරිස ගෙන් අඩකට වැඩි ප්‍රමාණයක් කිතුනුවෝ ය. මුළු සංඛ්‍යාවෙන් පහෙන් එක් ප්‍රමාණයක් කතෝලිකයෝ ය. පෙත්සම බ්‍රිතාන්‍ය රජය වෙත ඉදිරිපත් කිරීම වස් රහසිගතව තම පාවහනේ (සපත්තුවේ) සඟවා ගෙන ගියේ කිතුනු බැතිමත් නීතිඥ ඊ. ඩබ්ලිව් පෙරේරා වියතාණන් ය.

පෙත්සම රහසිගතව ගෙන යාම මෙන් ම මුහුදු තරණය ද එකල භයානක කාර්යයක් වූයේ එ කල පැවැති ප්‍රථම ලෝක මහා සංග්‍රාමය නිසා ය. මෙ රට රාජ්‍ය නිලධරයන්ගෙන් සැඟ වී යාම මෙන් ම යුද අතවරයකට හසු නො වී එතෙර වීම වීර ක්‍රියාවක් ම විය.

මේ වන විට ලංකාව තුළ මෙම අපරාධ සම්බන්ධයෙන් විභාගකොට වාර්තා කරනු වස් කොමිසමක් පත් කළ යුතු යැ යි යෝජනාවක් ඉදිරිපත් විය. ඉතා එඩිතරව ආණ්ඩුකාර තුමා ඉදිරියේ ම රාජ්‍ය මන්ත්‍රණ සභාවේ දේශනයක් පවත්වමින් මෙය පළමුවෙන් ඉල්ලා සිටියේ ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් මැතිඳුන් ය. එතුමා හින්දු බැතිමතෙකි. අවසානයේ මෙම යෝජනාව එතුමා බ්‍රිතාන්‍යයට ගොස් ඉදිරිපත් කළත් එය එසේ සාර්ථක නොවීය. එහෙත් එහි ප්‍රතිඵලයක් වශයෙන් "කෑගලු වෙඩි තැබීමේ කොමිසම" හෙවත් "කෑගලු කොමිසම" පත් කෙරිණ.

බ්‍රිතාන්‍යයට යවන ලද පෙත්සම් කිහිපයක් ම අසත්‍ය බව ප්‍රකාශ කොට ප්‍රතික්ෂේප කරන ලදි. පස් වැනි වතාවට මැරුම් කෑ අය ගේ නම් ගම් සහිතවය. යවන ලද පෙත් සම ද රාජ්‍ය ලේකම් බෝනාර් ලෝ එලෙස ප්‍රතික්ෂේප කළේ ය. අයර්ලන්ත ජාතික ගිමෙල් නැමැති කතෝලික පාර්ලිමේන්තු මන්ත්‍රිවරයා අප වෙනුවෙන් පාර්ලිමේන්තුවේ ප්‍රශ්න කළ අවස්ථාවේ ද ලෝ නමැති ලේකම්වරයා කියා ඇත්තේ අප ඉදිරිපත් කළ සාධක අසත්‍ය බවත් පරීක්ෂණ නො පවත්වා කිසිවකු මරා නො දැමූ බවත් ය.



**යටගිය දවස**

විශ්‍රාමික අගරදගුරු
අති උතුම්
**ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ**

**134**

එහෙත් මොවුනට පහර එල්ල වූයේ "කෑගල්ල කොමිසම" ඉදිරියේ තබන ලද සාක්ෂි අනුවයි. මුල දී රාජ්‍ය නිලධරයකු ලෙස පත්වීම් ලබා කැරැල්ල සමතයකට පත් කරනු වස් උපරිම වෙර දැරූ ඇල්බට් ඒ. වික්‍රමසිංහ මැතිතුමා පසුව රජයේ සාපරාධී ක්‍රියාදාමය දැක, ඉදුව නොබියව රජයට විරුද්ධව ක්‍රියා කළේ ය. මේ අනුව කෑගල්ලේ මරණ ලද සියල්ලන් භූගත කිරීමට පෙර මරණ පරීක්ෂණ පවත්වන ලෙස හෙතෙම නියම කළේ ය. මේ අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ පමණක් මරා දමන ලද පිරිස පිළිබඳ සාක්ෂි ලේඛන ගත ව තිබිණි.

මෙම සාක්ෂි සලකා බැලීමෙන් ඉක්බිති අලුතෙන් පත්ව මෙහි පැමිණ වැඩ බාරගත් ශ්‍රීමත් ජෝන් ඇන්ඩසන් ආණ්ඩුකාර තුමා "කෑගලු කොමිසම" නිල වශයෙන් පත් කළේ ය. මෙය පත් කරන ලද්දේ ක්‍රි.ව. 1916 ඔක්තෝබර් මස 26 වැනි දා ය. එහි සාමාජිකයන් වූයේ අග විනිසුරු ශ්‍රීමත් ඇලෙක්සැන්ඩර් වුඩ් රෙන්ටන් සහ නීතිඥ (පසුව ශ්‍රීමත්) ගෝල්ටෙරස් ස්ටුවර්ට් ශ්නයිඩර් යන මහතුන් ය.

කොමිසමේ කටයුතු බාධා කරන්නටත් සාක්ෂි යටපත් කරන්නටත් විටින් විට වෙර දරණ ලද නමුත් ඒවා බොහෝ දුරට අසාර්ථක විය. කොමිසම ඉදිරියේ සාක්ෂි කැඳවීම ස්ථිර වශයෙන් ආරම්භ වූයේ 1916 නොවැම්බර් මස 4 වැනි දා ය. සුබ අසුබ සිදුවීම් රැසක් මැද අප පිරිස දැරූ අප්‍රතිහත ධෛර්යයේ ප්‍රතිඵලය වශයෙන් ක්‍රි.ව. 1917 ජනවාරි 18 වැනි දා කොමිසම් වාර්තාව නිකුත් කරන ලදි. දිවයිනේ බොහෝ තැන්හි මෙ වැනි අපරාධ සිදු කරන ලද නමුත් සාධක සහිතව සහතික කොට ඔප්පු කළ හැකි මිනීමැරීම් ලියාපදිංචි වී තිබුණේ කෑගල්ලේ පමණ ය. මේවායේ සත්‍ය පිළිගැනීමට සිදුවීම බ්‍රිතාන්‍ය රජයට මහත් කැළලක් විය. මේ හේතුවෙන් ලංකාව කෙරෙහි මෙතෙක් ඉංගිරිසි පාලකයන් දැක් වූ ආකල්ප වෙනස් වන්නට පටන් ගත්තේ ය.

මෙය සළකා බලන විට "කෑගලු කොමිසමේ" වාර්තාව දෙව්දැති වරමක් විය. මෙයින් ජනතාව තුළත් බ්‍රිතාන්‍ය පාලකයන් තුළත් ඇති වූ සංකල්ප වෙනස අවසානයේ දී අප ගේ ජාතික නිදහස ලබා ගැනීම සඳහා බෙහෙවින් උපකාරී වූහයි කීම අතිශයෝක්තියක් නො වේ.

ශ්‍රීමත් ජෝන් ඇන්ඩර්සන් මහතා 1917 දී කෑගලු කොමිසම් වාර්තාව ප්‍රසිද්ධියට පත් කළේ ය. ඒ සමඟම මෙරට සිංහල සහ දමිළ ජන කොටස් දෙක ශ්‍රීමත් ජේම්ස් පීරිස් සහ ශ්‍රීමත් පොන්නම්බලම් අරුණාචලම් යන වියතුන් දෙදෙනා ගේ නායකත්වය ඇතිව රාජ්‍ය පාලන ව්‍යවස්ථාවේ පරිවර්තනයක් ඇති කිරීම සඳහා ව්‍යාපාරයක් ඇරැඹූහ. "රිෆෝම් ලීග්" නමින් අරඹන ලද මෙම සංවිධානය ලංකා ජාතික සංගමය හෙවත් "සිලෝන් නැෂනල් කොන්ග්‍රසය" බවට පත්විණි.

ලංකා ජාතික සංගමයේ පෙරමුණ ගෙන ක්‍රියා කළෝ කිතුනුවෝ ය. එහි ප්‍රථම සභාපති වූයේ දමිළ හින්දු බැතිමතකු වූ පොන්නම්බලම් අරුණාචලම් මහතා ය. දෙවැනි වසරේ හෙවත් 1921 පත් කෙරුනු විධායක මණ්ඩලයේ එක් සම ලේකම්වරයකු හැර සෙසු නිලධරයන් සියල්ලෝ ම කිතුනුවෝ වූහ. සභාපති ලෙස පත් වූ ප්‍රථම සිංහලයා වූයේ ශ්‍රීමත් ජේම්ස් පීරිස් මැතිඳුන් ය. සම ලේකම් ධූරය කතෝලික ඊ. ටී. ද සිල්වා මහතා වෙත පැවැරුණි. එතුමා ප්‍රථම භාණ්ඩාගාරික ලෙසද පත්වීම් ලද්දේ ය.

☛ 15 පිටුවට



# මූල්‍ය අරමුදලේ කොන්දේසි නිසා ආණ්ඩුව දෙලොවක් අතර

ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඉල්ලා සිටි ඩොලර් මිලියන 1.5 ක ණය මුදල සැණින් මහබැංකු අධිපතිවරයා මාධ්‍ය ගෙන්වා පැවසුවේ ලංකාවේ විදේශ සංචිත ශක්තිමත් බැවින් තවදුරටත් ජාත්‍යන්තර මුල්‍ය අරමුදලේ සමීපස්ථ ණය පහසුකම් අවශ්‍ය නොවන බවයි. මේ ප්‍රකාශය සාවද්‍ය නැත. ලංකාවේ විදේශ සංචිත ප්‍රමානය මහ බැංකුවේ සංඛ්‍යා ලේඛනයන්ට අනුව ඩොලර් බිලියන 7 ක මට්ටමකට ළඟා වී ඇත. මේ තත්ත්වය නරක නැත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් මීට ඉහතදී ඩොලර් බිලියන 2.5 කට ආසන්න ණය මුදලක් වාරික 8 කින් ආණ්ඩුවට ලබාදුන් අතර මෙය තවත් ඩොලර් බිලියන 1.5 කින් වැඩිකරන ලෙස ආණ්ඩුව ඉල්ලා සිටියේ 2012 දෙසැම්බර් මාසයේ සිටයි. එහෙත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමාලෝචන කණ්ඩායම කියා සිටියේ සාර්ව ආර්ථික කළමනාකරණය සහ, දිගින් දිගටම ණය ගැටුම මත රටට එන විදේශ විනිමයෙන් වැඩි ප්‍රමාණයක් ණය සේවා පිරිවැය සඳහා ගෙවීමට සිදුවුවහොත් බරපතළ ණය උගුලකටත්, එමෙන්ම එදිනෙදා කටයුතු සඳහා මූල්‍ය ස්ථාවරභාවය නොමැති වන බවයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යෝජනා ප්‍රතික්ෂේප කිරිම හරහා ඕනෑම අයකුට සිතට එන ප්‍රශ්නය වන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීපස්ථ ණය අනවශ්‍ය නම් ආණ්ඩුව එය ඉල්ලා සිටියේ ඇයිද යන්නයි. මීට පෙර ආණ්ඩුව ජාත්‍යන්තර මුල්‍ය අරමුදලේ ණය ඉල්ලා සිටියේ විදේශ විනිමය සංචිතය ඩොලර් බිලියන 3 කටත් අඩුමට්ටමකට පැමිණි අවස්ථාවකදීය. එහෙත් සංචිත පිළිබඳව ගැටලුවක් නොමැති අවස්ථාවක ආණ්ඩුව මේ සා විශාල මුදලක් ජාත්‍යන්තර මුල්‍ය අරමුදලෙන් ඉල්ලා සිටියේ ඇයි?

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගන්නා ණය සැබවින්ම භාවිත කරන්නේ සංවර්ධන කටයුතු සඳහාද නොඑසේනම් මින් පෙර ලබාගත් බැඳුම්කර පියවීමටද?

ඉහළ ණය පොලී වාරිකයක් ගෙවමින් සහ දෙගුණයකටත් වඩා වැඩි වෙළෙඳ හිඟයකට මුහුන දෙමින් 2010-2011 වසරවලදී 8% ක වර්ධනයක් සහ පසුගිය වසරේ සියයට 6% ක වර්ධනයක් ලැබුවේ කෙසේදයි ප්‍රශ්න කරනු වටී. මහබැංකුව මාධ්‍යවලට පැවසු ආකාරයට මහබැංකුව සතු සංචිත ප්‍රමාණය 2012 වසර අවසනට ඩොලර් බිලියන 6.87 කි. වාණිජ බැංකු සතු ඩොලර් වත්කම්ද එකතු කිරීමෙන් රටේ සමස්ත විදේශ වනිමය වත්කම් ප්‍රමාණය ඩොලර් බිලියන 8.36 ක් ලෙස ගණනය කළ හැක.

මහබැංකුව සඳහන් කරන ආකාරයට 2012 අවසන් වන විට අප රටේ දළ සංචිතය මාස 4.3 ක ආනයන සඳහා ප්‍රමාණවත් බව කියැවිණි. සමස්ත විදේශ විනිමය වත්කම් සලකා බලන විට එය මාස 5.3 ක් ආනයන සඳහා ප්‍රමාණවත් බව මහබැංකුව පෙන්වාදී ඇත. එසේනම් ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ඉල්ලා සිටියේ ඇයි? සංචිතයෙහි පවතින මුදල් වසර පුරාම විදෙස් ණය පොලී ගෙවීමට යොදා ගැනේ. එබැවින් ශුද්ධ සංචිත ප්‍රමාණය පවතින්නේ ඩොලර් බිලියන 3 කටත් අඩු මට්ටමකය. අනෙක් අතට සංචිත මුදල් රජයේ වියදම් පියවා ගැනීමට යොදාගන්නටද නොහැක. එහෙත් රටක විදේශ වියදම් සංචිතය සැබෑ ලෙසින්ම ශක්තිමත්දැයි දැන ගැනීමට හැකි වන්නේ රටවල ශුද්ධ විදේශ සංචිතය පරීක්ෂා කිරීමෙන්ය. එහෙත් අවාසනාවට විදෙස් ණය පොලී ගෙවීමට විදෙස් සංචිතය භාවිත කරන ආකාරය සහ කොපමණ මුදලක් සංචිතයෙන් ණය පොලී ගෙවීමට භාවිත කරනවාද යන්න මහබැංකුව පවසන්නේ නැත. එබැවින් සැබෑ ලෙසට පෙනීයන්නේ ණය පොලී අඩුකළ විට වර්තමාන ශුද්ධ සංචිතය සැබවින්ම දුර්වල බවය. ශුද්ධ විදේශ විනිමය සංචිතය තුළ ඇත්තේ ඩොලර් බිලියන 3 කටත් අඩු අගයක් නම් මාස කිහිපයක ආනයන සඳහා විදේශ සංචිත ප්‍රමාණවත් බව කියා සිටීම මුළුමනින්ම සාවද්‍ය ප්‍රකාශයකි.

එමෙන්ම වාර්ෂිකව විදේශ විනිමය භාවිත කර සිදුකරන වියදම් සලකා බැලීමේදී ලංකාව අපනයනය කර කොපමණ විදේශ විනිමයක් උපයාගත්තේද? සංචිත තුළ වැඩි වශයෙන් ඩොලර්වලින් ලබාගත් ණය පෙන්නුම් කරන බැවින් සැබෑ ලෙසට රටට ඉතිරිවන ඩොලර් ප්‍රමාණය සුළු එකකි. රටේ සංචිතය ශක්තිමත්ව නොතිබෙන විටෙක උගන්ඩාවේ ජනතාවට පානීය ජලය ලබාදීමට ඩොලර් මිලියන 150 ක් වැයකිරීම රජයට කවර අයුරකින් සාධාරණීය කරන කළ හැකිද? චීනයෙන් ලබාගෙන ඇති ණය සඳහා ගෙවන වාරිකය කිසිදු අයකු නොදනී. රටේ ණයගැති භාවය පරීක්ෂා කරන විට පෙනීයන්නේ 2005 දී එය ඩොලර් බිලියන 10.52 කි.

2012 වන විට මේ අගය දෙගුණයකින් වර්ධනය වී ඩොලර් බිලියන 22.82 ක් බවට පත්ව තිබේ. මේ ගණනය මුළුමනින්ම නිවැරදි නොවන බව ආර්ථික විශ්ලේෂකයන් පවසන්නේ රජය ලබා ගත් ඇතැම් ණය, රජයේ බැංකු ලබාගත් ඩොලර් ණය මීට අන්තර්ගත කොට නැති හෙයිනි. ඔවුන්ගේ අදහසට අනුව මේ අගය ඩොලර් බිලියන 30 කට ආසන්නය. කෙසේ වෙතත් ආණ්ඩුව ගත්තද රාජ්‍ය බැංකු ගත්තද අවසනදී ණය ගෙවීමේ වගකීම පැවරෙන්නේ මේ රටටය.

2005 වසරේ සිට දෙගුණයකින් වර්ධනය වු විදේශ ණය ප්‍රමාණය සහ ණය සේවා පිරිවැය නිහඬ ඇඩි බලපෑමක් ආර්ථිකයට එල්ලකරමින් සිටී. මුදල් අමාත්‍යාංශ දත්ත පවසන ආකාරයට විදේශීය ණය ගෙවීම් සඳහා 2011 දී ඩොලර් මිලියන 954.5 ක් වෙන්කරන ආණ්ඩුව 2012 පවසන පරිදි ඒ සඳහා ඩොලර් මිලියන 1539 ක් වෙන්කර ඇත. 2012 තුළ පෙන්වන මේ එකවර වැඩිවීම සඳහා කෙටි කාලීන ණය ගැනීම් වැඩිවශයෙන් ඉවහල්ව ඇත. වර්තමානයේදී ණය සහ පොලිය ගෙවීම් සඳහා දළ වශයෙන් සමස්ත අපනයන ආදායමෙන් 20% ක වටිනාකමක් වෙන්කළ යුතුය. මුදල් අමාත්‍යාංශය පවසන ආකාරයට කෙටි කාලීනව ලබාගත් ණය මුදල්වලින් වැඩි ප්‍රමාණය වරාය. මහාමාර්ග, ගුවන් තොටුපළ ව්‍යාපෘති සඳහා යොදවා ගෙන ඇත. යටිතළ පහසුකම් සඳහා ආයෝජනය කළ යුතු බවට තර්කයක් නැත. එහෙත් කෙටි කාලීන ආයෝජන දිගු කාලීන ව්‍යාපෘති සඳහා යෙදවූ විට එමගින් කෙටිකාලීනව ආදායම් නොලැබෙන බැවින් එම ණය මුදල් පියවීමට විකල්පයන්ට යොමුවීමට සිදුවේ. එබැවින් කෙටි කාලීන මූල්‍ය පහසුකම් සඳහා ගෙවිය යුත්තේ කුමන ආයෝජනයන්ටද යන්න පිළිබඳව ප්‍රමුඛතා ලැයිස්තුවක් ආණ්ඩුවට තිබිය යුතුය.



## මාසික ආර්ථික විමසුම

ඉදිරිපත් කිරීම ප්‍රවීන ආර්ථික විශ්ලේෂක
**වින්සන් මර්වින් ප්‍රනාන්දු**

# ආර්ථික සංවර්ධනයට වැදගත්වන ජනවාර්ගික හා ආගමික සංහිඳියාව

**රටක ආර්ථික සංවර්ධනයට ආර්ථික හා දේශපාලන ස්ථායිතාව වැදගත් වන්නේ යම් සේද, එයට ජනවාර ගික හා ආගමික සංහිඳියාවද අතිශයින් ම වැදගත්වන බව ලංකා ඉතිහාසය පුරා ම සිදු වූ සිදුවීම්වලින් පෙන්වාදෙයි.**

සිංහල රාජ්‍ය වංශයේ ලංකාව පාලනය කළ රජවරුන් 185 දෙනෙක් විය. ඒ කාලය තුළ වරින් වර ලංකාවේ ආර්ථිකයට පීඩනයක් ඇතිවූයේ බාහිර ආක්‍රමණවලිනි. සොලී, පාණ්ඩ්‍ය, චෝල, මාඝ ආක්‍රමණ ඒ අතර ප්‍රධාන විය. ඊට පසු කාලවල ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට යහපත් මෙන්ම අයහපත් බලපෑම් ද එක් වූයේ 1505 සිට වසර 153 ක් රට පාලනය කළ පෘතුග සින් 1658 සිට වසර 140 ක් රට පාලනය කළ ලන්දේසින් හා 1798 සිට වසර 150 ක් රට පාලනය කළ ඉංග්‍රීසින් යන විදේශ ආණ්ඩු යටතේය.

ශ්‍රී ලංකාව සිංහල රටක් යයි පවසන්නේ ප්‍රථම දේශීය රජු වූ පණ්ඩුකාභය රජතුමා යටතේ සිංහල ජාතිය ආරම්භ වු නිසාය. ශ්‍රී ලංකාව බෞද්ධ රටක් ලෙස දක්වන්නේ දේවානම් පියතිස්ස රජු දවසේ ශ්‍රී ලංකාව නිල වශයෙන් බුදු දහම අත්පත් කරගත් නිසාය. එදා පටන් ශ්‍රී ලංකාව සිංහල බෞද්ධ රාජ්‍යයක් බවට පත්විය. මේ තත්ත්වය වෙනස් වුයේ 12 වන හා 13 වන සියවසේ මේ රටට මුස්ලිම් ජනතාවගේ පැමිණීමත් සමගය. දකුණු ඉන්දියාවෙන් පැමිණි මේ මුස්ලිම් ජනයා කතා කළේ දෙමළ භාෂාවය. ඔවුන් ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශවල තම පදිංචිය ස්ථාපිත කර ගෙන තම ජාතික අනන්‍යතාව රැක ගත් අතර, ඔවුන් සිංහල ජාතියට එක් වුයේ නැත. සිංහල භාෂාව කථා කළේ නැත. ශ්‍රී ලංකාව තුළ ඒ වන විටත් දෙමළ ජනයා විශාල වශයෙන් සිටියේ නැත. ඔවුන් සංක්‍රමණිකයින් ලෙස පැමිණ ආපසු තම දේශයන්ට ගිය පිරිසක් පමණකි. යාපනයේ එකල රාජ්‍යයක් තිබුනත් එහි රජු ආර්ය චක්‍රවර්ති නම් වූ සිංහල රජ කෙනෙකි.

ඒ අනුව යාපනයේ සිටියේ සිංහල, කේරළයෙන් පැමිණි මලයාලම් සහ මුස්ලිම් යන පිරිස් පමණි. ලන්දේසි යුගයේ දී ලංකාවට දෙමළ ජාතිකයින් පැමිණ ඇත. ඒ දුම්කොළ වගාව සඳහාය. මේ ආකාරයට රට තුළ සිංහල, මුස්ලිම්, මලයාලම් සහ දෙමළ ජන කොටස් සුහදතාවයෙන් ක්‍රියා කර ඇත. සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ එක්සත්ව එක්සිත්ව ජීවත්වුනු විවිධ ජාතින් හා විවිධ ආගමිකයින් තුළ 'ජාතිවාදි' 'ආගමිකවාදි' භේද ඇතිවූයේ ඉංග්‍රිසින්ගේ පාලන සමයේය. රට තුළ දෙමළ ජාතිවාදයට මුල පිරුවේ 19 සියවසේ මුලභාග යේදීය. එය උත්සන්න වූයේ ප්‍රභාකරන්ගේ නායකත්වය යටතේය. ශ්‍රී ලංකා මෑත ඉතිහාසයේ 1983 කළු ජූලිය වැනි බිහිසුණු යුගයක් 1915 දී ද උදා වූ ආකාරය පෙබරවාරි 17 දා ඥානාර්ථ ප්‍රදීපයට සුවිශේෂ ලිපියක් සපයන අතිඋතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ 'බෞද්ධ - මුස්ලිම් ගැටුම' නමින් එය හඳුන්වයි.

1948 දී ඉංග්‍රීසි පාලනයෙන් රට මුදවාගෙන 2013 පෙබරවාරි 4 දා ට වසර 65 ක් සම්පූර්ණ වුවද 'ජාතිවාදි සාපයෙන්' හා 'ආගම්වාදි සාපයෙන්' රට මුදවා ගැනීමට තවම සමත් වී නැත. ඉංග්‍රීසින් විසින් ජාතිය තුළ දෙමළ ජාතිවාදි ත්‍රස්තවාදය මගින් රටේ ආර්ථික වර්ධනය වර්ෂයකට 2% බැගින් වසර 30 ක් තුළ 60% කින් ආපස්සට තල්ලු කිරීමත්, දහස් සංඛ්‍යාත ජනතාවක් මරා දැමීමත්, දහස් සංඛ්‍යාත ජනතාවට උන් හිටි තැන් අහිමි කිරීමත් තුළින් සිදුකළ විනාශය සුළු පටු නොවීය. එම දරුණු ත්‍රස්තවාදය මුළුමනින්ම නිම කොට වසර 4 ක් සපිරෙන මේ මොහොතේ දීත් එහි සෙවනැලි පහව ගොස් නැත. මාර්තු මාසයේ එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ ශ්‍රී ලංකාවට එරෙහිව ගෙනෙන යෝජනා ඇතැම්විට ශ්‍රී ලංකා ආර්ථිකය අඩපණ කිරීමට හේතුවිය හැකිය. එම අවාසනාවන්ත සිද්ධින් අතරට කිසිවකු නොසිතූ ආකාරයට 'මුස්ලිම් - සිංහල' අරගලවලට අර ඇඳීමට තුඩු දෙන ආකාරයේ පසුබිමක් 'හලාල් සහතිකය' හරහා මේ වන විට නිර්මාණය වෙමින් පවතී.

ඉස්ලාම් ධර්මයේ සඳහන් වන ආකාරයට හලාල්' යන්නෙහි සරල තේරුම් 'අනුමත දෙය' යන්නයි. 'හරාම්' යනු 'තහනම් දෙය' යන්නයි. අනුමත දේ පිරිසුදු විය යුතු අතර අනුමත නොවන දේ අපිරිසිදුය. ආහාර වර්ග අතර අනුමත නොවන දේ ලෙස සලකන්නේ මියගිය සතුන්ගේ මාංශ, ලේ, ඌරු මාංශ යි. ඒ අතරට සියලුම වර්ගවල මත්පැන් හා මත්ද්‍රව්‍ය ඇතුළත් වේ. පුරුෂ පක්ෂයට රත්රන් ආභරණ අනුමත නැත. කාන්තා පක්ෂයට සිය සිරුර ප්‍රදර්ශනය වන පරිදි ඇඳුම් පැළඳුම් අනුමත නැත. යම් රැකියාවක යෙදීම අත්‍යවශ්‍ය වන අතර සිඟමන් යැදීම නුසුදුසු ක්‍රියාවකි. අනාචාරය සහ විවාහයට පෙර ලිංගික සබඳතා තහනම්ය. වෙනත් ආගමක කෙනකු සමග විවාහ වීම තහනම්ය. මේ වැනි නියමයන් ඉස්ලාම් ධර්මයේ පමණක් නොව වෙනත් ආගම්වලද ඇත. නිදසුනක් වශයෙන් ක්‍රිස්තියානි ආගමිකයින්ට නියමිත 'දසපනත' එවැනි එකකි. ඒවා ඒ ඒ ආගමික අය ස්වෙච්ඡාවෙන් පිළිපදී. වෙනත් තැනැත්තන් එය එසේ සිදුකළ යුතු බවට නියෝග හා උපදෙස් දෙන්නේ නැත. මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාව ද එම පිළිවෙත සුරකින ලදි.

එකල මුස්ලිම් ජනතාව තම අවශ්‍යතා සඳහා ආහාර පාන වෙළෙඳසල්වලින් මිලදී ගන්නේය. ඒ කාලයේ 'හලාල්' සංකේත තිබුණේ නැත. සිංහල වෙළෙඳ සල්වලින් මුස්ලිම් ජනතාව ද මුස්ලිම් වෙළෙඳ සල්වලින් සිංහල ජනතාවද කිසිම භේදයක් නැතිව අවශ්‍ය දේ මිලදි ගත්තේය. එහෙත් වෙළෙඳ තරගකාරීත්වය, අලෙවි උපක්‍රම, වැනි හේතු නිසා හලාල් ප්‍රශ්නය අද වන විට ජාතික ගැටලුවක් බවට පරිවර්තනය වෙමින් පවතී.

ඊට හේතුව සමස්ත ලංකා ජමියතුල් උලමා සංවිධානය මගින් නිකුත් කරන හලාල් සහතිකය මුස්ලිම් ජනතාව මෙන්ම අනිකුත් ජන කොටස් ද ලබා ගත යුතු බව ප්‍රකාශ වීමත් සමගය. හලාල් ආහාර හා නිෂ්පාදන මිලදී ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ නිදහස ඕනෑම කෙනකුට ඇති නමුත් එය කිසිවකු මත බලෙන් පැටවීමට ඉඩ නොදෙන බව අමාත්‍ය නිමල් සිරිපාල මහතා 7 දා පාර්ලිමේන්තුවේදි පවසා ඇත. මේ හරහා රට පුරා ඇතිවේගෙන යන නොසන්සුන්තා මඟ හැරවීමට ජනාධිපති තුමාද මැදිහත් වී ඇත. කිසිදු ආකාරයක ජාතිවාද හා ආගම්වාදි කලබල ඇතිවීම වැළැක්වීම සඳහා සිය පූර්ණ අවධානය හා අධීක්ෂණය යොමු කොට ඇත.

රටේ සෑම පළාතක්ම ආවරණය වන පරිදි මේ පිළිබඳව සුපරීක්ෂාකාරිව අධීක්ෂණය කරන ලෙස දැඩි විමසිල්ලෙන් සිටින ලෙසට පොලිසියට හා දේශපාලන නායකයින්ට උපදෙස් දී ඇති බවත් තිස් වසරක ත්‍රස්තවාදයෙන් බැට කා දිනාගත් සාමය රැක ගැනීමට රජය ප්‍රමුඛතාවය ලබාදී තිබෙන බවත් ඒ නිසා කිසිදු ජාතිවාදි හෝ ආගම්වාදි ක්‍රියා වර්ධනය කරන කිසිදු කටයුත්තකට රජයෙන් සහයෝගයක් නොලැබෙන බවත් ප්‍රකාශයට පත් කොට ඇත.

එම ප්‍රකාශය මත ඉදිරියේදී මේ හා බැඳි ගැටලු සාකච්ඡා කොට විසඳාගත යුතු අතර එය යළිත් අර්බුදයක් යුද්ධයක් බවට පත්කර රට විනාශ නොකිරීමට වගබලා ගැනීමට වගකිව යුතු සියලු දෙනාම වග බලා ගත යුතු යයි අපි ඉල්ලා සිටිමු.

## දැල්වෙන පහන්

# නිහඬ කලාකරුවකුගේ නික්මයෑම

වැලිකන්න ග්‍රාමයේ උපත ලද ආර්. ඩී. ජෝසප් මහත්මා වසර 96 (අනු හයක්) ආයු වළඳා දිවියෙන් සමුගත්තේය. ගමේ පාසලින් අකුරු උගත් ඔහු කලාවට දක්ෂයෙක් විය. මා නිරිපොල ගමේ අකුරුකරමින් සිටින අවධියේ මුල්ගුරුතුමා වූයේ වැලිකන්න ගමේ ආර්. ඩී. මර්සලින් මහත්මාය.

එතුමා නිරිපොල පාසලේ දියුණුව සඳහා ආධාර උපකාර ලබාගැනීමේ බලාපොරොත්තුවෙන් නිරිපොල ගම්වාසින්ගේ උදව් ඇතිව ටීටර් මඩුවක් තනා විකට ශිල්පීන්ද රංගන ශිල්පීන්ද වැලිකන්න ග්‍රාමයෙන් රැගෙන විත් වේදිකාවේ රඟදැක්වූ අයුරු මගේ සිතේ රැඳී ඇත. එහිදී ආර්. ඩී. ජෝසප් මහතාද විකට කථා කියමින් වේදිකාවේ රඟ දැක්වූ අයුරු බාලවියේ සිටි මට මතකය.

ඒ ගුවන් විදුලිය (රෙදෙව්ව ඝ්ඝසද) ටෙලිවිෂනය ගම්වල නොතිබුණු අවධියයි. චතාරික කාලයේදී ගමේ පවුල්වල උදවිය එකට එක්වී ලතෝනි කීම නැතිනම් පසන් ගායනය කර ජේසුගේ කුරුසියේ මරණය සිහිකර දුක්වීම සිරිතකි. එම පසන් ගායනයේද ඔහු දක්ෂයෙක් වී සිටියේය.

ඔහුට පින්සලද අතට හුරුය. ඔහුගේ පින්සලෙන් හැඩගැන්වුනු, ඔපගැන්වුනු ගෙයක් දොරක්, පුටුවක්, අල්මාරියක් ගමේත් පිට ගම්වලත් අලංකාරවී දිස්න දෙනවා ඇත.

දෙව්මැදුරට එන යන පියතුමන්ලාගේද සිත දිනාගත්, හිත්ගත් ඔහු විශ්වාසවන්ත මහතෙක් විය.

දෙව් මැදුරේ පිළිසකර වැඩක් හෝ වෙනත් වැඩක් ඇත්නම් ඔහුගෙන් විමසන්ටත් මුල් තැනදී වැඩක් කරවාගන්නටත් පියතුමන්ලා සැදී පැහැදී සිටියහ.

ඔහු කලුරිය කළ මොහොතේ සිටම වග මීසමේ මින්පෙර සේවය කළ පියතුමන්ලා පැමිණියේ ඔහුගේ දේහයට ආසිරි පුදකරන්නටය. ඔහු වෙනුවෙන් යදින්නටය. ඔහුගේ පවුලේ අයට සොව පළකරන්නටය. ඔහු මියගිය මොහොතේ සිට භූමදානය කරන තුරු ගමේ සැම දෙනාත් වෙනත් ගම්වල ඔහු ගැන දන්න හඳුනන අයත් රෑ දවල් පිරිසිටියේ සොව පළකරන්නටය.

ආර්. ඩී. ජෝසප් මහත්මා තමාගේ ආදර පුතණුවන් වූ ආර්. ඩී. සෙල්ටන් මහත්මාව ගමට, රටට දායාද කර තමාගේ හිඩැස් පුරවන්නට පත්කර ඔහු සමාදානයේ සැතපුණි.

ආර්. ඩී. ජෝසප් මහත්මාගේ වියෝවීම ගැන දුක්වෙන ඔහුගේ ආදර බිරිඳටත්, දුවනියටත්, පුතණුවන්ටත්, බෑනණුවන්ටත්, ලේලියටත්, ඥාතීන්ටත්, සොව පළකර සිටිමු.

ආර්. ඩී. ජෝසප් මහත්මාගේ ආත්මයට සදා සාමය පතමු.

වරලස අක්බඹරු පසුවුනු තුරුණු වියේ
රඟ දක්වන අයුරු දකිමින් ඇවිත් කරළියේ
අත්තල නාදකර සැම දෙනම තුටුවුයේ
පාසල් යන වයසෙ සිටි මට මෙය මතක තියේ

තම පින්සලෙන් හොඳ හැටියට අතට හුරු
පුටු අල්මාරි බඩු ගේ දොරද
නෙක'යුරු ඔප කෙරු
කිසිවෙක් නොවුනි මෙගමේ ඔහුට සමකෙරු
දිස්නය දේවි ඔහු අතින් ඔබ කෙරූ

නිමකරනතුරු ඉස්පාසුවක් නැත
වැඩක් ඇත්නම් ඔහුට පැවරුව
දෙව්මැඳුරෙ වැඩක් වුව එය
හොඳින් අතගසා ඉටු කෙරුව
කතා බහ කළෙත් පියතුමන්ලට
ගරු සරුව කීකරුව
ඔහුගෙ මරණය අසාගෙන වැඩියෙ
පියතුමන් මීසම්පති කම් දැරුව

චතාරික කාලයේදී පසන් ගායනයේද නියැලුණු
සවන් දුන් අයගෙ දෙනෙතින් කඳුළු බිඳු මුතුවගේ හැලුණු
නිහඬවී හුන් කලාකරුවා සමාදානයෙ සැතපුණු
තාරකාවකි ඔහුත් වැලිකන්න නම් ගමේ දිලුණු

**බර්නාඩ් බොතේජු**

# එකම පවුලෙන් සම්බුදු මග සොයා ගිය රංජනී සහ ක්‍රිෂාන්ති සොහොයුරියෝ

**තාපබලාගාරයක් නිසා සිරිලක පුරා ප්‍රසිද්ධියට පත්වූ ගමක් හැටියට අපට කෙරවලපිටිය හඳුන්වන්නට හැකිය. වත්තල හැඳලට නුදුරුව කාගෙවත් අවධානයට ලක්නොවූ මෙම ගම් පියස ගැන අද නොදන්නා කෙනෙක් නැහැ. ඥානාර්ථ ප්‍රදීපාලෝකය තුළින් ආලෝකමත්වන මෙම දැල්වෙන පහන් ද්වන්ධය මෙදා අපට මුණගැහුණෙත් කෙරවලපිටිය කෙළවරකින්. හැඳල කෙරවලපිටිය පැත්තෙ එකම පවුලකින් යහපත් එඬේරා නිකායෙ සිස්ටර්ලා දෙන්නෙක්ම බිහිවුණා කියන කතාවත් අරුමයක් නෙමෙයි. ඒ තමයි, රංජනී සහ ක්‍රිෂාන්ති දෙසොහොයුරියෝ.**

මාටාගොඩ ගමේ උපන් රංජනී සහ ක්‍රිෂාන්ති තමන්ගේ මූලික අධ්‍යාපනය ලැබුවෙ කෙලවරපිටිය රෝ. ක. පාසලෙන්. අද රටටම එළිය දෙන කෙලවරපිටිය ගමේ කතෝලික පාසල නිසා එදා කිතුනු සභාව පුරා දහම් ආලෝකයක් දැල්වුණ බවට මේ පැවිදි දෙසොයුරියෝ කදිම සාක්ෂියක්. ඒ ගැන උදම් අනමින් රංජනී සහ ක්‍රිෂාන්ති ගරු සොහොයුරියන් දෙපළ තම අදහස් ප්‍රකාශ කළේ මෙහෙමයි.

"අපේ දෙමාපියන්ට අනතුරුව පැවිදිබිම කරා අප යොමුකළ ආදර්ශවත්, කාරුණික යහපත් එඬේරා සිස්ටර්ලා කිසිදාක අමතක කරන්න බැහැ. මේරි ඇල්බින්, ස්ටැනිස්ලාවුස්, අර්සලා සහ මදර් මර්සි වැනි ගරු පැවිදි සොහොයුරියන් අපේ ජීවිත මාරුවීම් වලට තදින්ම බල පෑ බව කිව යුතුයි. පාසල් වියේ සිට දේව කැඳවීම නමැති වටනා බීජය අප හදවත් තුළ රෝපණය කෙළේද යහපත් එඬේරා නිකායට අයත් ඒ ගරු ගුරු මව්වරුන් බව මෙහිදී සඳහන් කළ යුතුයි.

එදා මාටාගොඩ පාරේ අංක 107 දරන නිවසෙ ජීවත්වූ ෆොන්සේකා පවුලෙ ගෑනු දරුවන්ම හත්දෙනයි. මල් හතයි කියලයි කව්රුත් කිව්වෙ.



මාරි රංජනී හයවැන්නා. මේරි ක්‍රිෂාන්ති තමයි බඩ පිස්සි. ඒ දවස්වල මේ මල්හතේ ලස්සන පවුල ගමටම ආඩම්බරයක් වුණා කීවොත් බොරුවක් නෙමෙයි. පියා විලියම් ෆොන්සේකා. ඒ කාලෙ ප්‍රසිද්ධ ගෘහනිර්මාණ ශිල්පියෙක්. මව මොනිකා. ළමයි හත් දෙනකුගේ වැඩ රාජකාරි කරන එකත් ලෙහෙසි වැඩක්ද. මේ අම්මා ගෙදරටම වෙලා හිටියා. හැබැයි ඇය ආදර්ශවත් මවක් සහ බිරිඳක්. හැමදාම හවසට ජපමාලය කියන එක නම් මේ පවුල අමතක කළේ නැහැ. අපේ අම්මගෙයි තාත්තගෙ යි මේ පවුලේ ඔරසන් කීම අපේ අරමුණු කරා යෑමට තදින්ම බලපෑවා කියලා රංජනී සිස්ටර් කීවෙ කිසිම පැකිළීමක් නැතිවයි.

එක වසර සිට පහ වසර දක්වා කෙලවරපිටිය රෝ. ක. පාසලෙන් මූලික අධ්‍යාපනය ලැබූ මේ අක්කා නගෝ දෙපළ ඊළඟට වැඩිපුර අධ්‍යාපනය සඳහා ගියේ නායකකන්දේ යහපත් එඬේරාගේ කන්‍යාරාමයටයි. රංජනී සහ ක්‍රිෂාන්තිට මෙහිදී අපූරු චරිතයක් මුණගැසුනා. වචනයෙන් ක්‍රියාවෙන් සහ යාච්ඤාවෙන් මේ දැරියන්ගේ සිත් දිනාගෙන පැවිදි ජීවිතයේ වටිනාකම් පහදා දුන්නෙ මේ තපෝවෘද්ධ වයෝවෘද්ධ තැනැත්තියයි. ඒ තමා අදටත් රංජනී සිස්ටර් ඉමහත් කෘතඥතාවයකින් සිහිපත් කරන මදර් මර්සි සොහොයුරිය. අපේ ඉලක්ක කරා යෑමට යහපත් එඬේරාණන් වූ ස්වාමීන්වහන්සේ අපව භාරදුන් තැනැත්තිය හැටියට මේ අක්කා නගෝලා නායකකන්ද මඩමේ මදර් මර්සි කෙරෙහි ඇත්තේ බලවත් භක්ත්‍යාදරයක්.

අප හැමෝගෙම ජීවිත මුල සිට අග දක්වා දයාබර දෙවියන්වහන්සේ විසින් සැලසුම් කර ඇති බව අපේ විශ්වාසයයි. "නුඹ උපදින්නත් පෙර මම නුඹ තෝරාපත් කළෙමි"යි සමිඳාණන් අපට පවසනවා. අප විවිධ දේ කරන්න සූදානම් වුවත් අන්තිමේදී සිද්ධවෙන්නෙ ක්‍රියාත්මක වන්නේ දේව සැලැස්මයි. ඒ අනුව 1979 මැයි 30 වැනිදා මාරි රංජනී බණ්ඩාරවෙළ යහපත් එඬේරාගේ කන්‍යාරාමයට පා තැබුවා. අක්කා ගිය ගමන අනුගමනය කරමින් පෙරුම්පුරපුරා සිටි මේරි ක්‍රිෂාන්ති 1984 මැයි 12 වැනි දින මෝදර එම නිකායේම නව තාපසිකා ගෘහයට පිවිසියා. දෙදෙනාගේම පූර්ව වේදහාර පුහුණු තෙවසර ගෙවී ගියේ ඇඟපතට නොදැනියි. 1982 පෙබරවාරි 27 දින රංජනීත්, 1987 ජූලි 31 දින ක්‍රිෂාන්තිත් උපන් ගමටත්, මීසමටත් දෙමාපියන් ගුරුමෑණිවරුන් හා සමස්ත යහපත් එඬේරා නිකායටත් ගෞරවයක් ආඩම්බරයක් හා අභිමානයක් ළඟාකර තම නිකායේ ස්ථිර සාමාජිකයන් බවට පත්වෙමින් වේදහාර දුන්නා.

මෙම අක්කා නගෝලා දෙපළම තම ධර්මදානීය මෙහෙවර සඳහා තෝරාගත්තේ ගුරු වෘත්තියයි. වසර 31 ක දීර්ඝ කාලයක් ගුරු වෘත්තියෙහි නියැලුනු ගරු රංජනී සොහොයුරිය කඩලාන, කොම්පඤ්ඤවීදිය, වැලිග ම්පිටිය, වහකෝට්ටේ, බේරුවල, මෝදර සහ නායකකන්දේ කරති සේවාවන් අමරණීයයි. සිස්ටර් ක්‍රිෂාන්තිගේ මහඟු සේවාව ලබාදුන් ස්ථාන හැටියට කටුකුරුන්ද, වැලිවිට, දියලගොඩ, නායකකන්ද සහ වත්තල හඳුන්වා දෙන්න පිළිවන්. අද ගරු රංජනී සොහොයුරිය නායකකන්ද ආවේමරියා සහ ගරු ක්‍රිෂාන්ති සොහොයුරිය වත්තල දිව්‍ය හෘදයේ කන්‍යාරාමයේ විශ්‍රාමිකව පසුවනවා.

ලක්බිමට ලවණක් හා කිතු සසුනට ආලෝකයක් වෙමින් දසදහස් ගාණක දරු දැරියන්ට නැණ නුවණ ලබාදෙමින් සම්බුදු මිදි උයනේ දැල්වෙන පහන් බවට පත්වූ මෙම දිරිය අක්කා නගෝ සිස්ටර්ලා දෙපළ වෙත තව තවත් දේවාශිර්වාද ගලා ඒවායි ඉතසිතින් ප්‍රාර්ථනා කරමු.

**මොරිස් බොල්ලෑගල**

# නර්බෝනා සුවඳ සත්සරට කැවූ පන්හිඳ

**සිංහල ගීත සාහිත්‍යයේ පෝෂණය හින්දුස්ථානි කර්ණාටක හා බටහිර සංගීතයේ ආභාෂයෙන් නොඅඩුව ලැබුන බව අවිවාදයෙන් පිළිගත යුතුව ඇත.**

ඒ අයුරුම හෙලයේ සකලවිධ කලාවන්ගේ පෝෂණයට කිතුනු කලා කරුවන් අතින් ඉටුවී ඇති මෙහෙයද අමතක කළ නොහැක. නමුත් කණගාටුවට කරුණ ඔවුන් පිළිබඳව අමතක වී යාමක් සේම උප්පැන්නයක් නැති කලාවක් වෙනුවෙන් ඔවුන් අමතක කර දැමීමත්ය. එය එසේ සිදුවෙතත් කිතුනුවන් වූ අපට අන් ලබ්ධිකයනට වඩා, කලාවට, සංගීතයට, සමීපතාවයක් හා නිපුනතාවයක් ඇතැයි කීවොත් සත්‍යයක්මය. එය එදා මෙදා තුළ පමණක් නොව කිතු උපතට පෙරසිට පවා දෙවියනට තුති පිදීමට ගායනය, වාදනය උපයෝගි කරගත් අයුරු ශු. බයිබලය තුළින්ම සනාථවන නිසාය.

නාට්‍යයක්, චිත්‍රපටයක්, ගීතයක් ගෙන බැලුවොත් එය සාමුහික ප්‍රයත්නයක ප්‍රථිඵලයකි. ඒ අනුව අප රසවිඳින කුමන ගීතයක් වුවත් පදරචකයා, සංගීතඥයා හා ගායන ශිල්පියා යන තෙවැදෑරුම් සාමුහික ප්‍රයත්නයේ ප්‍රතිඵලයකි. එසේ වතුදු කෙතරම් ජනප්‍රිය වූ නිර්මාණයක වුවත් මෑතක් වනතුරු පද රචකයාගේ නාමය සැඟැවී මුළුගැන්වී තිබූ බව නම් සත්‍යයකි. පසුකාලීනව හතුපිපෙන්නාක් මෙන් බිහිවූ ප්‍රතිභාවෙන් හීන ඊනියා ශිල්පීන් පෙරකී අයගේ නිර්මාණයන් සොරාගත්තා පමණක් නොව ඒ මත තම නම්ද කෙටූ තත්ත්වයක් තිබූ බවද අසන්නට ඇත. ලංකාවේ සංගීත ක්ෂේත්‍රය දෙස විමසීමේදී කණගාටුදායක සිදුවීම් බොහෝය. ජාතික ගීතයේ නිර්මාතෘ ආනන්ද සමරකෝනුන්ගේ ඉරණම ඊට හොඳම උදාහරණයකි.

මේ සටහන තබන්නේද අදටත් අප රසවිඳින නිර්මාණ කීපයක් ඉතිරි කර අද වන විට නාමය පවා අමතක වී ගිය එවන් කිතුනු නිර්මාණ ශිල්පියකු පිළිබඳ අතීතය අවදි කරනු වස්ය.

වර්ෂය ආරම්භයම මෙවන් සටහනකට සුදුසු යයි හැඟුමෙන් දිවයිනේ බොහෝ කිතුනු ජනයා වෙසෙන ප්‍රදේශවල ශුද්ධවූ සෙබස්තියම් මුනි උලෙළක් සමරන සමය මේ නිසාය. ඒ මෙම ශිල්පියා හා සෙබස්තියම් මුනි උලෙළ හා සබැඳුන ඔහු අතින් නිර්මාණය වු එදා මෙදා තුළ නොදිරපු නිර්මාණයක් ඇති නිසාය.

'කුසුමේනී නර්බෝනා' - 'කුසුමේනී නර්බෝනා'

අත්වූ නිත්‍යා මොක්පුර ක්‍රිටේ - කුසුමේනී නර්බෝනා - II

මේ වන විට ජීවතුන් අතර නැති සෙබස්තියම් පීරිස් නම් ගායන ශිල්පියා විසින් ගායනා කරන ලද මෙම ගීතය අදටත් ඉඳහිට ඇසෙන පැරැන්නන් අතර ඉතාමත් ජනප්‍රියවු ගීතයක්මය. අදමෙන් නොව විදුලි පහසුකම් නොතිබූ 'ගොලෝ ලාම්පු' 'ගෑස් ලාම්පු' දල්වා දේවස්ථාන මංගල්‍යත් කළ සමයේත් දේවස්ථානයට යන ජනයාගේ පහසුව වෙනුවෙන් 'කුරුම්බා - කෝම්බ වලට', 'පුන්නක්කු' 'තෙල්' පුරවා - දල්වා මංමාවත් අවට ආලෝක කළ සමයේත්

සැම ගමකම වාගේ මල්වෙඩි ශිල්පීන් බහුලව සිටි එදා සෙබස්තියම් මුනි උලෙළ වෙනුවෙන් සන්ධ්‍යා මෙහෙය අවසානයේ මල්වෙඩි ශිල්පීන් ශිල්ප දක්වද්දී ඔවුන් ප්‍රබෝධමත් කරන්නට නැතුවම බැරි ගීතයක් වූයේත් 'කුසුමේනී නර්බෝනා...... ගීතයයි

ඒ අනුව එදා මෙදා තුළ ඒ ගීතය ඇසෙන සැමවිටම එය ගායනා කරන්නේ 'සෙබස්තියම් පීරිස්' නම් ශිල්පියා බව බොහෝ අය දැන සිටියත්!

එම අනභිබවනීය වචන මාලාව එකලස් කළ ශිල්පියා කවුරුන් දැයි බොහෝ අය නොදැන සිටින්නට ඇත.

ඉපැරණි සිංහල කතෝලික ගම්මානයක් වූ අගනුවරට ඉතා ආසන්න වත්තල එඬේරමුල්ල ජනයාද එදා කේන්ද්‍ර ගතවූයේ ගමේ මහ ගෙදරවූ 'ශු. සෙබස්තියම් මුනිතුමාට' කැපකර ඇති දේවස්ථානයටයි. නගරයට ආසන්න වුවත් මේ රමණීය ගමේ බහුතරය ගමටත් ආවේනික වූ විවිධ වෘත්තීන් හි යෙදුන ගැමියන් පිරිසක් වූ අතර ඒ අතරින් බිහිවූ දැන උගත්කමින් ශිල්ප ඥාණයෙන් කැපී පෙනුනු වියතුන්ද නොසිටියා නොවේ.

'කුසුමේනී නර්බෝනා' නම් ගීතය වෙනුවෙන් පදමාලාව ගොතන්නට සෙබස්තියම් මුනි වරම ලැබී තිබුනේද එඬේරමුල්ලෙන් උපන් එවන් වියතකු හටය. වියතකු කී පමණින් සිංහල භාෂාවෙන් පමණක් නොව පාලි 'සංස්කෘත මෙන්ම' ඉංග්‍රීසි භාෂාව පිළිබඳවද කලාව හා සාහිත්‍ය පිළිබඳව හසල දැන උගත්කමක් ලබා සිටි ඔහු නමින් ඩබ්ලිව්. ඩී. මර්සලීනු ඇල්බට් නම් විය. එදා සමකාලීන ගැමියන් 'මසි අය්යා' නමින් හැඳින්වූ ඔහු කලාව පමණක් නොව කිතු දහම පිළිබඳවද හසල දැනුමක් ඇති අයෙකු විය.

ලේඛකයකු වශයෙන්ද එකල පුවත් පත් වෙනුවෙන් බොහෝ ලිපි ලියා ඇති ඔහු ආගමික වාද විවාද වලදී අන්වර්ථ නාමයකින් කිතුනු පාර්ශවය නියෝජනය කළ බවද අසන්නට ඇත.

'කුසුමේනි නර්බෝනා' පමණක් නොව ඔහු අතින් ලියවුනු ජනප්‍රියව ගැයුන කිතුනු ගීතද කීපයකි. ඔහු කිතුනුවකු වූවත් එකල බෞද්ධ ගීත බොහෝමයකට නම් පද රචනයත් සපයා ඇත.

රුපසිංහ මාස්ටර් හා රුක්මණී දේවිය ගයා ඇති සිරිබුද්ධගයා විහාරේ ගීතයේ පද රචකයාද ඔහු යයි කියන අතර ඔහු අතින් එම පද රචනයේ සංස්කරණයක් වී ඇතැයිද මතයක් පවතී. කෙසේ වෙතත් එදා බී. ඒ. ඩබ්. ජයමාන්න වැනි මහා සිනමා ශිල්පින් රුක්මණී දේවි, ඇඩී ජයමාන්න වැනි ජනප්‍රිය ගායක ගායිකාවන් මෙන්ම තවත් බොහෝ සාහිත්‍ය කලා වියතුන් ඒ මහතා ඇසුරු කළ බවත් සොයා ආ බවත් අසන්නට ඇත.

බොහෝ ප්‍රවීනයන් වෙනුවෙන් ගීත පමණක් නොව නාට්‍ය පිටපත් මෙන්ම සිනමාව වෙනුවෙන් කතා ද ඔහු අතින් ලියවී ඇති අතර එකල සිනමාව බැබලවූ චිත්‍රපට අතර ඔහුගේ නිර්මාණද වු බව සත්‍යයකි. මෑත අතීතයේ ජනප්‍රියව සිටි කරුණාරත්න අබේසේකරයන් පමණට ඒ යුගයේ මර්සලීනු ඇල්බට් නිර්මාණකරුවා කලාකරුවන් සේම සාහිත්‍ය ජනතාව අතරද ජනප්‍රිය පුද්ගලයකු බව අසන්නට ඇත. අද ජනතාව අතර නැති මෙවැන්නන්ගේ නිර්මාණ කිතුනුවන් වශයෙන් නව පරපුර වෙත රසවිඳීමට කටයුතු සම්පාදනය කෙරෙන්නේ නම් එය ඔවුනට කරන උපහාරයක් සේම කිතුනු සාහිත්‍යයටද පෝෂණයකි.

කණගාටුවට කරුණ මෙවන් ප්‍රවීන නිර්මාන කරුවකු පිළිබඳ මතකයක් හෝ අගැයීමක් සමස්ත ලාංකීය ජනතාව හෝ කිතුනු සංඝය තුළ තබා මර්සලීනු ඇල්බට් නම් මේ සොඳුරු මිනිසා උපන් එඬේරමුල්ලේ වත් මේ වන විට දක්නට නොමැති කම්ය. මොක්පුරය දිනූ සෙබස්තියන් මුනි අගයමින් කිතුනු මානසිකත්වයෙන්ම සිරිබුද්ධග යාව වැඳ මෝක්ෂය පැතූ මේ කිතුනු මහා කලාකරුවාට අපිදු මෝක්ෂ සම්පත්තියම පතමු.

**යූ. ඩී. ප්‍රැන්සිස් ඇන්ටනි**

**සසුන් පිය .... 1 පිටුවෙන්**

සසුන් පිය නිළවරණයට සුදුසුකම් ලබන වයස අවු. 80 ට අඩු කාදිනල් හිමිපාණන්ට බරපතළ සෞඛ්‍ය හෝ වෙනයම් ගැටලුවක් මත ඊට සහභාගි වීමට නොහැකි වන්නේ නම් ඒ පිළිබඳව කල්වේලා ඇතිව ශුද්ධාසනයට දැනුම් දිය යුතු බව සසුන් නීතියයි. මෙවර සසුන් පිය නිළවරණයට කාදිනල් හිමිපාණන් 117 නමක් සුදුසුකම් ලබා සිටිති. එහෙත් මේ වන විටත් ඉන්දුනීසියාවේ අති උතුම් ජුලියස් රියාදි කාදිනල් ධර්මට්මාජා හිමිපාණන් බරපතළ අක්ෂි රෝගී තත්ත්වයක් නිසා ද, ස්කොට්ලන්තයේ අති උතුම් කීත් මයිකල් කාදිනල් ඕබ්‍රයන් හිමිපාණන් අගරදගුරුවරයෙන් විශ්‍රාම ගැනීම ඇතුළු කරුණු නිසා ද, 2013 සසුන් පිය නිළවරණයට සහභාගි නොවන බැව් දැනටමත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව මෙවර කාදිනල් හිමිපාණන් 115 නමක් සහභාගි වීමට නියමිතව සිටිති.

**සුදොතුම් පිය .... 1 පිටුවෙන්**

ජනාධිපති ඒ ගැන ඊයේ අද මෙන් හෙටත් ජනතාව තුතිපූර්වකව සිහිගන්වනු ඇතැයි පවසයි. ඔබවහන්සේ බැහැදුටු මොහොතේ දී වදනින් දුන් මඟ පෙන්වීමත්, දිරිගැන්වීමත් රාජ්‍ය පාලනය සඳහා ශක්තියක් වූ බවද ඒ මහතා අවසන් වශයෙන් පළකර සිටී.

**යටගිය දවස .... 12 පිටුවෙන්**

මෙම සංගමය පියවරෙන් පියවර නිදහස් සටන ඉදිරියට ගෙන ගියේ ය. එහි තීරණාත්මක සැසිවාරය වූයේ ක්‍රි.ව. 1942 දෙසැම්බර් මස 18 සිට 20 දක්වා කැලණියේ ශ්‍රී ධර්මාලෝක විද්‍යාලයේ පවත්වන ලද 22 වැනි සැසිවාරය යි. කාලයක් තුළ පැවැති සාකච්ඡා නිම කරමින් "දැන් අපි ස්ථිර නිගමනයකට එළඹ විය යුතු යැ"යි එහි සිටි තරුණ පිරිස කියා සිටියහ. මෙහි දී "ලංකාව පූර්ණ නිදහස ඇති ස්වෛරී රාජ්‍යයක් බවට පත් කළ යුතුය" යන යෝජනාව සභා සම්මත විය. මෙම යෝජනාව ඉදිරිපත් කරන ලද්දේ තරුණ ජේ. ආර්. ජයවර්ධන (පසුව ජනාධිපති) මැතිතුමන් විසිනි. එය ස්ථිර කරන ලද්දේ වියත් නීතිඥ ජෝසෆ් ඒ. එල්. කුරේ මහතාණන් විසිනි. මෙතුමා වාද්දුවේ උපත ලද බැතිමත් කතෝලිකයෙකි.

මෙම රැස්වීමේ මුලසුන දරා සිටියේ පී. ඩී. එස්. කුලරත්නයන් ය. ඩී. එස්. සේනානායක මැතිතුමන් වැනි දෙටු සාමාජික පිරිස මුලදී යෝජනාව අදූරදර්ශී පියවරක් ලෙස සලකා විරෝධය පළ කළත් පසුව එය සභා සම්මත විය. මෙම සැසිවාරය සඳහා පැමිණි පිරිස සඳහා කෑම බීම සපයන ලද්දේ එවකට කොළඹ මරදානේ සාන්ත ජෝසෆ් මහ විදුහලේ ශාඛාවක්ව පැවැති සාන්ත පාවුළු පාසලෙන් ය.

ජාතික සංගමයේ 23 වැනි සැසිවාරය සංවිධානය කරන ලද්දේ ද කතෝලික පිරිසක් විසිනි. එය ඩී. පීටර් පෙරේරා මහතා ගේ සංවිධානයෙන් පවත්වනු ලැබුවේ නයිනමඩම (දුම්මලදෙණියේ) දීය. ක්‍රි.ව. 1943 පැවැත්වුණ මෙම සැසිවාරයට එවකට හලාවත රදගුරුව සිටි අති උතුම් එඩ්මන්ඩ් පීරිස් හිමිපාණෝ ද සහභාගි වූහ. වියත් හෙළ පඬිරුවනක් ද වූ එතුමා රැස්වීම සඳහා අවශ්‍ය වූ සිංහල පරිවර්තන ද කැර දුන් බව කියැ වේ. මෙම සැසිවාරයේ දී ද ස්වෛරී ශ්‍රී ලංකාවක් උදා කැර ගැනීමේ යෝජනාවට යළි මුල් තැන හිමි විය. එම යෝජනාව යළි තහවුරු කැර ගනිමින් ඒ සඳහා ස්ථිර පියවර ගන්නට මෙහි දී ඒකමතිකව තීරණය කරන ලදි. මේ වැදගත් ඓතිහාසික රැස්වීම සදා සැමැරීම පිණිස එය පවත්වන ලද භූමි භාගය "ස්වරාජ්පුරය" ලෙස නම් කරන ලදි. අප රට දැය වෙනුවෙන් මෙයින් ඉටු කළ සේවාව සුළු පටුද? එදා සිංහල බෞද්ධ පිරිස වෙනුවෙන් නැගී සිටියෝ කිතුනුවෝ නොවෙත් ද? කිතුනු දායකත්වයෙන් උභය පාර්ශ්වයේම යහපත උදා වූවා නොවේ ද?

# 2013 සිග්නිස් සිනමා උත්තමාචාර උළෙල සඳහා නිර්මාණ බාර ගැනීම

ශ්‍රී ලංකාවේ වැඩිම වාර ගණනක් අඛණ්ඩව පවත්වා ගෙන එනු ලබන සිග්නිස් උත්තමාචාර උළෙල මෙවරත් දයා සමූහ ව්‍යාපාර පුද්ගලික ආයතනයේ පූර්ණ අනුග්‍රහයෙන් යුතුව, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර ඇත. මේ දක්වා සිනමාව හා රූපවාහිනී නාට්‍ය එකට එකතුව පැවැතියත් මේ වසරේ සිට ටෙලි නාට්‍යය හෝ රූපවාහිනී නිර්මාණ ඇගයීමක් සිදු නොකරන අතර වඩාත් පුළුල් ලෙස හා නව සම්මාන ඉසව් හඳුන්වා දෙමින් සිංහල සිනමාවේ උන්නතිය වෙනුවෙන්ම වඩා අර්ථවත් ලෙස මෙම උත්තමාචාර උළෙල පැවැත්වීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

ඒ අනුව පසුගිය වසරේ අප හඳුන්වා දුන් ප්‍රශස්ත සහය අධ්‍යක්ෂ සහ නිෂ්පාදන කළමනාකරු සම්මානයන්ට අමතරව මෙම වසරේ පටන් නිර්මාණශීලී සටන් අධ්‍යක්ෂණය, නිර්මාණශීලී මාධ්‍ය රූප සජීවීකරණය, නිර්මාණශීලී හාස්‍ය උත්පාදන රංගනය සහ වසරේ ජනප්‍රියතම සිනමා නිර්මාණය වැනි නව සම්මාන ඉසව් හඳුන්වාදීමට පියවර ගෙන ඇත.

මෙයට සමගාමීව කෙටි චිත්‍රපට තරගාවලියක් පවත්වන අතර සල රූ සහ සජීවීකරණ දෙඅංශයේම නිර්මාණ සඳහා විවෘතය. කාලය උපරිමය විනාඩි 15 ටත් අවමය විනාඩි 10 ටත් සීමා කර ඇත.

මෙම වසරේ ද දේශීය සිනමාව හා ඒ හා බද්ධ වන සිනමා කර්මාන්තයේ ප්‍රගමණය වෙනුවෙන් පෘථුල මෙහෙවරක නියැලුන නිර්මාණකරුවන් වෙනුවෙන් සිග්නිස් අන්තර්ජාතික ප්‍රණාමය ද, දේශීය සිනමා සාහිත්‍යයේ උන්නතිය වෙනුවෙන් සාහිත්‍යකරණයේ යෙදෙන්නන් දිරිමත් කිරීම සඳහා පිදෙන සිරිල්. බී. පෙරේරා අනුස්මරණ සම්මානය ද ජයවිලාල් විලේගොඩ අනුස්මරණය සම්මානය පිදීම සඳහා "සිංහල සිනමාව 66 න් ඔබ්බට" යන මැයෙන් වචන 2500 ට නොවැඩි ආධුනික විචාර තරගය මෙවර ද පැවැත්වේ.

කෙටි චිත්‍රපට නිර්මාණ, සංඛ්‍යාත දෘෂ්‍ය තැටි (ඩී. වී. ඩී) මගින් පමණක් හා විචාර ලිපිද 2013 අප්‍රියෙල් මස 30 වන දිනට ප්‍රථම **සිග්නිස් ශ්‍රී ලංකා පර්ෂදය, අංක 19, බැල්කම් පෙදෙස, කොටා පාර, බොරැල්ල** යන ලිපිනයට කාර්යාල වේලාව තුළ (පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා) ගෙනැවිත් භාර දිය යුතුවේ.

අයදුම් පත්‍ර සහ වැඩිදුර තොරතුරු සඳහා 011 2693425/ 071 8954214 / 077 0212043 යන අංක ඇමතීමෙන් ලබා ගැනීමට අවස්ථාව ඇත.

## 2013 ශුද්ධවු සතියේ කතෝලික / ක්‍රිස්තියානි ආගමික චතාරික එක් දින වැඩසටහන

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2009. 03. 05 දින පවත්වන ලද කතෝලික උපදේශක මණ්ඩල රැස්වීමේදී ඉදිරිපත් වූ යෝජනාවක් අනුව සෑම වසරකදීම පාස්කු උත්සවයට සමගාමීව ශුද්ධවු සතියේ එක් දිනයක් (මහ සිකුරාදා යෙදෙන සතියේ එක් දිනක් ) කතෝලික / ක්‍රිස්තියානි සිසුන් 15 ක් හෝ ඊට වැඩියෙන් සිටින පාසල්වල මනාව සැලසුම් කරන ලද අදාළ ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බව මෙයින් දන්වා සිටිමි.

මෙම වැඩසටහන් 2013 මාර්තු මස 25, 27, හා 28 යන දිනයන්ගෙන් එක් දිනකදී ඔබ පාසලට ආසන්න දේවස්ථානයේ ගරු පූජාප්‍රසාදිවරුන්ගේ සහ පැවිදි පිරිසගේ සහයෝගය ලබා ගෙන පාසල් කාලයේදී කතෝලික සහ ක්‍රිස්තියානි ගුරු භවතුන්ගේ මූලිකත්වයෙන් එම සිසුන් වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට උපදෙස් දෙමි. ඔබ පාසලෙහි ක්‍රියාත්මක කරන ලද වැඩසටහන පිළිබඳ වාර්තාවක් 2013. 04. 30 ට පෙර ඉසුරුපාය ප්‍රධාන අමාත්‍යාංශයේ ආගමික හා සාරධර්ම අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්
**එච්. එම්. ගෝඨාභය ජයරත්න**



කුරුණෑගල පදවියේ විශ්‍රාමික රදගුරු අතිඋතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන් ජා -ඇල දැලතුර මීසමට අයත් රත්නපුර පදවියේ සිට ස්වර්ගස්ථ වූ අතිගරු නික්ලස් ප්‍රංකාසි ප්‍රනාන්දු අනුනායක පියතුමාගේ භූමදානයට දැලතුර සුසාන භූමියට පැමිණීම ප්‍රදීප කැමරා කාචයට හසුවූ අයුරු.... **(ඩබ්. ටී. සී. පෙරේරා)**



නව පූජාප්‍රසාදි ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි. පියතුමා එතුමා විදුහල්පති ධුරය ඉසිළු බෝපිටිය ලොයොලා විදුහලේ සිසුන්, ආචාර්ය මණ්ඩලය හා දෙමාපියන් එක්ව හරසරින් පිළිගනු ලැබීමෙන් පසුව එතුමන්ගේ මෑණියන් ද සමඟ උත්සව ශාලාව වෙත කැඳවාගෙන යනු ලැබූ අයුරු.. **(එස්. කේ. ජේ. කුරේරා)**



2013 පෙබරවාරි මස 09 දින කළුතර සිරිකුරුස විදුහලේ විදුහල්පති සහ ආදි ශිෂ්‍ය සංගමයේ සභාපති ගරු කැමිලස් ප්‍රනාන්දු පියතුමා ඇතුළු විධායක කමිටුව අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් හමුවූ අවස්ථාවේ සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු.

# පියතුමාට සාම විනිසුරු පදවියක්



මහනුවර පදවියට අයත් හැටන් ශ්‍රී කුරුස දෙව්මැඳුරේ මීසම් සේවක ගරු ලෙස්ලි පෙරේරා පියතුමන් මුළු දිවයිනටම බලපාන පරිදි නුවරඑළිය ශ්‍රේෂ්ඨාධිකරණයේ දී සාම විනිසුරුවරයකු ලෙස දිවුරුම් දෙන ලදි.


කොස්වත්ත ලියනගේ මර්සලින් පෙරේරා රාමනායක තෙරේසා යුවළගේ පුත් රුවනක් වූ මෙතුමාට සහෝදරයින් හතර දෙනකු හා සහෝදරියන් තුන් දෙනකු සිටිති. හංවැල්ල පහත්ගම රෝමානු කතෝලික විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා මහනුවර පූර්ණවත්ත සා. ජෝශප් කුඩා දෙව්සත්හලට ඇතුළු වී අධ්‍යාපනයෙන් අනතුරුව අම්පිටිය ජාතික දෙව්සත්හලට විත් මහනුවර රදගුරු තැන්පත් අති උතුම් ජෝශප් වියානි ප්‍රනාන්දු හිමිපාණන් අතින් පූජකවරම් ලැබීය. ඉන් අනතුරුව මහනුවර පදවියට අයත් මීසම් ගණනාවක සහය මීසම් සේවක ලෙස කටයුතු කළ අතර ප්‍රථම මීසම් සේවක ලෙස නානුඔය මීසමට පත්විය. මහනුවර පදවියටම සාම විනිසුරු ලෙස පත්වූ ප්‍රථමයා වන මෙතුමන්ට ප්‍රදීප සුබාසිංසන පිරිනමන්නීය. **(ජේ. ඒ. බානබස්)**

# ගිහි අපෝස්තලික සේවාවේ විසිපස් වසර සැමරේ



මාකෙවිට මීසමට අයත් වැලිකඩ ශු. ජුසේ මුනිඳුන්ගේ දෙව්මැඳුරේ සංක්‍රිස්තියන් ලෙස සේවය කරන ජෙනට් දල්පතාදු මහත්මියගේ ගිහි අපෝස්තලික සේවාවේ විසිපස් වසර සැමරුම් මෙහෙය වැලිකඩ දෙව්මැඳුරේදී මීසම් සේවක ගරු තරංග සම්පත් පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

මරිය හමුදාව, දිව්‍ය හෘදය සමිතිවල සේවය කරමින් සංක්‍රිස්තියන් වශයෙන් පියතුමන් දොළොස්දෙනකු යටතේ නොමසුරු සේවා රැසක් ඉටු කිරීමේ වාසනාව ඇයට ලැබී ඇත. මෙම තුති දීමේ දිව්‍ය යාගයට නිට්ටඹුව මීසම් සේවක ගරු ප්‍රැන්සිස් ජයකොඩි, කලමුල්ල මීසම් සේවක ගරු නාමල්, කට්ටුව මීසම් සේවක ගරු රුවන් රීඩ් පියතුමන් සහභාගි වූ අතර ඇයගේ සේවය ද අගය කළහ. වැලිකඩ සැදැහැවතුන් ඇයට සුබ පතා තම සහෝදරත්වය හා කෘතවේදීත්වය පළ කරමින් සමරු තිළිණ පිළිගැන්වූහ. **(බෙන්ජමින් කිරිහෙට්ටි)**



ශ්‍රී ලංකා සරසවි කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරයේ (කොළඹ කලාපය) 30 වන මහ සභා රැස්වීම පෙබරවාරි මස 24 වන දින කොටුව සයවන පාවුළු මධ්‍යස්ථානයේ දී, ගරු සමන් මැක්ෂිමස් පියතුමාගේ අනුශාසකත්වය යටතේ පැවැත්විණි. එහිදී 2013/2014 වසර සඳහා පත් වූ නව කමිටුවේ සේයාරුවකි මේ. මේරියස්, සුරන්ජන්, ජනත් ප්‍රනාන්දු, ප්‍රදීප් දර්ශන, රෝසරිදාසන් ජොආනි, තරිඳු ප්‍රනාන්දු, සම්පත් බර්නාඩ්, ෂෙරිල් ප්‍රනාන්දු, දෙව්මාල් ඇනිසීටස්, ෂෙනාල් නියොමාල්, සුදාරක තෝල්කගේ, දුෂාන්ත ප්‍රනාන්දු, සුධීර ප්‍රනාන්දු, රිෂාන් අකලංක, රවී තිසේරා නව කමිටු සාමාජික සාමාජිකයන් වේ.

## චතාරික පාද නමස්කාරයක් තලවිල දී

කඩවත ගරු සුනිල් කුමාර පීරිස්, නිට්ටඹුව ගරු ප්‍රැන්සිස් ජයකොඩි සහ කඳවල ගරු සරත් තිරිමාන්න පියවරුන්ගේ මෙහෙයවීමෙන් පසුගියදා තලවිල සා. ආනා සිද්ධස්ථානයේ දී චතාරික පාද නමස්කාරයක් පැවැත්වුණි.

මේ සඳහා නිට්ටඹුව සහය මීසම් සේවක ගරු සම්පත් තුෂාර පියතුමන් ද සහභාගි වූ අතර ගරු ගාමිණී පෙරේරා නි.ම.නි. පියතුමා විශ්වාසයේ වසර තුළ සර්වබලධාරී දෙවියන් වහන්සේට සමීප වීමේ වරප්‍රසාදය, ඒකාන්තයෙන්ම ලැබෙන බවත්, දුක, කඳුල, වේදනාව වැළඳ ගැනීමෙන් කුරුසිය තුළ ජයගත හැකි බවත් උන්වහන්සේ අවධාරණය කළහ. මෙයට විශාල සැදැහැවත් පිරිසක් සහභාගි වූහ.

රන්පොකුණගම
**මයිකල් සෙබස්තියන්**

## පූජක දිවියේ රිදී ජුබිලිය සමරයි



**වයික්කාල මීසමේ සිංදාත්‍රිය ග්‍රාමයේ උපත ලද දැනට බදුල්ල රදගුරු වසමේ මීසම් සේවයේ නියැලෙන ගරු ටයිටස් ප්‍රනාන්දු පියතුමා පසුගියදා සමිඳු මිදි උයනේ සේවයට කැපවී විසිපස් වසර සැමරීය.**

පූජක දිවියේ රිදී ජුබිලිය සනිටුහන් කරමින් තම උපන් ගමේ සිංදාත්‍රි මාතා දේවස්ථානයේදී ස්තුති දීමේ දිව්‍ය යාගය වයික්කාල මීසම් සේවක ගරු ෆීලික්ස් කොළඹගේ පියතුමන් හා ග්‍රාමයේ පූජක පුතුන්, පැවිදි සොයුරියන් හා සැදැහැවත් දේව ජනතාව සමඟින් දෙව්පියාණන්ට පුද කෙරිණි. එතුමනට තවත් දිගු කලක් සමිඳු මිදි උයනේ සේවයේ නියැලෙන්නට අවශ්‍ය නිරෝගී සුවය සමඟින් සුදතුම් බලය ලැබේවා! **(සුරාජ් ප්‍රනාන්දු - වයික්කාල)**